
# නියාම දීපනිය



අරංගල සිරිධම්ම ස්වාමිපාදයන් වහන්සේ

# නියාම දීපනිය

සාර්ථකථා ත්‍රිපිටකපර්‍යාප්තිධර විශාරද

''ලේඩිශයාඩෝ'' නමින් ප්‍රසිද්ධ

ඤාණාලංකාරාභිධාන

**බුරුම මහා ස්ථවිරාපාදයන් වහන්සේ**

විසින් සම්පාදිතයි.

සිංහල අනුවාදය

කොළඹ දෙමටගොඩ මහා විසුද්ධාරාමාධිවාසී

**අරංගල සිරිධම්ම ස්වාමිපාදයන් වහන්සේ**

1918

## ලේකම්ගේ සටහන්...

සසර කතරින් එතෙරව ලබන නිවන මුඛ්‍ය පරමාර්ථය කොට ගත් භාවනා මග එකකි. දැනුම කේන්ද්‍ර කරගත් කල්පනා මග තවෙකකි. මේ නිසා නිවනට හේතු නොවන, දැනුමට හේතුවන කරුණු පහක් අචින්ත්‍ය (නො සිතිය යුතු) කරුණු ලෙස බුදුසමයේ පසෙක තබා ඇත. බුද්ධ විෂය, සත්ත්ව විෂය, කර්ම විෂය, ලෝක විෂය හා ඉද්ධි විෂය යනුවෙන් ඒවා හඳුන්වා ඇත. සිතන්නට සිතන්නට අගක්-මුලක් නොපෙනෙන මේ මාතෘකා මූලික පරමාර්ථයෙන් අප බැහැර කරයි.

මෙයින් සමහර කරුණු ඇතුළත් නියාම ධර්ම පහක් ගැන ද බුදුසමයේ උගන්වයි. විග්‍රහ කිරීමේදී වැඩි බරක් නොතබා සටහන් වන මේ කරුණු ගැන ද ත්‍රිපිටකයේ විස්තරාත්මක සටහන් සපයා ගැනීමට නැත. බීජ නියාම, ඍතු නියාම, කර්ම නියාම, චිත්ත නියාම, හා ධර්ම නියාම ඒවාය. ස්වාභාවික වූ මේ කරුණු ගැන ද වැඩි සෙවීම දැනුම කේන්ද්‍ර කරයි.

භාරතයේ නිර්මාණවාදී ආගම් සම්බන්ධයෙන් පිළිතුරු දීමේදී මේ කරුණු අවියක් ලෙස ප්‍රයෝජනයට නොගත් නමුත් පසු කාලයේ අපරදිගින් පැමිණි එවැනි ආගම් මෙහි ජනිත කළ ආගමික මතවාදයන්ට පිළිතුරු දීමේදී මේ කරුණු ප්‍රයෝජනයට ගැනිණ. එකල බුරුමයේ උගතුන් විසින් මේ කරුණු මතු කර බෞද්ධ දර්ශනයේ එන කරුණු හා ගලපන ලද අතර ශ්‍රී ලංකාවේ ඇති වූ පසුබිමට ද එම කරුණු එසේ ම ප්‍රයෝජනවත් විය. මෙහි ඇති වූ ආගමික වාද ඊටත් වෙනස් වූ ස්වරූපයක් ගත් බව පානදුරාවාදාදී වාද සටහන් කියවන විට පෙනී යයි.

දුර්වාදමර්ථනය සඳහා බුරුමයේ ලේඩිශයාඩෝ හිමියන් ලියූ බුරුම පොතේ අර්ථය උකහාගෙන අරංගල සිරිධම්ම මාහිමියන් විසින් මේ පොත ලියවිණ. බෞද්ධ උගතුන් වෙත, මහනුවර පරිහානි යුගයෙන් පසු සියම හා බුරුමය පසුබිම් කොට දැනුම කේන්ද්‍රගත වූ ආකාරයත්, එකල සිංහල භාෂා ස්වරූපයත් තේරුම් ගැනීමට ද මේ පොත ප්‍රයෝජනවත් ය. පූජ්‍යපාද රේරුකානේ මහනාහිමියන්ගේ 'සතිපට්ඨාන භවනා ක්‍රමය' ට ද ලේඩිශයාඩෝ හිමියන්ගේ පොත් උපයෝගී විය.

'නියාම දීපනිය' ලියූ අරංගල සිරිධම්ම හිමියෝ රාමඤ්ඤ නිකායේ පැවිදිව, ගාල්ලේ විජයානන්ද පිරිවෙනෙහි දීප්තිමත් ශිෂ්‍යයෙක්ව සිට පරමාර්ථ ධර්ම ඉගෙනීම සඳහා බුරුමයේ ශ්වේජින්

නිකායට ඇතුළත් වූහ. එහිදී භාෂා ශාස්ත්‍ර, ඡන්දස් අලංකාර හා අටුවා සහිත ත්‍රිපිටකය හදාරා කලක් ශ්වේජින් නිකාය මූලස්ථාන පිරිවෙන්හි ආචාර්යවරයකු වශයෙන් ද සේවය කළහ. ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මහානායක පදවියට පත් හිමිවරුන් තිදෙනකුට ම තම සෙවනේ ගුරුහරුකම් දෙන්නට ලක්දිව සැපත් උන්වහන්සේට හැකිවිය. උන්වහන්සේ මෙවැනි පොත් 20 ක් පමණ ලියා ඇති අතර, ප්‍රකාශිත පොත් නාමලේඛනයෙන් ම උන්වහන්සේගේ අභිධර්මය පිළිබඳ දැනුම ප්‍රකට වෙයි.

මේ පොත නැවත මුද්‍රණය කිරීමේ පදනම වැටුණේ අහම්බෙනි. රුවන්වැල්ලේ ජී.කේ. සීතා දම්මිකා කුමාරි මහත්මිය මේ විෂය ගැන කරුණු සොයමින් සිටි අතර, ඇගේ යෙහෙළියක විසින් අප වෙත යොමු කරන ලදුව මෙහි මුල් පොත ඇයට ලබා දුනිමි. එය කියවූ ඇය ඇගේ ආගමික අවබෝධය ක්‍රමවත් කරගැනීමට උදව් වූහයි තවත් බොහෝ දෙනාට මෙය කියවීමට සැලැස්වීමේ උතුම් වූ ධර්මදානමය චේතනාවෙන් මෙය ඔබ වෙත ප්‍රදානය කරයි.

පූජ්‍ය අරංගල සිරිධම්ම මාහිමියන්ගේ විහාර පරපුරේ වර්තමාන විසුද්ධාරාමාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය වැලිමඩ ශාන්ත ස්වාමීන් වහන්සේ මේ පොත අප මණ්ඩලයෙන් මුද්‍රණය කිරීම ගැන එකඟතාවය පළ කිරීමත්, ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය මගින් ඒ සඳහා කටයුතු කිරීම සභාපති පූජ්‍ය කිරිඹරුවේ ධම්මානන්ද හිමියන් ප්‍රමුඛ සාමාජිකත්වයෙන් අනුමත වීමත් වැදගත් ශාසනික තීරණයක් සේ සලකමු. මුල් කෘතියේ තිබූ පදබෙදීම්, හා මුද්‍රණ සැලසුමේ අභියෝග ජයගෙන කියවා තේරුම්ගත හැකි සේ සකස් කිරීමේදී සෝදුපත් සැසඳීමේ දී සහාය වූ මාලනී, අක්ෂර සංයෝජනයෙන් උපකාරී වූ හොරණ රූ-මායා ග්‍රැෆික්ස් හි සාලිය ජයකොඩි මහතා ඇතුළු කාර්ය මණ්ඩලය, මුද්‍රණයෙන් හැඩ කළ සිකුරු ප්‍රකාශක ගිහාන් අනුරංග පුතා ඇතුළු කාර්ය මණ්ඩලයට පින් දෙමින් සිහි කරමි.

තෙරුවන් සරණයි!

සී. තනිප්පුලි ආරච්චි
ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

රුවන්වැල්ලේ ජී.කේ. සීතා දම්මිකා කුමාරි

විසින්

පරලෝසැපත් ගොඩ කුමාරගේ පැනිස් අප්පුහාමි

උඩුමුල්ලගේ නන්දාවතී

දෙගුරුන්ට නිවන් පතා

කරන ධර්ම දානයයි.

ළබැඳි සහාය දුන් වූ කඩුවෙල ප්‍රියංගි සේනානායක

සොහොයුරියට

හා මූල්‍ය සහාය ලබාදුන් සැදැහැබර සහෘදයන්ට ද පින්.

මුද්‍රණයෙන් එළි දක්වීමේ සියලු කටයුතු සංවිධානය කළ

ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලයට

කෘතඥතාව

## පළමු මුද්‍රණයේ
# පෙරවදන

''නියාමදීපනිය'' නම් වූ මේ ධර්‍ම ග්‍රන්ථය දැන් මේ ලැබී තිබෙන සර්‍වඥ ශාසනයෙහි බුද්ධාගම්කාර ජනී ජනයන් විසින් ඒකාන්තයෙන් ම ඉගෙනිය යුතු නියාම ධර්‍ම පඤ්චකය විස්තර කිරීමෙන් කරන ලද්දකි. එහෙයින් යම් පුද්ගලයෙක් මේ ග්‍රන්ථය මුල පටන් අග දක්වා සිහි නුවණින් යෙදී නැවත නැවත කියවීමෙන් නැවත නැවත බැලීමෙන් ඉගෙනීම සිත්හි ලා දැරීම කෙළේ නම් ඒ පුද්ගලයාට මිථ්‍යා දෘෂ්ටි මිථ්‍යා ප්‍රතිපත්තීන් කෙරෙහි නොරැවටීම, මිථ්‍යා දෘෂ්ටිකයන්ගේ දුර්වාද බිඳහෙලීම, කල්ප චක්‍රවාළ ලෝකධාතු ඇතිව නැතිවෙන ක්‍රමය දැනගැනීම, ඒ ඒ බීජජාති ඒ ඒ වෘක්ෂලතා ඇතිව නැතිවන ක්‍රමය දැනගැනීම, නානාප්‍රකාර ඍතු ලක්‍ෂණ ඍතු බලපරාක්‍රම දැනගැනීම, කුශලා-කුශල කර්‍ම විචිත්‍රත්වය දැන ගැනීම, සත්ත්වයාගේ චුති උප්පත්ති ලක්‍ෂණ දැනගැනීම, ඇස් කන් ආදී ආධ්‍යාත්මික දොර කවුළුවල රූප ශබ්දාදී අරමුණු ගැටීමෙන් විඤ්ඤාණසිත ඇතිව නැතිවෙන ක්‍රමය දැනගැනීම, ජීවිතය ඇති නැති ඒ ඒ ද්‍රව්‍ය පුඤ්ජයන්හි ධාතු ලක්‍ෂණ ධර්‍ම ලක්ෂණ දැනගැනීම, බුද්ධ ශාසනය කෙරෙහි අචල ශ්‍රද්ධාභක්තිය ඇතිවීම, මිනිසත්බව සඵල කර ගැනීම යනාදී ඵල ප්‍රයෝජන රාශිය නිරායාසයෙන් ලබාගත හැකි වේ. ඒ එසේමය! සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහාසමුද්‍රය මුතු මැණික් වෛඩූර්‍ය ආදී අනේකවිධ රත්නයන්ට ආකර වූවාක් මෙන් මේ ග්‍රන්ථය ද සර්‍වඥශාසනයෙහි බුද්ධාගම්කාර ජනීජනයන් විසින් ඉගෙනිය යුතු අනේකවිධ ධර්‍ම රත්නයන්ට ආකරයක් වැනි වේ. එසේ ම දැන් මේ ලැබී තිබෙන මිනිසත් බැවින් සහ බුද්ධෝත්පාදයෙන්

ගතයුතු ප්‍රයෝජනය ගැනීමට ප්‍රමාණ තරම් ධර්මකොට්ඨාසවලින් සරසා ලියන ලද්දක් බැවින් සියළු බෞද්ධ ජනීජනයන්ට අසහාය අද්විතීය සිතුමිණි රුවනක් හා සාමාන ද වේ.

මෙසේ මේ ග්‍රන්ථය අනේකවිධ ධර්ම ලක්‍ෂණ ධාතු ලක්‍ෂණ කාටත් තේරුම් ගතහැකි ලෙස නොයෙක් නිදසුන් දක්වමින් ලිහිල්කොට ලියන ලද්දක් බැවින් සර්වඥශාසනය නමැති මහා සමුද්‍රගත අනේකවිධ ධර්මරත්නයන් උකාගැන්මෙන් දහම් සිටුවරයන් වනු කැමති සකල සත්පුරුෂයන් විසින් ම මේ ග්‍රන්ථය නිතර පරිශීලනයෙන් ඉගෙන පිළිපැද මාර්ගඵල අවසන්කොට ඇති අමාමහ නිවන් පිණිස උත්සාහ කළ යුතු.

මෙසේ කියන ලද අර්ථරාශිය සලකාගෙන තවද මෙකල ක්‍රිස්තියානි ආදී මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ සාමංතක්ක වීමංසිච්ඡා මාත්‍රයෙන් (තම තමන්ගේ කල්පනා මාත්‍රයෙන් විමසීම් මාත්‍රයෙන් කැමැතිව) ගන්නා ලද නොයෙක් දුර්වාද සනාන්ධකාරයෙන් අන්ධව සමහර අප බෞද්ධ සිංහලයෝ පවා නිර්වාණය කෙරෙහි සැක ඉපදවීම්, මහා කාශ්‍යපාදී මහරහතන් වහන්සේලා විසින් තුන්වාරයක් ම සංසායනාවට නංවන ලද ආගම ධර්මයෙහි පවා වෛතුල්‍ය මත තිබේයයි සැක ඉපදවීම්, තුණුරුවන් කෙරේ සැක ඉපදවීම් ආදී නොයෙක් චේතෝඛිල ධර්මයන්ට අසුවී නො මග ගමන් කරති. එහෙයින් ඔවුන්ගේ ඒ දූර්මත දුරලීමට ද අත්‍යන්තෝපකාරී "නියාමදීපනීය" නම් වූ මේ ග්‍රන්ථය මෙහි පහත නම සඳහන් වන මා විසින් නො මිලයේ බෙදාදීමෙන් ධර්මදානානිශංස ලබාගැනීම පිණිස මුද්‍රණය කරවන ලදී.

පොත් ලබාගනු කැමැත්තන් විසින් ශත 5 ක තැපැල් මුද්දරයක් සමඟ ඉල්ලුම් කරනු.

මේවගට - දෙවෙනි මරදානේ පදිංචි
අඹේගොඩ ලියනගේ
දොන් විල්සන් සල්මන් අප්පුහාමි

කොළඹ තැපෑල.
1918

# නි යා ම දී ප නි ය

**නමො තස්ස භගවතො අරහතො**

**සම්මා සම්බුද්ධස්ස.**

නියාම ධම්ම සංසිද්ධං නියාම ධම්මදෙසකං

නත්වා නාථං කරිස්සාමි සුභං නියාමදීපනිං.

**නියාම ධර්ම සංසිද්ධං,** (සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරණ ලද සමත්‍රිංශත්වර පාරමිතා සඞ්ඛ්‍යාත) නියාම ධර්‍මයන්ගේ බලයෙන් මොනවට සිද්ධවූ බුද්ධත්වයක් ඇත්තාවූද; **නියාම ධම්ම දෙසකං,** (පටිච්ච සමුප්පාදාදී) නියාම ධර්‍ම දේශනාකර වදාළාවූද; **නාථං,** සර්‍වඥයන්වහන්සේ; **අහං,** මම; **නත්වා,** (භයලාභ කුලාචාරයෙන් තොරව සකසා) නැමද; **සුභං,** (බලන්නවුන්ගේ ඥාණාලෝකය බැබලීමට තරම් ආගම යුක්ති ස්වභාව යුක්ති සහිත වූ හෙයින්) යහපත්වූ; **නියාමදීපනිං,** නියාමදීපනී නම් ග්‍රන්ථයක්; **කරිස්සාමි,** (සංක්‍ෂේපයෙන්) කරන්නෙමි.

මෙහි "**නියාම ධම්ම සංසිද්ධං**" යනුයෙන් අනික් ආගම්වල මෙන් හේතු රහිතව ඉබේ ම පහළ වූ බුදුකෙනෙක් නොවන බව දක්වන ලදී. නියාම ධර්‍මය නම් කිසි ම මනුෂ්‍යයකුගේ හෝ දෙවියකුගේ හෝ බ්‍රහ්මයකුගේ හෝ මැවුන්කාරයකුගේ හෝ මැවීමකින් නොව ස්වභාව ධර්ම වූ පරිද්දෙන් ඒ ඒ හේතු බලයෙන් ඒ ඒ ඵල ධර්‍ම පරම්පරාවන්ගේ ඇතිව නැතිවෙමින් පැවැත්ම

වේ. ඒ නියාම ධර්මය ගැන කථාකරන කථික පැණවතුන් විසින් ව්‍යවහාර භාෂායෙහි දක්නා ලබන න්‍යායවචනයන් අතුරෙන් ප්‍රධාන න්‍යාය වචනය දැන ඉගෙන කථාකළ යුතු වේ. එහි ප්‍රධාන න්‍යාය වචනය නම් ''රාජා ආගතො'' (රාජා, රජතෙමේ; ආගතෝ, ආයේය;) යනුය. මෙහි රජතෙම ආයේ යයි දැක්වීමෙන් ඒ රජහට සුදුසු පිරිස ද ආයේය යනු නො දක්වන ලද්දේ නමුත් සිද්ධාන්ත වශයෙන් අනුමිතිකොට ගතයුතු වූ අර්ථපක්ෂය වේ. ලෝකයෙහි යථෝක්ත න්‍යාය වචනයට බඳු න්‍යාය වචන තුනක් තිබේ. එනම් 1. අඹ දඹ පොල් පුවක් ලබු පුසුල් උඳු මුං තල මෑ සාලි වීහි යනාදී වෘක්ෂලතා හා ධාන්‍යජාති බීජයෙන් හටගන්නේය යන න්‍යාය වචනය ද 2. මනුෂ්‍යයන්ගේ සැපයට හිතවූ සියළු සම්පත් පෙර කළ පින්බලයෙන් පහළවන්නේ ය යන න්‍යාය වචනය ද, 3. පෙර පුරන ලද පාරමිතා බලයෙන් මේ භවයෙහි මාර්ගඵලාධිගමය වන්නේ ය යන න්‍යාය වචනය ද යන තුනය.

එයින් පළමුවෙනි ප්‍රධාන න්‍යාය වචනයේ අදහස නම්:- බීජය යනු ප්‍රධාන න්‍යාය වචන මාත්‍රය ම වේ. බීජය ඇති වූ පමණින් පැලවීම සිදුවන්නේ නොවේ. ඒ එසේමැයි. සුදුසු වූ භූමි ප්‍රදේශයකුත් ඇතිව ම ප්‍රමාණ තරම් වර්ෂාජලයත් ඇතිව ම වෘක්ෂලතා සම්බන්ධ බීජයන්ගේ පැලවීම සිදුවන්නේ ය. සාලි වීහි ආදී ධාන්‍යබීජ වනාහි සුදුසු වූ ක්ෂේත්‍රයකුත් ඇතිව ම ප්‍රමාණ තරම් වර්ෂා ජලයත් ඇතිව ම ගොවියාගේ කලට යෝග්‍ය ගොවිකර්මාන්තත් ඇතිව ම පැල වීමෙන් නැවත පෝෂ්‍යවීමට තරම් වර්ෂා ජලය ද ලැබ පෝෂ්‍යවීමෙන් සඵලවන්නේ ය. එසේ නොව බීජ සම්පූර්ණ වූ නමුත් ක්ෂේත්‍රයක් නැත්නම් ඒ බීජයන්ගේ පැළවීම සිදුනොවේ ම ය. වර්ෂා ජලය ඇතත් ගොවියාට ලෙඩදුක් පැමිණීමෙන් හෝ රජදඬුවම් පැමිණීමෙන් හෝ අක්ෂධූර්ත සූරාධූර්තාදී ධූර්තභාවයක් නිසා ප්‍රමාදවීමෙන් හෝ සීසෑම් නියර බැඳීම් ආදී ගොවිකර්මාන්ත රැස කරන්නට බැරිව අතපසුවී නම් එම බීජ රාශිය නො පැලවේ ම ය. ගොවියා විසින් කටයුතු ගොවිකර්මාන්ත රැස සුදුසු කලට කිරීමෙන් සියළු බීජ රාශිය

මොනවට පැලවී ගොයම ඇතිවූ නමුත් නැවත ශස්‍ය පෝෂ්‍යවී ගොවිතැන සඵල වීමට තරම් වෂ්ාව නො ලැබී නම් ඒ සියලු ශස්‍යගොවිතැන අව්වෙන් වියළී නැතිවී යන්නේ ය. මේ පළමුවෙනි ප්‍රධාන න්‍යාය වචනයේ අදහසයි.

දෙවෙනි ප්‍රධාන න්‍යාය වචනයේ අදහස නම් :- මනුෂ්‍යයන් විසින් මෙලොව සැප පිණිස පෙර භවයන්හි කරන ලද කුශල කර්‍මයෝ ධාන්‍ය ගොවිතැනේ පරණ බිජුවට හා සමානයහ. මනුෂ්‍යයන්ගේ පූර්‍වාචාර්‍ය වූ මවුපියවරු ධාන්‍ය ගොවිතැනේ ක්ෂේත්‍ර හා සමානය. ධාන්‍යගොවිතැනේ ක්ෂේත්‍රය ඇති වූ නමුත් වෂ්ාව නැත්නම් ඒ ක්ෂේත්‍රය ඇතයයි යන සඞ්ඛ්‍යාවට නො පැමිණෙන්නාක් මෙන් ඥාණයෙන් වැඩිදියුණුවීම පිණිස අවවාද නො දෙන මව්පියවරු ඇති නමුත් ඇතයයි යන සංඛ්‍යාවට නො පැමිණෙති. යහපත් අවවාද නැති මවුපියවරු අසාරවත් ක්ෂේත්‍ර හා සමාන වෙති. ඔවුන් වෙත වැඩෙන දූදරුවෝ අසාරවත් ක්ෂේත්‍රයන්හි හටගන්නා ශස්‍ය හා සමාන වෙති. යහපත් අවවාද ඇති මවුපියවරු සාරවත් ක්ෂේත්‍ර හා සමාන වෙති, ඔවුන් වෙත වැඩෙන දූදරුවෝ සාරවත් ක්ෂේත්‍රයන්හි හටගන්නා ශස්‍ය හා සමාන වෙති. ළදරු අවස්ථාවෙහි හික්මවන ගුරුවරු ධාන්‍යගොවිතැනේ වපුරන වකවානුවෙහි වසින වෂ්ාව හා සමාන වෙති. ඒ ගුරුවරයෝ අදක්ෂයෝ වී නම් ඔවුන්ගේ ගෝලයෝ ද ඥාණයෙන් දියුණුවට නො පැමිණෙති. ධන ධාන්‍යයෙන් ආඪ්‍යවීම පිණිස ඥාණයෙන් හා වීර්‍ය්‍යයෙන් සම්පාදනය කළ යුතු ශිල්ප ශාස්ත්‍ර රැකීරක්ෂාදී කර්තව්‍ය රාශිය ධාන්‍ය ගොවිතැනේ ගොවියාගේ ඥාණයෙන් හා වීර්‍ය්‍යයෙන් සම්පාදනය කළ යුතු ගොවිකර්‍මාන්ත රාශිය හා සමාන වේ. ධාන්‍ය ගොවිතැනේ බිජුවට සම්පූර්‍ණ වූ නමුත් ගොවියාට ගොවිකර්‍මාන්ත රාශිය කරගන්නට බැරි වී අතපසු වී නම් ඒ බිජුවට රාශිය අටුකොටුවල දිරායන්නාක් මෙන් පූර්ව භවයන්හි කරන ලද පින් ඇතත් මනුෂ්‍යයන් තුළ ඥාණයෙන් හා වීර්‍ය්‍යයෙන් සම්පාදනය කළ යුතු ශිල්ප ශාස්ත්‍ර රැකී රක්ෂා පුරුදු පුහුණු කිරීමක් නැත්නම් එම කුසලකර්‍මයෝ

විපාක දීමට අවකාශ නො ලැබ සන්තානානුගතවී යති. ධාන්‍ය ගොවිතැනේ වපුරන වකවානුයෙහි ප්‍රමාණ තරම් වර්‍ෂාජලය ලැබ යහපත් ලෙස ගොයම ඇති වූ නමුත් කරල් ඇදී මුහුකුරුවෙන්නට මත්තෙන් වර්‍ෂාව නොවැස නියඟකරන්නට පටන්ගතහොත් සියළු ගොවිතැන අව්වෙන් වියලී විනාශවී යන්නාක් මෙන් මනුෂ්‍යයෝ ඥාණයෙන් වැඩිදියුණු වීමට මත්තෙන් ලෝක ධර්‍ම දෙකේ තලතුනා නුවණැත්තන් සේවනය නො කොට සිතට වසඟව තම තමන්ගේ කැමැත්තට අනුව වාසය කරත් නම් පෙර කරන ලද පින්බලයෙන් ඇතිවිය යුතු විපාකසම්පතින් පවා පිරිහීයති. - මේ දෙවෙනි ප්‍රධාන න්‍යාය වචනයේ අදහසයි.

**තෙවෙනි ප්‍රධාන න්‍යාය වචනයේ අදහස නම්:-** මේ භවයෙහි මාර්ගඵලාධිගමය පිණිස පූර්‍ව පූර්‍ව භවයන්හි පුරන ලද පාරමිතා ධර්‍ම ධාන්‍ය ගොවිතැනේ පරණ බිජුවට හා සමාන වෙති. මාර්‍ගඵලාධිගමය පිණිස ළදරු අවස්ථාවෙහි හික්මවන ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ ධාන්‍ය ගොවිතැනේ ක්‍ෂේත්‍ර හා සමාන වෙති. ඒ ආචාර්ය උපාධ්‍යායයෝ ඥාණවන්තයෝ නො වී නම් ඔවුන්ගේ ගිහිපැවිදි ගෝලයෝ ද ශාසන ධර්‍මයෙහි දක්‍ෂභාවයට නො පැමිණෙති. එහෙයින් ඔවුන් විසින් පූර්‍ව පූර්‍ව භවයන්හි පුරන ලද පාරමීධර්‍මයෝ උද්දීප්තිමත්ව විපාකදීමට පොහොසත් නො වී යති. ඉතාමත් ළදරු අවස්ථාවෙහි හික්මවන ගිහිපැවිදි ගුරුවරුන්ගේ අවවාදානුශාසනා ධාන්‍ය ගොවිතැනේ වපුරන වකවානුයෙහි වසින වර්‍ෂාව හා සමානය. වපුරන වකවානුයෙහි නියඟකරන්නාක් මෙන් බෝධිපාක්‍ෂික ධර්‍මාවවාදයන්ගෙන් තොර වූ ඒ ඒ ගම් නියම්ගම් රාජධානීන්හි වාසය කරන ස්ත්‍රී පුරුෂයෝ සමථවිදර්‍ශනා භාවනාවන්ගෙන් හිස්ව ඉඳීම හේතුකොට ගෙන ඔවුන් විසින් පූර්‍ව පූර්‍ව භවයන්හි පුරන ලද පාරමී ධර්‍මයෝ උද්දීප්තිමත්ව විපාකදීමට අවකාශ නො ලැබ සන්තානානුගතවී යන්නාහුය. මේ භවයෙහි මාර්‍ගඵලාධිගමය පිණිස මේ ගෞතම සර්‍වඥ ශාසනයෙහි සම්පාදනය කළ යුතු වූ කෘත්‍යරාශිය ධාන්‍ය ගොවිතැනේ

ගොවියාගේ ඤාණයෙන් හා වීර්‍ය්‍යයෙන් සම්පාදනය කළයුතු ගොවිකර්මාන්ත රාශිය හා සමානය.

මේ ගෞතම සර්‍වඥ ශාසනයෙහි සම්පාදනය කළ යුතු කෘත්‍ය රාශිය නම් සංක්ෂේපයෙන් ශීල, සමාධි, ප්‍රඥා යන තුනය. මධ්‍යම වශයෙන් සතිපට්ඨානාදී සත්තිස් බෝධිපාක්ෂික ධර්‍මයෝය. විස්තර වශයෙන් විනය සූත්‍ර අභිධර්ම යන ත්‍රිපිටකයෙන් ප්‍රකාශවන්නා වූ ප්‍රතිපත්ති ධර්මයෝ ය.

එයින් ගිහිගෙයි වසන ස්ත්‍රී පුරුෂයෝ පඤ්ච ශීලයෙහි හොඳින් පිහිටියහොත් ඔවුන්ගේ ශීල ශික්ෂාව සම්පූර්ණ වන්නීය. ශ්‍රමණයන් වහන්සේලා ආචාර්‍ය්‍යවත් උපාධ්‍යායවත් ආදී වත්පිළිවෙත් සහිතව ප්‍රාතිමෝක්ෂයෙහි එන්නා වූ දෙසිය සත්විස්ස (227) ක් ශික්ෂා පද ශීලයෙහි හොඳින් පිහිටියහොත් ඔවුන්ගේ ද ශීල ශික්ෂාව සම්පූර්ණ වන්නීය. ගිහි පැවිදි දෙකොටස ම යටත්පිරිසෙයින් ආණපාණ භාවනාව හොඳින් පුහුණු පුරුදු කොට වඩා සිත එකග කරගති නම් සමාධිශික්ෂාව සම්පූර්ණ වන්නීය. එසේ ම මේ ශරීරයෙහි පෘථිවි, ආපෝ, තේජො, වායෝ, විඤ්ඤාණ, ආකාශ යන ෂට්විධ ධාතූන්හි අනිත්‍ය භාවනාව පුහුණු පුරුදුකොට විදර්‍ශනා වඩත්නම් ප්‍රඥාශික්ෂාව ද සම්පූර්ණ වන්නීය. මෙසේ කියන ලද ත්‍රිවිධ ශික්ෂා සඞ්ඛ්‍යාත ශාසන ධර්‍මයෙහි පිහිටිය හොත් සත්තිස් බෝධිපාක්ෂික ධර්‍මයන්හි ද පිහිටියාහු වෙත්. විනය සූත්‍ර අභිධර්‍ම යන ත්‍රිපිටකයෙන් ප්‍රකාශ වන්නා වූ ප්‍රතිපත්තිධර්‍ම සමූහයෙහි ද පිහිටියාහු වෙත්.

ධාන්‍ය ගොවිතැනේ ගොවියා විසින් කළ යුතු ගොවිකර්‍මාන්ත රාශිය නො කොට හැරදමුවහොත් ඒ අවුරුද්දේ වැපිරිය යුතු බිජු වට රාශිය අටුකොටුවල දිරායන්නාක් මෙන් ගිහියන්ට අයත් ත්‍රිවිධ ශික්ෂාව ගිහියෝ ද ශ්‍රමණයන්ට අයත් ත්‍රිවිධ ශික්ෂාව ශ්‍රමණයෝ ද නො පුරා හැරදමුවහොත් ඔවුන් විසින් පූර්‍ව භවයන්හි පුරන ලද පාරමී ධර්‍ම ඇතිවූ නමුත් මේ ගෞතම සර්‍වඥ ශාසනයෙහිදී මාර්‍ගඵලයන් කෙරෙන් දුරුවී ගිය

හෙයින් පූර්වභවයන්හි පුරන ලද එම පාරමී ධර්මයෝ මාර්ගඵල ලබාදීමට අවකාශ නො ලැබ සන්තානානුගත වී යති. මෙසේ අතිශයින් දුර්ලභ වූ සර්වඥ ශාසනය ලබාගෙන ද කටයුතු වූ ත්‍රිවිධ ශික්ෂා පරිපූරණය නො කොට යහපත් කාලය අපතේ ඉකුත්කර හැරීමෙන් කාමතණ්හා සැඩපහර, භවතණ්හා සැඩපහර, මිථ්‍යාදෘෂ්ඨි සැඩපහර, අවිද්‍යා සැඩපහර යන චණ්ඩ පරුෂ චතුර්විධ සැඩපහරට හසුවී සංසාර සාගරයෙහි ගිලෙමින් පාවෙමින් දුකට ම භාජනය වන්නාහුය. සමහර දෙනෙක් මෛත්‍රිය සර්වඥයන් වහන්සේගේ ශාසනයේදී මාර්ගඵල ලබාගැන්ම පිණිස බලාපොරොත්තු වී සිටිති. එම මෛත්‍රිය සර්වඥ ශාසනය ලබාගතහොත් ඔවුන්ගේ ඒ බලාපොරොත්තුව ලෙස සිද්ධවෙන්ට ද බැරි නොවේ. නමුත් මෛත්‍රිය සර්වඥ ශාසනයෙහි මාර්ගඵල ලබාගැන්මට වඩා උන්වහන්සේගේ ශාසනය සම්මුඛ කර ගැන්ම අතිශයින් ම දුෂ්කරය. කුමක් හෙයින් ද යත්? මෙම ගෞතම සර්වඥ ශාසනයටත් මෛත්‍රිය සර්වඥ ශාසනයටත් අතර බුද්ධශූන්‍යව ශාසනශූන්‍යව ගතවන්නා වූ සංසාර කාන්තාරයෙහි අවිද්‍යා ඝනාන්ධකාරයෙන් අන්ධව ගමන් කරන්නට වන භවයන්ගේ පරිච්ඡේද ප්‍රමාණයක් නැති හෙයිනි. ධාන්‍ය ගොවිතැනේ වපුරන වකවානුවෙහි ප්‍රමාණ තරම් වර්ෂා ජලය ලැබ යහපත් ලෙස පැලවී ගොයම ඇතිවී ආ නමුත් කරල් ඇදී මුහුකුරුවෙන්ට මත්තෙන් වර්ෂාව නො වැස නියඟ කිරීමට පටන්ගතහොත් සියළු ගොවිතැන අව්වෙන් වියළී විනාශ වන්නාක් මෙන් පූර්වාචාර්යවූ මවුපියන්ගේ සමීපයෙහිදී සත්පුරුෂ වංශය වූ ශාසනධර්ම අත්තිවාරම දමාගත් නමුත් ශ්‍රද්ධා ස්මෘති සමාධි ප්‍රඥා යන ගුණධර්ම මුහුකුරායන්නට මත්තෙන් යහපත් ධර්මධර පණ්ඩිත සේවනයෙන් තොරව ධර්මාවවාද නො ලැබ සිතට වසඟව සියකැමැත්තට අනුව විසීම බහුල වීනම් තෘෂ්ණාමාන්න උත්සන්නව එම කෙලෙස් නමැති ගින්නෙන් යථෝක්ත ශ්‍රද්ධාදී ගුණධර්ම දා විනාශ වීමෙන් මෙම ගෞතම සර්වඥ ශාසනයට දුරින් ම දුරුවී ගොස් වුක්තප්‍රකාරයෙන් සංසාරසාගරයෙහි ගිලෙමින් පාවෙමින් දුකට ම භාජන වන්නාහුය. එහෙයින් සියළු සත්පුරුෂයෝ ම සිහිනුවණින් යෙදී

සිය වැඩ පිණිස උත්සාහ වඩත්වා, - මේ තෙවෙනි ප්‍රධාන න්‍යාය වචනයේ අදහසයි.

මේ න්‍යාය වචන තුන ප්‍රධාන න්‍යාය වූවාක් මෙන් නියාම ධර්ම ප්‍රකාශ වන්නාවූ වචන පස ද ප්‍රධාන න්‍යාය වචන ම වේ. එහි නියාමධර්ම ප්‍රකාශවන්නාවූ වචන පස නම් :-

1. **බීජ නියාමය ප්‍රකාශවන වචනය**

2. **ඍතු නියාමය ප්‍රකාශවන වචනය**

3. **කර්ම නියාමය ප්‍රකාශවන වචනය**

4. **ධර්ම නියාමය ප්‍රකාශවන වචනය**

5. **චිත්ත නියාමය ප්‍රකාශවන වචනය** යන පසය.

මේ ප්‍රධාන න්‍යාය වචන පසෙහි අභිප්‍රාය **අභිධර්ම අත්ථසාළිනී** නම් අට්ඨකථායෙහි ආ පරිද්දෙන් පළමුකොට දක්වනු ලැබේ. එහි කිසි ම කෙනෙකුගේවත් සකස්කිරීමක් නැතිව එසේ සකස්කරන ලද්දක් මෙන් බීජයන්ගේ ආනුභාවයෙන් ඒ ඒ වෘක්ෂලතාවන්ගේ පරම්පරාගත අවිපරීත පැවැත්මයයි කියන ලද ආකාර විශේෂයාගේ නියමය **බීජනියාමය** නම් වේ. ඒ එසේමැයි. කඩලගහේ දලුව උතුරුදිශාවට හැරී ලියලීම, දක්ෂිණ වල්ලියයි කියන ලද වැල් වර්ගයාගේ ගහට දකුණු පැත්තෙන් පටලැවී යාම්වීම, සූර්‍ය්‍යකාන්ත නම් පුෂ්පයන්ගේ සූර්‍ය්‍යයා දෙසට හැරීම, මාලුවා නම් වැල්වර්ගය ගහක් දිශාවට යාම් වීම, පොල්ගෙඩියේ මතුයෙහි සිදුරු ඇති වීම, ඒ ඒ බීජයන්ගෙන් හටගන්නා වෘක්ෂලතාවන්හි බීජයට බඳු එල හටගැන්ම යන මේ ආදිය බීජ නියාම බලය වේ. යටකී ලෙස සකස් කරන්නෙක් නැතිව ඍතුහුගේ ආනුභාවයෙන් ඒ ඒ වෘක්ෂලතාවන්ගේ පරම්පරාගත අවිපරීත පැවැත්මයයි කියන ලද ආකාර විශේෂයාගේ නියමය **ඍතුනියාමය** නම් වේ. ඒ එසේමැයි. බක් වෙසක් ආදී ඒ ඒ මාසවල ඒ ඒ කාලවල වෘක්ෂලතාවන්ගේ මල් පිපීම එල හටගැන්ම යන

මේ ආදිය ඍතු නියාම බලය වේ. සත්ත්වයන් විසින් පෙර කරන ලද පින් පව් දෙකේ හැටියට කර්මයට බඳු විපාක ලැබීම කර්ම නියාමය නම් වේ. මේ කර්ම නියාම බලය මතු දක්වන කථාවස්තු වලින් දත යුතුය.

බුදුන් කල සැවැත්නුවර දොරටුව සමීපයෙහි ගමක් ඇති විය. ඒ ගම ගිනිගෙන දන විට ගින්න සමග අහසට නැඟුණු තණදරණුවකට පියාසර කරන්නාවූ කවුඩකුගේ බෙල්ල ඇතුල්වී කවුඩා දා බිම වැටී මරුමුවට පත්විය. මහා සමුද්‍රයෙහි යාත්‍රා කළා වූ නැවක් සමුදුර මැද යාත්‍රා නො කොට එක පහරින් නැවතීය. එවිට නැවෙන් ගමන්කරන්නවුන් විසින් අප නැවේ පවුකාර කලකණ්ණියෙක් ඇති විය යුතු යයි සිතා කාලකණ්ණි කුසපත දමන ලදින් තුන්යලක් ම දෙටුනාවික භාර්‍යාවගේ අතේ කුසපත වැටීය. දෙටු නාවිකතෙමේ එකකු නිසා බොහෝ සේනාවකට විපතක් නො වේවායි කල්පනා කොට වැලිකලයක් බෙල්ලේ බන්දවා තම භාර්‍යාව සමුදුරයට තල්ලුකර දැම්මවූයේ ය. එවිට ඒ පහරක්මෙන් නැව වේගයෙන් යාත්‍රා කරන්නට වන.

එක්තරා භික්ෂුවක්තෙම පර්වතපාදයෙක්හි ගුහාවක වාසය කෙළේ ය. ඒ පර්වත මතුයෙහි තුබුණු ගලක් ඉබේ පෙරළී අවුත් ගුහා දොර වැසුනේය. නැවත සතියකගේ අවෑමෙන් ඒ ගල ඉබේ ම ඉවත්ව ගුහාදොර විවෘත විය. මේ කථාවස්තු තුන ම ඊට කාරණ වූ කර්මය දැනගැන්ම පිණිස දෙව්රම්වෙහෙර වැඩ වාසය කර වදාරන්නාවූ සර්වඥයන් වහන්සේට ධම්ම පටිග්ගාහක වූ භික්ෂූන් විසින් සැළකරන ලදුව උන්වහන්සේ මතු ප්‍රකාශ වන පරිද්දෙන් ඒ තුන්දෙනාගේ පූර්වකර්මය ප්‍රකාශ කොට වදාළෝය. හේ කෙසේද යත්? කවුඩුතෙම පෙර එක්තරා භවයක ලබන ලද මිනිසත්බැව් ඇත්තේ දමනය කළ නො හැකි ගොනකු කෙරෙහි කිපී ගොනුගේ සිරුරෙහි පිදුරු ඔතා ගිනි දල්වා ගොනු මරුමුවට පත් කෙළේ ය. ඔහු ඒ කර්මය හේතුකොටගෙන මරණින් මතු තිරිසන් යෝනියෙහි කවුඩුව ඉපිද අහසෙහි පියාසර කරනුයේ ඒ පෞරාණික අකුශලකර්ම බලයෙන් අහසට නැඟුණු ගිනි සහිත

තණ දරණුයෙහි බෙල්ල ඇතුල්කරගැන්මෙන් දා විනාශයට පත් විය.

දෙවු නාවික භාර්‍යාතොමෝ ද පෙර ස්ත්‍රී අත්බැවින් ම ඉපද සුනඛයෙක් කෙරෙහි කිපී වැලිකලයක් බෙල්ලේ බැඳ සුනඛයා දියේ ගිල්වා මරුමුවට පත්කළාය. ඕ තොමෝ ද ඒ කර්මය හේතු කොට ගෙන තම ස්වාමියා සමග නැවෙන් වෙළඳාම් පිණිස යන්නී නැව යාත්‍රා නො කොට නතර වූ කල්හි කලයක වැලි පුරවා බෙල්ලේ බැඳ සමුද්‍රයට තල්ලු කර දමන ලදුව මරුමුවට පත් වූවාය.

භික්ෂුතෙමේ පෙර භවයක මිනිසත්බැව්හි ඉපද ගොපලු කොල්ලෙක්ව ගවයන් පාලනය කරනුයේ ගොයෙක් හුඹසකට ප්‍රවිශ්ට වෙනවා දැක කොළ පත්දුවකින් හුඹස්කට වසා ගියේ ය. නැවත සතියකගේ ඇවෑමෙන් ඒ පෙදෙසට අවුත් නිරාහාරභාවයෙන් පෙළී කම්පාවෙමින් හුඹසින් නික්ම ආවාවූ ගොයා දැක කරුණාව ඉපදී නො මරා යන්ට හැරියේය. භික්ෂුතෙම ඒ අකුශල කර්මය හේතුකොටගෙන සතියක් මුළුල්ලෙහි ගුහාවෙන් වැසී නිරාහාරව දුකින් පෙලුනේය. මේ කථාවස්තු තුන ම එකතුකොට සර්වඥයන් වහන්සේ මතු ප්‍රකාශවන්නා වූ ගාථාව වදාළෝය.

**න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ**

**න පබ්බතානං විවරං පවිස්ස**

**න විජ්ජතෙ සො ජගතිප්පදෙසො**

**යත්ථ ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා.**

**අන්තලික්ඛෙ**, ආකාශයෙහි; **ඨිතො**, සිටියාවූ සත්ත්ව තෙමේ ද; **පාපකම්මා**, තමා විසින් කරන ලද පාපකර්ම විපාකය කෙරෙන්; **න මුඤ්චති**, නො මිදේ; **සමුද්ද මජ්ඣෙ**, සමුද්‍ර මධ්‍යයෙහි; **ඨිතො**, සිටියාවූ සත්ත්වතෙමේ ද, **පාපකම්මා**, තමා විසින් කරන ලද පාපකර්ම විපාකය කෙරෙන් **නමුඤ්චති**, නො මිදේ; **පබ්බතානං**, පර්වතයන්ගේ; **විවරං**, විවරයට; **පවිස්ස**, ප්‍රවිෂ්ටව;

ඨිතො, සිටියාවූ සත්ත්ව තෙමේද; පාපකම්මා, තමා විසින් කරන ලද පාපකර්ම විපාකය කෙරෙන්; න මුඤ්චති, නො මිදේ; යත්ථ, යම් බඳු ප්‍රදේශයෙක්හි; ඨිතො, සිටියාවූ සත්ත්වතෙම; පාපකම්මා, තමා විසින් කරන ලද පාපකර්ම විපාකය කෙරෙන්; මුඤ්චෙය්‍ය, මිදෙන්නේද; සො ජගතිප්පදෙසො, ලෝකයෙහි එබඳු ප්‍රදේශයක්; න විජ්ජතෙ, නැත්තේ ම ය.

පශ්චිමභවික බුද්ධ බෝධිසත්ත්වයන් වහන්සේලාගේ මවුකුස පිළිසිඳගැන්ම බුද්ධත්වයට පැමිණීම දම්සක් පැවැත්වීම ආයුසංස්කාරය හැරීම නිවන්පුර පැමිණීම යනාදී කාලයන්හි අති විශාල පාරමී පුණ්‍යසම්භාරයන්ගේ ආනුභාවයෙන් යදණ්ඩෙන් ගැසූ ලොහෝ තලියක් මෙන් ශතරාව සහස්‍රාවයෙන් දසදහසක් සක්වල කම්පාවීමගේ නියමය ධර්මනියාමය නම් වේ.

රූප ශබ්දාදී අරමුණු චක්ෂුරාදී සදොර සඝට්ටණය වූ විට නිර්මාණය කොට සකස්කරන්නෙක් නැතිව පඤ්චද්වාරාවජ්ජනය පඤ්ච විඤ්ඤාණය සම්පටිච්ඡනය සන්තීරණය යනාදී චිත්තයන්ගේ දැකීම මෙනෙහි කිරීමාදී ස්වකීය ස්වකීය කෘත්‍යකාරිත්වයෙන් පිළිවෙලින් පහලවීමේ නියමය චිත්ත නියාමය නම් වේ. මෙසේ පඤ්ච ප්‍රකාර නියාම ධර්මය ප්‍රකාශවන්නාවූ වචන පසෙහි අභිප්‍රාය අභිධම්ම අත්ථසාළිනී නම් අර්ථකථායෙහි ආ පරිද්දෙන් පළමුකොට දත යුතු. ලෝකය ද සත්ත්වයන් ද මැවුම්කාර දෙවියකුගේ මැවීමෙන් ඇතිව පවත්නේයයි අන්‍යාගම්වල දැඩිලෙස බාරගෙන උගන්වනු ලැබේ. අප බුඬාග මේ වනාහි ඒ සියල්ල ම කිසිවකුගේවත් මැවීමකින් නොව නියාම ධර්මයන්ගේ බලයෙන් ඇතිව නැතිවෙමින් පරම්පරාගතව පවත්නේයයි දැඩිලෙස බාරගෙන උගන්වනු ලැබේ.

මෙයින් අන්‍යාගම්වල ඉගැන්වීම එක ම මැවුම්කාර දෙවියකුගෙන් සියල්ල ම සම්පාදනය වන නිසා එය නුවණ මඳවූවන්ගේ ඉගෙනීමට හා ඇදහීමට ලෙහෙසිවී තිබේ. නියාමධර්ම බලයෙන් සම්පාදනය වන ඇත්තන්ගේ ඉගැන්වීම

වනාහි නානා ප්‍රකාර හේතුධර්ම නා නා ප්‍රකාර ඵලධර්මයන්ගේ වශයෙන් බෙදා වෙනස් කරගත යුතුවූ ඉගැන්වීමක් හෙයින් අතිශයින් දුෂ්කරමය. අතිශයින් ගැඹුරුමය. අතිශයින් විසිතුරු ම ය. එහෙයින් එය නුවණ මඳවූවන්ගේ ඉගෙණීමට හා ඇදහීමට දුෂ්කර වී තිබේ. මැවුම්කාර දෙවියකුගේ මැවීමෙන් ලෝකය හා සත්ත්වයෝ ඇතිව පවත්නාහු යයි බාරගෙන උගන්වන ඇත්තන්ට ලෝකය වෙනුවෙන්වත් සත්ත්වයන් වෙනුවෙන්වත් ධාතු ශාස්ත්‍ර ධර්ම ශාස්ත්‍ර ප්‍රයෝජන නොවේ. නියාම ධර්ම බලයෙන් ලෝකය හා සත්ත්වයෝ ඇතිව නැතිවෙමින් පවත්නාහුයයි බාරගෙන උගන්වන ඇත්තන්ට මැවුම්කාර දෙවියා ප්‍රයෝජනවත් නොවේ. හුදෙක් වනාහි ධාතුශාස්ත්‍ර ධර්මශාස්ත්‍ර ම ප්‍රයෝජනවත් වන්නේය, එහෙයින් මැවීම විශ්වාස කරන උදවියගේ පොත්වල ගම්බද සාමාන්‍ය ස්ත්‍රී පුරුෂයන් විසින් ව්‍යවහාර කරනු ලබන ලිහිල් ප්‍රඥප්ති වචන ම දක්නා ලැබේ. (F.A) (B.A) ආදී ධාතු ශාස්ත්‍රඥයන්ගේ ධාතුශාස්ත්‍ර පොත්වල සහ අප බුඬාගමේ අභිධර්ම පොත්වල ම ධාතු වචන ධර්ම වචන දක්නා ලැබේ.

ලිහිල් ප්‍රඥප්ති වචන මුළුලෝකවාසී සියළු ම ස්ත්‍රී පුරුෂයන්ගේ ඇස් කන්වී පවතී. ධාතු වචන ධර්මවචන වනාහි (F.A) (B.A) ආදී ධාතු ශාස්ත්‍රඥයන්ගේ සහ අභිධර්ම පණ්ඩිතයන්ගේ ම ඇස් කන්වී පවතී. මහපොළව මහමෙර මහා සාගරය යනාදී අවකාශ ලෝක ද්‍රව්‍යයෝ ද ගස්කොළන් වන පඳුරු ආදී සංස්කාර ලෝක ද්‍රව්‍යයෝ ද බ්‍රහ්ම දිව්‍ය මනුෂ්‍ය නාග සුපර්ණ ගෝමහිෂාදී සත්ත්ව ලෝක ද්‍රව්‍යයෝ ද යන මේ සියල්ල ධාතුකුඩු ධාතු කැලි ධාතුරාශියක් ම වන්නේ ය. ඒ සියල්ල ද ධාතු දන්නා අඳුනන ධර්මදන්නා අඳුනන අභිධර්ම පණ්ඩිතයන්ගේ ඇස් කන්වී පවතී. එහෙයින් ඒ ලෝකත්‍රයාගේ ඇතිවීම නැතිවීම ගැන තර්කකරන තර්කකාරයන්ගේ තර්කවලට නො රැවටීම පිණිස යට කියන ලද නියාම ධර්ම පඤ්චකයේ අදහස විස්තර වශයෙන් දැනගත යුතු වේ. මෙතැන්හි ලිහිල් වචන පාවිච්චි කරන ප්‍රඥප්තිකයන්ගේ සහ අභිධර්ම පණ්ඩිතයන්ගේද දැනීමේ වෙනස කියනු ලැබේ.

මනුෂ්‍යයකුගේ තැනීමෙන් ගෘහයක් ඇතිවීමෙහි සාමාන්‍ය මහජනතෙම ගෘහය සැදූ තැනැත්තා මනුෂ්‍යයෙක් යයි කියා ද ගෘහය ගෘහයක්යයි කියා ද දනගනී. ධාතු දන්නා අඳුනන පණ්ඩිතවරු වනාහි සාමාන්‍ය මහජනයා මෙන් මනුෂ්‍යයෙක ගෘහයක කියා ඇඳිනීම් ලක්‍ෂණ සංඥා දනීමෙන් ද ඇඳිනගනිති. මනුෂ්‍යයා යි ව්‍යවහාර කරන සංස්කාර පුඤ්ජයෙහි කෙතෙක් ධාතු තිබේද ගෘහයයි ව්‍යවහාර කරන සංස්කාර පුඤ්ජයෙහි කෙතෙක් ධාතු තිබේද කියාත් ස්වභාව ධර්‍ම දනීම් ලක්‍ෂණ ඤාණ දනීමෙන් ද දනගනිත්. ධාතු නො වන මනුෂ්‍ය සටහනෙහි මනුෂ්‍යයාය, ගෘහ සටහනෙහි ගෘහයය කියා ව්‍යවහාර මාත්‍රය ම මුත් මනුෂ්‍යයෙක්යයි කියා කෙනෙක් නැත්තේය. ගෘහයයි කියා දෙයක් නැත්තේය.

එහි මනුෂ්‍යයා හා ගෘහය ධාතු නොවේ, ධාතු ද මනුෂ්‍ය හෝගෘහයෝ නො වෙති, ධාතු කුඩු, ධාතු කැලි ධාතු රාශිය ම ඒකාන්තයෙන් විද්‍යමාන වේ. සටහන වනාහි ඒකාන්තයෙන් විද්‍යමාන දෙයක් නොව චිත්ත චෛතසිකයන්ට අරමුණු වූ ප්‍රඥප්ති මාත්‍රයකි. සාමාන්‍ය මහජනතෙම මනුෂ්‍යයෙක් ගේ තැනුයේය. මනුෂ්‍යයා ගේ තැනීමෙන් ගේ ඇති වී යයි දනගනී. ධාතුදක්නා පණ්ඩිතයන්ට වනාහි ධාතු චක්‍ෂුසින් දක බෙදා බැලූ කල මනුෂ්‍යයෙක කියා කෙනෙක් ගෘහයක කියා දෙයක් නො පෙනී, ධාතු කුඩු ධාතු කැලි ධාතු රාශියක් ම පෙනී යන්නේය. යථෝක්ත ධාතුන් අතුරෙහි ගෙවල් තැනීමේ පොහොසත් වූ ධාතුවක් ද ඇත්තේය. ඊට චේතනායයි කියා ද කර්‍මයයි කියා ද ව්‍යවහාර කරනු ලැබේ. ඒ එසේමය. කායාඞ්ගයන් හා චිත්තාඞ්ග යන් ඒක්‍ෂණයකින් නැගිටීම පිණිස පුබුදුවා සොළවා හරින හෙයින් ඊට චේතනායයි ව්‍යවහාර කරනු ලැබේ. මනුෂ්‍යයා කෙරෙහි ඉඳගැනීම, නැගිටීම, යාම, ඊම, දීම, ගැනීම, කැපීම, කෙටීම, ගැසීම, නැසීම, කීම, බිණීම, හැඳෑරීම, කාමසිතිවිලි ව්‍යාපාද සිතිවිලි විහිංසා සිතිවිලි ඉපදවීම් ආදී ව්‍යාපාර සියල්ලක් චේතනාව නො නැඟිටියහොත් සිද්ධ නොවේ ම ය, චේතනාව

නැගිට සිටීමෙන් ම ඒ ව්‍යාපාර රාශිය සිද්ධ වන්නේය. ඒ එසේමය. චේතනාව නැඟිට සිටීමෙන් චිත්තාඞ්ගවූ විතර්කය, වීර්‍ය්‍යය, ලෝභය, ද්වේෂය, ශ්‍රද්ධාව, ස්මෘතිය, ප්‍රඥාව යනාදී චෛතසික ධර්‍මයෝ ද තමතමන්ගේ කෘත්‍ය සම්පාදනයෙන් නැඟිටින්නාහුය. මෙසේ ඒ ඒ කටයුත්තක් පාසා චේතනාව ම ප්‍රධානවීමෙන් කායද්වාරයෙන්ද, වාක් ද්වාරයෙන්ද, මනෝද්වාරයෙන්ද කටයුතු සිද්ධවන හෙයින් ඊට කර්‍මයයි කියා ව්‍යවහාර කරන බව දත යුතු.

සර්‍වඥයන් වහන්සේ විසින් ද **"චෙතනාහං භික්ඛවේ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා"** යි වදාරණ ලදී. මීට නිදර්ශනයක් මෙසේ දත යුතුය. දඩයම් පිණිස කැලෑවකට යන ගමනේදී සමීප පඳුරක් ළඟ සිට සාවෙක් දුවනවා දුටු දඩයම්කාරයා තුළ චේතනාව ඉදින් නැඟිට නො සිටියේ නම් දැකීම් මාත්‍රයෙන් ම අවසාන වන්නේය. චේතනාව නැඟිටියහොත් අඬ ගැසීම, කෑගැසීම, දඬුවලින් දමාගැසීම, මුගුරුවලින් දමාගැසීම, ගල්වලින් දමාගැසීම යනාදී කෘත්‍යරාශිය ද පහළවන්නේය. මේ ආදි වශයෙන් ඒ ඒ කෘත්‍යයක් පාසා චේතනාව ම ප්‍රධාන වන හෙයින් ඊට කර්‍මයයි කියා ද ව්‍යවහාර කරනු ලැබේ.

රූපධාතුන් කෙරෙහි තේජෝධාතුව ද, නාමධාතුන් කෙරෙහි චේතනාධාතුව ද යන දෙදෙන ඒ ඒ ක්‍රියාවක් පාසා සෙසු ධාතුන් පුබුදවා සොළවා හරින ප්‍රධානියෝ ය. ඒ එසේ ම ය. දුම්යන්ත්‍රවල දුනු රෝදාදියෙන් ඒ ඒ ක්‍රියාකරවීමට තේජෝ ධාතුවයයි කියන ලද ගින්න ප්‍රධාන වේ. සත්ත්වයා තුළ කායාඞ්ගයන් හා වාචාඞ්ගයන් පුබුදවා සොලවාලීමෙහි ද චේතනාධාතුව ප්‍රධාන වේ. එහෙයින් කියන ලද ගේ තැනීමෙහි ද චේතනාධාතුව ම ප්‍රධාන වූ බව දත යුතු. චිත්ත ධාතු චේතනාධාතු දෙකේ වෙනස නම්, සිත බොයිලේරුවලට දමන රටඅඟුරු හා සමානය. චේතනාව එය ඇවිලී පවත්නා ගින්න හා සමාන ය. මෙහි රට අඟුරු අනිකෙකි, ගින්න අනිකෙකි, වතුර වත්කළ විට ගින්න නිවී අඟුරු ඉතිරි වේ. නැවත ගිනි දැමුවහොත් නිවීගිය

අඟුරු ගිනි අඟුරු වේ. මෙසේම ඵස්ස, වේදනා, සඤ්ඤා, විතර්ක, විචාර, ලෝභ, ද්වේෂ, ස්මෘති, ප්‍රඥාදී නාම කායයයි කියන ලද සෙසු නාමධාතූන්ගේ ද චිත්තධාතුව කෙරෙන් වෙනස දතයුතු.

තවද සිත ලුණු, ඉඟුරු, දුරු, මිරිස් ආදී ද්‍රව්‍යයන් ගෙන වතුර හා මිශ්‍ර කිරීමෙන් සාදන ලද හොද්දේ වතුර හා සමානය. ඵස්ස, වේදනා, සංඥා, චේතනා යනාදී චෛතසික රාශිය එහි ලුණු, ඉඟුරු, දුරු, මිරිස් ආදී ද්‍රව්‍ය රස හා සමානය. බීම පිණිස හැන්දට ගන්නා ලද හොදිවල ලුණු, ඉඟුරු, දුරු, මිරිස් ආදී සියලු ම ද්‍රව්‍ය රස ඇත්තේ ය. මෙසේ පෙනි පෙනී තිබියදීත් බෙදා වෙනස් කරගන්ට නො දනිත්. ඇසට පෙණුනු පමණින් එකක්කොට ගත් නමුත් වතුරේ කෘත්‍යය අනිකෙක. ලුණුරසය අනිකෙක. ඉඟුරු රසය අනිකෙක. දුරුරසය අනිකෙක. මිරිස් රසය අනිකෙක යනාදී වශයෙන් වෙනස් වූ රස ධාතු ම වේ. මෙහි සිත වතුර හා සමානය. ඵස්ස වේදනාදී චෛතසිකයෝ ලුණු, ඉඟුරු, දුරු, මිරිස් ආදී ද්‍රව්‍ය රස හා සමානයහ. ධාතු නො දන්නා උදවිය මිරිස් හොද්ද පවා බෙදා වෙනස් කරගන්නට නො දනිති. සිත තුළ ඇතිවන ධාතු නානත්වය ගැන කියනුම කවරේද? මෙසේ චිත්තචෛතසිකයන්ගේ වෙනස දතයුතු.

මනුෂ්‍යයකුගේ තැනීමෙන් ගෘහයක් ඇති වී යයි කී තන්හි ලී දඬු ම ඒ ඒ වනාන්තරවල හටගැනීමෙන් ඇති වීයයි කියන ලද ජාතියක් ඇති ද්‍රව්‍යයෝ වෙති. ගෘහය ගැන වනාහි ඇතිවී යයි කීමට හටගැනීමයයි කියන ලද ජාතිය පවා ඇති ද්‍රව්‍යයක් නොවේ. හුදෙක් ලීදඬු එකතුකොට එක්තරා ආකාරයකින් අටවා ගත් කල්හි ගෘහයයි ව්‍යවහාර කිරීම පිණිස සිතට වැටහී එන්නාවූ සණ්ඨාන මාත්‍රයක් ම මුත් ඒකාන්තයෙන් විද්‍යමාන වස්තුවක් නොවේ මය. මෙතෙකින් ගෘහය කියා දෙයක් නැත්තේයයි කී අර්ථය ස්ඵුට විය. මෙසේ දැනීම ධාතු දන්නා පණ්ඩිතයන්ට මුත් ධාතු ගැන දැනීම තේරීම නැති අඳුරේ වාසය කරන උදවියට ඇති නොවේ. ඔවුහු වනාහි මනුෂ්‍ය සටහන හා චිත්ත චෛතසික ධර්මයන් බෙදා වෙනස් කොට දැනගන්නවා තබා ගෘහ සටහන

හා ලී දඬු බෙදා වෙනස්කර ගැන්මෙහි පවා පොහොසත් වූ ඥාණවන්තයෝ නො වෙති, ගෘහය අනිකකි, ලීදඬු අනිකකැයි කී කල්හි ද ගෘහයෙහිත් ලීදඬුවලත් තිබෙන වෙනස කුමක්දැයි ඉදින් විචාරත්නම් ගෘහය කඩා ලීදඬු වෙනමත් උළු ගඩොල් වෙනමත් රැස්කොට ගෘහය තැනීමට ගත් ලීදඬු හා උළු ගඩොල් තිබේදැයි විචාරනු, එවිට තිබේයයි උත්තර දෙනවා ඇත. ගෘහය තිබේදැයි විචාරනු. එවිට නැත කියා උත්තර දෙනවා ඇත. මෙතෙකින් ලී දඬු උළු ගඩොල් හා ගෘහ සටහනත් වෙනස්ව ගෘහය යනු හිස්වූ ප්‍රඥප්ති මාත්‍රයක් බව වැටහේමය. මතු දක්වනු ලබන යකඩපාත්‍රා නිදශීනය සමග ද සංසන්දනය කොට සණ්ඨාණ ප්‍රඥප්තිය හිස්වූ ව්‍යවහාර මාත්‍රයක් බව මනාව අවබෝධ කර ගත යුතුය. මෙසේ නාමරූප ධාතුබෙදීමෙහි නුවණැති පණ්ඩිතවරු ගෘහයයි ව්‍යවහාර කරනු ලබන ධාතු කොටස මනුෂ්‍යයකුගේ තැනීමෙන් පහළ නො වන බවද, මනුෂ්‍යයෙක්යයි කියා කෙනෙක් නැති බවද, හුදෙක් චේතනායයි කියන ලද ප්‍රත්‍යුත්පන්න කර්‍මය, ඥානය, වීය්‍ර්‍යය යන ධාතුන්ගේ බලයෙන් ලීදඬු රාශිය ගෘහයයි ව්‍යවහාරය පිණිස එක්තරා අකාරයකින් සටහනක් වී යයි කියාද, එකාන්ත සත්‍යලෙස දැනගෙන ව්‍යවහාර කරත් ම ය. ගෙය තැනූ වඩුවා විසින් ලබන ලද රුපියල් සියයක් හමාරක් කුලිය ද කවරකු විසින් දෙන ලදින් ලද්දේ දැයි විචාළ කල්හි සාමාන්‍ය ස්ත්‍රී පුරුෂයෝ ගෙය අයිතිකාරයා විසින් දෙන ලදින් ලද්දේ යයි කියා ද, මැවීම විස්වාස කරන උදවිය මැවුම්කාර දෙවියන් විසින් දෙන ලදින් ලද්දේ යයි කියා ද, හේතුඵලයෙහි දක්‍ෂ පණ්ඩිතවරු වනාහි සාමාන්‍ය ස්ත්‍රී පුරුෂයන්ගේ ව්‍යවහාරය නො ඉක්මවා ගෙය අයිතිකාරයා විසින් දෙන ලදින් ලද්දේයයි කියා ද, කායාඞ්ග හා වාචාඞ්ගයන් පුබුදවා සොලවා ඒ ඒ ක්‍රියා කරවන්නාවූ චේතනා ධාතුව ප්‍රධාන වී ගෘහය තනා අවසාන කළ නිසා කුලිය ලද්දේ යයි කියා ද කියත් ම ය. එහෙයින් ගෘහය තැනීමෙහි කායික වාචසික ක්‍රියා කරවන්නා වූ ප්‍රත්‍යුත්පන්න කර්‍මය විසින් දෙන ලදින් ඒ කුලිය ලද්දේයයි කියා ද ස්ථානයට යෝග්‍ය ලෙස කියත් ම ය. මෙහි ප්‍රත්‍යුත්පන්න කර්‍මයන් විසින් දෙන ලදින් ලද්දේ යයි

කී තන්හි ගෙය තැනීමෙහි දැනීම ඇති ඥාණය විසින් දෙන ලදින් ලද්දේ යයි කියා ද, ඒ ඥාණයට අනුව ක්‍රියා කිරීමෙහි දක්ෂ වීර්‍ය්‍යී විසින් දෙන ලදින් ලද්දේයයි කියාද කිය යුතුවේ. ඒ එසේ ම ය. චේතනාවට පසසනු කැමතිවූ විට කර්‍මය විසින් දෙන ලදින් ලද්දේයයි කියා ද, නුවණට පසසනු කැමති වූ විට ඥාණය විසින් දෙන ලදින් ලද්දේය යි කියා ද, උත්සාහයට පසසනු කැමතිවූ විට වීර්‍ය්‍යී විසින් දෙන ලදින් ලද්දේය යි කියා ද කිය යුතු වේ. එහෙයින් මුළු ජීවිතය තුළ සම්පත් ගෙන දෙන්නෝ නම් :- කර්‍මය, ඥානය, වීර්‍ය්‍යය යන මොව්හු ම ය. ගෙය අයිතිකාරයා විසින් වනාහි ඔහුගේ ගෙය තැනූ කුළිය පමණක් දෙනු ලැබේ. මෙය කර්‍මය, ඥානය, වීර්‍ය්‍යය යන මොවුන් පිළිසරණ කරගැන්ම පිණිස බුද්ධාමේ පණ්ඩිතයන්ගේ ඉගැන්වීමයි. මෙසේ ගෙය තැනීමෙහි කියන ලද නය ක්‍රමානුසාරයෙන් එකී එකී සියළු කෘත්‍යයක් පාසා කර්‍මය, ඥානය, වීර්‍ය්‍යය යන මොවුන්ගේ බලපරාක්‍රමය අවබෝධකර ගත යුතු.

දැන් යටකියන ලද පඤ්චප්‍රකාර නියාම ධර්‍මයන්ගේ බලයෙන් අවකාශ ලෝකය, සංස්කාර ලෝකය, සත්ත්ව ලෝකය යන ත්‍රිවිධ ලෝකය සම්බන්ධව ඇතිව නැතිවෙමින් පවත්නා ආකාරය සංක්ෂේප අකාරයෙන් කියනු ලැබේ. විස්තර වශයෙන් අනාදිමත්ව ඇතිව නැතිවෙමින් පවත්නා ක්‍රමය වනාහි "කල්පවර්‍ණනා" ආදී පොත්බලා දතයුතු. පඤ්චප්‍රකාර නියාමධර්‍ම යන් අතුරෙහි ඍතුනියාමය, බීජ නියාමය යන දෙදෙන අවකාශ ලෝකයට හා සංස්කාර ලෝකයට අයත් නියාම ධර්‍මයෝ ය. කර්‍ම නියාම චිත්ත නියාම දෙදෙන සත්ත්ව ලෝකයට අයත් නියාම ධර්මයෝය. ධම්ම නියාමය වනාහි ත්‍රිවිධ ලෝකයට ම අයත් නියාම ධර්‍මය වේ. රථරෝදයක් මෙන් චක්‍රවාල පර්වත රෝදයෙන් වටකරගෙන පිහිටන එක ලෝකධාතුවක් එක් අවකාශ ලෝකයක් යයි කියනු ලැබේ. ඒ අවකාශ ලෝකයක් තුළ මහපොළව මහාසමුද්‍රය සතරමහද්වීප බොහෝ කුඩා දිවයින් මධ්‍යයෙහි මහාමේරු පර්වතය, එය හාත්පස වටින් සිදන්ත

සාගර, සත්කුළුපව් යන මේ සියල්ලක් පිහිටා තිබේ. මේ අපට වාසස්ථාන වූ අවකාශ ලෝකය පිහිටා තිබෙන ආකාරයයි. මීට ම ලෝකධාතුවක් යයි කියා ද චක්‍රවාලයක් යයි කියා ද ව්‍යවහාර කරනු ලැබේ. අපේ මේ චක්‍රවාල ලෝකධාතුවට නැගෙනහිරින් බටහිරෙන් උතුරෙන් දකුණෙන් යන සතරදිගින් ද චක්‍රවාට පරම්පරාවේ අන්තිමයක් නැත්තේය. ඒ චක්‍රවාලයෝද වෙන වෙනම ධර්ම නියාම වශයෙන් දරා සිටින ධාතූන් ගේ බලයෙන් රථරෝදයක ආකාරයෙන් පිහිටා සිටිති. ඇතිව නැතිවන කාලයෙහි ද කෝටිලක්‍ෂය කෝටිලක්‍ෂය බැගින් එකට ඇතිව නැතිවී යති. ඒ චක්‍රවාලයන්ට යටින් ජලපොළොව ඊටත් යටින් වාපොළොවයයි කියන ලද ඝනවාතය ද පිහිටා තිබේ. ඒවා පොළවටත් යටින් පිහිටි අජටාකාශයයි කියන ලද ආකාසධාතුහුගේ අන්තිමයක් නැත්තේය, මහපොළොවට උඩින් පිහිටි ඝන වාතය ආධාර කරගෙන ආකාස ධාතුව තුළ වලාහපටල චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකාවෝ ද, ආකාශස්ථ විමාන ද පිහිටා සිටින්නාක් මෙන් මහපොළොවට යටින් පෘථිවි සන්ධාරක ජලස්කන්ධය ද අතිශයින් වේගවත්ව ගමන්කරන ඝනවාතය ආධාරකරගෙන පිහිටා සිටී. ඒ ඝනවාතය ද ඊටත් යටින් අනන්ත ආකාසය පැතිර පවත්නා නිශ්චල ප්‍රකෘතිවාතය ආධාර කරගෙන පිහිටා සිටී. චක්‍රවාලයන්ට උඩින් ද අජටාකාශයයි කියන ලද අනන්ත ආකාස ධාතුහුගේ අන්තිමයක් නැත්තේය. මේ මිනිස්ලොව සිට යොදුන් (7,18,56,000) පමණ උඩින් නේවසංඥා නාසංඥායතනයයි කියන ලද භවාග්‍රභූමිය ද ඊට යටින් අහස්කුසෙහි ක්‍රම ක්‍රමයෙන් බඹලෝ සහ දෙව් ලෝ ද පිහිටා තිබේ. මෙසේ වුක්තප්‍රකාර අවකාශ ලෝක ධාතුවක් කොපමණ කලක් මුළුල්ලෙහි දරා සිටී ද යත් සතරැස් ගල් පර්වතයක් මොලොක් වූ කපුපුලුන් පිඩකින් අවුරුදු සීයකට වරක් බැගින් අතුල්ලා මැදීමෙන් දීර්ඝකාලයක්හුගේ ඇවෑමෙන් ඒ ගල්පර්වතය ගෙවී අන්තිමවූවත් දැන් මේ පිහිටා තිබෙන අවකාශ ලෝකධාතුවට බඳු ලෝක ධාතුවකගේ ආයුෂය නො ගෙවේ. වරක් පහළවන මහපොළොව මහාමේරුපර්වතය ආදී අවකාශලෝක ධාතුවක් මේ සා මහත් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි දරා සිටින්නේ

වේ, නැතිවෙන කාලයෙහි ද කෝටිලක්‍ෂයක් චක්‍රවාලයෝ යට පෘථිවි සන්ධාරක ජලස්කන්ධය පටන් උඩ ප්‍රථමධ්‍යාන භූමිය දක්වා ඒ ප්‍රථම ධ්‍යාන භූමියත් සමග දා විනාශ වන්නේ ය. මේ කල්පයාගේ සංක්‍ෂේපයෙන් ඇතිව නැතිවන ක්‍රමයයි.

දැන් විස්තර ක්‍රමය කියනු ලැබේ. **සංවත්, සංවත්ස්ථායි, විවත් විවත්ස්ථායි** යයි කියා කල්පය සිව් වැදෑරුම් වේ. එහි නැතිවෙමින් පවතින කාලය සංවත් කල්පය වේ. පරමාණුවක් පමණකුදු සංස්කාරයකුගේ පහළවීමක්වත් දරා සිටීමක්වත් නැතිව නැතිවූ පරිද්දෙන් හිස්ව පවතින කාලය සංවත්ස්ථායි කල්පය වේ. ඒ ඒ සංස්කාර ද්‍රව්‍ය ඇතිව වැඩෙමින් පවතින කාලය විවර්ත කල්පය වේ. මහපොළොව මහාමේරු පර්වතය ආදී. අවකාශ ලෝක ද්‍රව්‍ය වැඩුණු පරිද්දෙන් පවතින කාලය විවත්ස්ථායි කල්පය වේ. මෙම කල්ප සතර අතුරෙන් එකි එකී කල්පයක් කියන ලද පර්වතයට බඳු ආයුඃ ප්‍රමාණයෙන් යුක්තය. සතර ම එකතු කොට ඊට මහා කල්පයයි කියා ව්‍යවහාර කරනු ලැබේ.

දැන් මේ කල්ප සතරේ විස්තර වෙන වෙන ම කියනු ලැබේ. ලක්‍ෂය බැලින් ඒකරාසීව පිහිටන අවකාශලෝක සංඛ්‍යාත මේ චක්‍රාවාලයෝ කුමන ධාතුවකගේ බලයෙන් පිහිටත් ද? කුමන ධාතුවකගේ බලයෙන් නැසීයත් ද යනු ප්‍රශ්නයි. ඍතුයයි කියන ලද තේජෝගින්නේ බලයෙන් පිහිටති. ඍතුයයි කියන ලද තේජෝගින්නේ ම බලයෙන් නැසීයති. එයින් නැසීයන ක්‍රමය පළමුකොට කියනු ලැබේ. දැන් මේ පිහිටා තිබෙන කල්පය කියන ලද පර්වතයට බඳු කාලසීමාව බොහෝ දීර්ඝ කාලයකගේ ඇවෑමෙන් ගෙවී ගියවිට ගින්නෙන් දා නැසෙන්නේය. ඒ එසේමය. මේ මහපොළාව චක්‍රවාල පර්වත සප්තකූටපර්වත මහාමේරු පර්වතාදී සියළු අවකාශ ලෝකද්‍රව්‍ය සම්භාරයෝ ක්‍රම ක්‍රමයෙන් නො දැනුවැත්තේ ම මුහුකිරීමෙන් ජරාජීර්ණව පොත්තයයි කියන ලද තවධාතු ද එලේයයි කියන ලද එග්ගුධාතු ද නැසීගොස් අරටුවයයි කියන ලද ධාතුහරය ම ශේෂ වේ. ඒ ධාතුහරවලත් දුර්වල දුර්වල කොටස් මුහු කිරීමෙන් ජරාජීර්ණව නැසී ගොස්

ගිතෙල්පිඩක් වෙඩිලුණු ගෙන්දගම් පිඩක් මෙන් ගින්නට හිතවූ පංසු පෘථිවි ශ්ලේෂයෝ ම ශේෂවී යත්. එහෙයින් කල්ප විනාශක ගින්න තෙල් පිඩකට ගිතෙල් පිඩකට ඇවිලී පත්තුවෙන ගින්නක් හා උපමා කොට දක්වන ලද්දේය. මෙසේ දීර්ඝ කාලයකගේ අවෑමෙන් මුහුකුරා ජරාජීණීව නැසීයාම කිසිම මැවුම්කාරයකු විසින් මැවිය හැකි ක්‍රියාවක් නොවේ ම ය. මුහුකරවීම පිණිස දිරවීම පිණිස කරවන කතෘකෙනෙක් නැත්නම් මුහුකළ නො හැක්කේය. දිරිය නො හැක්කේයයි කියා ද නැත්තේ ම ය. හුදෙක් ධර්‍මනියාම වශයෙන් සියළු ලෝදායෙහි ව්‍යාප්තව අතිශයින් ප්‍රකට වී තිබෙන ධර්මතාවයකි.

මෙසේ මේ මහපොළොව මහාමේරුපර්වත සප්තකූට පර්වත චක්‍රවාල පර්වත යන සියල්ල ම මුහුකිරීමෙන් ජරාජීර්ණව කල්ප විනාශක ගින්න පහළවන කාලයෙහි කෝටිලක්‍ෂයක් සක්වළ මහත් තදින් වර්‍ෂාවක් වසී. ඊට කල්ප විනාශක වර්‍ෂාවයයි කියනු ලැබේ. ඉන් ඔබ්බෙහි වැසි නො වැස අවුරුදු ලක්‍ෂයක් පමණ ගතවූ කල පිළිවෙලින් සප්ත සූර්‍ය්‍යකෙනෙක් පහළවෙති. කෝටිලක්‍ෂයක් සක්වළ කෝටිහත්ලක්‍ෂයක් සූර්‍ය්‍යයෝ පහළ වෙති. ඒ එසේමය. මේසා මහත් විශාලව මේසා මහත් දීර්‍ඝකාලයක් මුළුල්ලෙහි පවතින්නාවූ ධාතු පුඤ්ජයෙහි මහත් විශාල ලෙස ධාතූන්ගේ විපර්‍ය්‍යාෂයට හේතු වූ ධර්‍මයෝ ද ධාතුපුඤ්ජයාගේ විශාලත්වය නිසා දීර්‍ඝ කාලයක් මුළුල්ලෙහි පැවතීමෙන් ම සම්පාදනය වන්නාහුය.

යට කියන ලද ක්‍රමයෙන් පහළ වන්නාවූ සූර්‍ය්‍යවිමාණයෝ ද, කල්ප විනාශ ගින්නවනු කැමති නම් කල්ප විනාශ ගින්න ද, කල්ප විනාශ ජලයවනු කැමති නම් කල්ප විනාශ ජලය ද, කල්ප විනාශ වාතයවනු කැමති නම් කල්ප විනාශ වාතය ද විය හැක්කෝ ම ය. එහෙයින් මැවුම්කාරයකු සොයා වෙහෙසීම උවමනා නොවේ ම ය. ඥානශක්තිය මඳවී නම් මැවුම්කාරයකු විසින් මවන ලද්දේයයි කල්පනාව විපරීත විය හැකිය. එහෙයින් එසේ නො ගෙන මෙම ලෝක විනාශය මෙකල

බටහිර එරෝපාදි රටවල කලින් කල ගිනිකඳු ඇතිවීමෙන්ද, තද වෂීා ඇතිවීමෙන්ද, මුහුද ගොඩ ගැලීමෙන්ද, තද සුලන් කුණාටු ඇතිවීමෙන්ද, පොළොව කිඳාබැසීමෙන්ද ගම් නියම් ගම් රාජධානී විනාශවන්නාක් මෙන් දත යුතු. මෙසේ සප්ත සූයෝ්‍යද්ගමනයකින් කල්ප විනාශය වන බව සර්වඥයන්වහන්සේ විසින් අඞ්ගුත්තර නිකාය සප්තක නිපාතයෙහි වදාරන ලදී. මෙසේ කල්ප විනාශ ගින්නෙන් දා විනාශවීමෙහි කෝටි ලක්‍ෂයක් චක්‍රවාලයෝ ඇතුළත් වන්නාහුය. කෝටිලක්‍ෂයක් චක්‍රවාලයන්හි යට කියන ලද කල්ප සන්ධාරක ජලසීමාව පටන් දෙලක්‍ෂ සතළිස්දහසක් ඝන වූ පස් පොළෝ හා ගල්පොළෝ ද චක්‍රවාල සප්තකූට පර්වතයෝ හා මහා මේරුපර්වතයෝ ද දා විනාශ වන්නාහුය. මේ මිනිස් ලොව සිට යොදුන් සාරලක්‍ෂයකට පමණ උඩින් පිහිටි ප්‍රථමධ්‍යාන භූමිය දක්වා අහස් කුස පිහිටා සිටි සියළු සංස්කාර ධර්මයෝ කල්පවිනාශ ගින්නට ආහාර වන්නාහුය. ඒ අහස්කුස ගින්නට ආහාර වූ අණුරේණුවකුදු සංස්කාරයෙක් ඉතුරු නොවී දා විනාශ වූ කල්හි ම ගිනි අඟුරු ගිනි දූල් සියල්ලක් අන්තර්ධාන වන්නේය. ගින්න වනාහි ලා අවස්ථා, මුහු කළ අවස්ථා, දූල් අවස්ථා යයි කියා තෙවැදෑරුම් වේ. ඍතු අවස්ථා, ගිනියම් අවස්ථා, ගිණිදූල් අවස්ථා යයි කියා ද කිය යුතු වේ. එයින් ඒ ඒ ද්‍රව්‍යයෙහි ගිනියම් වීමට පළමු දරාසිටින ඍතුවයයි කියන ලද ගිනිබීජ රාශිය ලාගින්න නම් වේ. ඒ ඒ ද්‍රව්‍යයෙහි ගිනියම් වූ ගින්න මුහුකළ ගින්න නම් වේ. ඒ ඒ ද්‍රව්‍යයෙහි ම ඇවිලී පවතින ගින්න දූල් ගින්න නම් වේ. ගින්නට ආහාරයයි කියා අබ ඇටයක් පමණවත් යමක් ඉතුරු නොවී දාගිය විට ගිනියම් ගින්න හා දූල් ගින්නත් නිරවශේෂයෙන් අතුරුදන් වෙයි. ඍතුයයි කියන ලද ගිනි බීජරාශිය ම කල්පවිනාශ ගින්නෙන් දා ගියා වූ අහස්කුස කියන ලද පර්වතයට බඳු දීර්ඝකාලයක් මුළුල්ලෙහි ශේෂව පිරී පවත්නේය.

**සංවර්ත කල්පය නිමි.**

යථෝක්තාකාර අහස්කුස පිරී පවත්නා වූ ඍතු බීජයෝ නොයෙක් ලෙස විශේෂ විශාල ලක්‍ෂණයෙන් යුක්ත වූවාහු වෙති. ඒ එසේමය. යට ශෛලපෘථිවිය දැවූ ගින්න කෙරෙන් ශේෂ වූ ඍතු බීජයෝ නැවත ඒ ස්ථානයෙහි ශෛලපෘථිවිය පහළවීමට කාරණ වූ ශෛලපෘථිවි බීජභාවයෙන් ශේෂ වූවාහු වෙති. එසේ ම චක්‍රවාලපර්වතය දැවූ ගින්න කෙරෙන් ශේෂ වූ ඍතුබීජයෝ නැවත ඒ ස්ථානයෙහි චක්‍රවාලපවර්තය පහළ වීමට කාරණා වූ චක්‍රවාලපර්වත බීජ භාවයෙන් ශේෂ වූවාහු වෙති. සප්තකූටපර්වත දැවූ ගින්න කෙරෙන් ශේෂ වූ ඍතු බීජයෝ නැවත ඒ ස්ථානයෙහි සප්තකූටපර්වත පහළ වීමට කාරණ වූ සප්තකූට පර්වත බීජභාවයෙන් ශේෂ වූවාහු වෙති. මහාමේරු පර්වතය දැවූ ගින්න කෙරෙන් ශේෂවූ ඍතුබීජයෝ නැවත ඒ ස්ථානයෙහි මහාමේරුපර්වතය පහළවීමට කාරණවූ මහාමේරුපර්වත බීජ භාවයෙන් ශේෂ වූවාහු වෙති. පාංසුපෘථිවිය දැවූ ගින්න කෙරෙන් ශේෂ වූ ඍතුබීජයෝ නැවත ඒ ස්ථානයෙහි පාංසුපෘථිවිය පහළවීමට කාරණා වූ පාංසුපෘථිවි බීජ භාවයෙන් ශේෂ වූවාහු වෙති. චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකාවන් හා ඒ ඒ දිව්‍යලෝක දිව්‍යවිමාණ බ්‍රහ්මලෝක බ්‍රහ්මවිමාණයන් දැවූ ගින්න කෙරෙන් ශේෂ වූ ඍතු බීජයෝ නැවත ඒ ඒ ස්ථානයන්හි චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකා හා දිව්‍ය ලෝක දිව්‍ය විමාන බ්‍රහ්මලෝක බ්‍රහ්ම විමානත් පහළවීමට කාරණ වූ චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍රාදී බීජභාවයෙන් ශේෂ වූවාහු වෙති. අහස්කුස පිරී පවතින්නා වූ ඒ ඍතුබීජරාශිය ද ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී බොහෝ කාලයකගේ ඇවෑමෙන් වර්ෂාපටල වර්‍ෂාධාතු වර්‍ෂාඍතු වර්‍ෂාරාශි භාවයට පැමිණ කියන ලද පර්වතයට බඳු දීර්‍ඝකාලයක් මුළුල්ලේ පවත්නේය.

## සංවර්තස්ථායි කල්පය නිමි.

කල්පය පිහිටීම යයි කියන ලද විවර්ත කල්පය පටන් ගැන්මෙහි වර්‍ෂාපටල වර්‍ෂාධාතු වර්‍ෂාඍතු වර්‍ෂාරාශි භාවයෙන්

දරා සිටි ඒ සත්‍ව බීජවලින් පළමුකොට මඳ මඳ වෂීා පටන් ගනී. එකල්හි සංවත්‍ස්ථායි කල්පයාගේ අර්ධයක පමණ පටන් වාතයතෙම උණුසුම් ස්පර්ශය නො ලැබීමෙන් අතිශයින් අධික ශීතලභාවයෙනුත් අධික ශීතල භාවයට පැමිණේ. එහෙයින් ඒ වාතයෙන් ස්පර්ශවන්නා වූ වර්ෂා ජලය වර්ෂා ධාතුහු බහුල වශයෙන් පාන්වර්ෂා අයිස්වර්ෂා වී වෂීාකරත්. කල් යත් යත් සියක් යොදුන් දහස් යොදුන් ප්‍රමාණ වී වෂීා කරත්. ප්‍රථම ධ්‍යාන භූමිය දක්වා පාන් වැසි අයිස් වැසි වලින් පිරෙති. චක්‍රවාල කෝටිලක්ෂයක් ලුණු ලේවායක් මෙන් මිදුණු ජලයෙන් එක ම තලාවක් වන්නේය. ඒ මිදුණු ජලය හා ස්පර්ශවීමෙන් යට යට ජලය ද ක්‍රම ක්‍රමයෙන් මිදීයන්නේය. ඒ ජලතලායෙන් පිටතට නික්මෙන්නා වූ වාතයතෙම ජලය වටකරගෙන සිටින්නේය. වර්ෂාව නො වැස නැවතුන කල්හි ඒ අයිස් ජලතලාව ක්‍රම ක්‍රමයෙන් බසින්නේය. අයිස් ජලය වැඩෙන්නට වැඩෙන්නට යට කල්පසන්ධාරක සුලඟින් ඉසිලිය නොහී අධික ජලයතෙම යට අවකාශයට බැස ගනී. මහා පෘථිවිය පිහිටි තැනට බැසගත් විට කල්පසන්ධාරක වාතයතෙම ස්වකීය වේගයෙන් උසුලා සිටින්නේය. මිදීගිය ඒ ජලස්කන්ධය ක්‍රම ක්‍රමයෙන් බැසීමෙහි ඒ ඒ තන්හි දරා සිටී. සත්‍ව බීජ විශේෂයන්ගේ බලයෙන් බ්‍රහ්මලෝක පිහිටි තැන්වල බ්‍රහ්ම ලෝක ද, දෙවුලෝ පිහිටි තැන්වල දෙවුලෝ ද, මහාමේරු පර්වත පිහිටි තැන්වල මහාමේරු පර්වත ද, චක්‍රවාල පර්වත පිහිටි තැන්වල චක්‍රවාල පර්වත ද සප්තකුට පර්වත පිහිටි තැන්වල සප්තකුට පර්වත ද පාංසු පෘථිවි පිහිටි තැන්වල පාංසු පෘථිවි ද, සිලාපෘථිවි පිහිටි තැන් වල සිලා පෘථිවි ද, සීදන්තසාගර පිහිටි තැන්වල සීදන්තසාගරද පහළවෙති. චන්ද්‍ර සූර්යය නක්ෂත්‍ර තාරකාවෝ පහළ වී මිහිදුමෙන් වැසී පවතී. එසේ නක්ෂත්‍ර තාරකා භූමිවිමාණ වූ ස්වර්ණ රජතමය වස්තූහු අතිශයින් බොහෝය. ඒ සියල්ලක් ම මේ මහපොළවට උඩින් අහස්කුස අචඤ්චල ඝනවාතය ආධාර කොටගෙන දරා සිටී. පක්ෂීහු අහස්කුස ඒ වාතය පියාපතින් ගෙන පියාසර කරති. මහාමේරු පර්වත සප්තකුට පර්වතයන් කෙරෙන් පිටට නික්මෙන

වාතය හා චක්‍රවාල පර්වතයාගේ ඇතුළතින් නික්මෙන වාතය ද එකට සඝට්ටණය වීමෙන් මහාමේරු පර්වතරාජයා හාත්පස මැදිකොටගෙන චක්‍රවාල පර්වත රෝදය වටින් දකුණට කරකැවී වාත සුලියක්ව අතිශය මහත් වේගයෙන් අහසට නැගී සිටී. ඒ වාතසුලියේ වේගයෙන් චන්ද්‍ර සූර්‍ය්‍ය නක්ෂත්‍ර තාරකාවෝ නිතර තල්ලුවී ගමන් කරති. ඔවුහු බර ලැහැල්ලු අන්දමේ සැටියට ගමනින් පෙර පසුවී යති. මතු මතු බඹ තල වලින් සැව අවුත් ඕපපාතික ප්‍රතිසන්ධියෙන් මේ මහපොළොව පහළවන්නට පළමු ජලතලාමතුයෙහි උපදනාවූ බ්‍රහ්මයන්ට බඳුවූ ආදිකල්පික මනුෂ්‍යයෝ තම තමන්ගේ ශරීරාලෝකයෙන් යාම ඊම ඉඳීම හිටීම යන සතර ඉරියව්වෙන් යුක්තව අහස්කුස වාසය කරති. කල්යත් යත් මහපොළොව පහළවන්ට පටන් ගැන්මෙහිදී ජලතලා මතුයෙහි ඇතිවන්නා වූ **පප්පටකෝජාව** අනුභව කිරීමෙන් ඒ ආදි කල්පික මනුෂ්‍යයෝ ස්වකීය ශරීරාලෝකය අතුරුදන්වී ගොස් චන්ද්‍ර සූර්යයන් ප්‍රාර්ථනා කරති. එකල මිහිදුමෙන් වැසී සිටි චන්ද්‍ර සූර්‍ය්‍ය නක්ෂත්‍ර තාරකාවෝ උද්දීපතිමත්ව බැබලෙති.

මේ විවත්තකල්ප කථායෙහි අධික සිහිල් වාතයෙන් ස්පර්ශ වූ ජලය මිදෙන්නේ යයි කී තන්හි මෙකල මේ භූමණ්ඩලයෙහි සමහර රටවල මහත් පාන්වර්ෂා අයිස්වර්ෂා ඇතිවීමෙන් මනුෂ්‍ය ගවමහිෂයන්ට පවා ගෙවල් දොරවල් පල්ලි ආදියට පවා අන්තරා පැමිණෙන බවද, හේමන්ත ඍතුවෙහි හිමවත්පෙදෙස කඳුකරවල අහසින් වැටෙන මිහිදුම්ජලය අතිශයින් සිහිල් වාතස්පර්ශය නිසා මිදෙන බවද, දඹදිව උතුරු දිග පළාත්වල අතිශයින් සිහිල් වාත ස්පර්ශය නිසා සාගර ජලය මිදී ඔරු පාරු නැව්හම්බන් යාත්‍රා නො කරන බවද, එසේ ම රුසියාවේ ගංගා ඇලදොලවල් අතිශයින් සිහිල් වූ වාත ස්පර්ශයෙන් මිදෙන නිසා ඔරු පාරු නැව් හම්බන් යාත්‍රා නො කරන බවද, අප ලක්දිව ශ්‍රීපාද අඩවිය නුවරඑළිය ආදී පළාත්වල අතිශයින් සිහිල් වාත ස්පර්ශයෙන් මිහිදුම් ජලය මිදෙන බවද නිදර්ශන කළ යුතු. අයිස් සාදන පැණවතුන් සමග ද සංසන්දනය කළයුතු. දැන් මේ කියා නිමවන ලද මිදුණු මිහිදුම්

ජලය උණුසුම් වාතයෙන් හා අව්වෙන් සපර්ශවන බැවින් නොබෝ වේලාවකින් ම දියවී යන්නේය. මිදුණු කල්ප සම්පාදක ජලතලාව වනාහි සංවත්ත්ස්ථායි කල්පයාගේ අධ්‍යක පටන් විවත්තකල්පය මුළුල්ලෙහි උණුසුම් වාතයෙන් හා අව්වෙන් ස්පර්ශවීමක් නැති හෙයින් ස්ථද්ධ භාවයෙනුත් ස්ථද්ධ භාවයට ම පැමිණෙන්නේය.

## විවත්ත කල්පය නිමි.

මෙසේ මහාමේරුපර්වත සප්තකූටපර්වත චක්‍රවාල පර්වතාදී ද්‍රව්‍ය සම්භාර සම්පූර්ණවූ තැන්පටන් නැවත කල්ප විනාශය පිණිස වසින වර්ෂාව දක්වා පිහිටන අවකාශ ලෝකධාතුවක්, කියන ලද පර්වතයට බඳු දීර්ඝකාලයක් මුළුල්ලෙහි පිහිටා සිටින්නේය. සංයුත්ත නිකාය අනමතග්ග සංයුත්ත වේපුල්ල සූත්‍රයෙහි මේ කල්පයෙහි පහළ වූ බුදුවරයන් වහන්සේලා පස්නම අතුරෙන් එකනමකට එකනමක් අතර මහපොළොව යොදුන බැගින් වැඩෙන බව හා වේපුල්ල පර්වතය යොදුන බැගින් මහපොළවට යටවී යන බවත් වදාළ හෙයින් අතුරු කපක් තුළ පස් පොළොව යොදුනක් වැඩෙන බව දත යුතු. අතුරුකපෙක් නම් කල්පය මුලදී මනුෂ්‍යයෝ අසංඛ්‍යයක් අවුරුදු මුළුල්ලෙහි ජීවත් වෙති. ඔවුන්ට පාරමායුෂය අවුරුදු අසංඛ්‍යයකි. ඒ අසංඛ්‍යායුෂය ක්‍රමයෙන් පිරිහීගොස් දස අවුරුද්දට පැමිණේ. නැවත දස අවුරුද්ද පටන් වැඩී අසංඛ්‍යයට පැමිණේ. මෙසේ අසංඛ්‍යය පටන් දස අවුරුද්දට දසඅවුරුද්ද පටන් අසංඛ්‍යයට පැමිණෙන කාලය අතුරුකපෙක්යයි කියනු ලැබේ.

දැන් මේ පවතින විවත්තස්ථායි අසංඛ්‍යකල්පය සිවුසැට අතුරු කපකට බෙදෙන්නේය. එයින් පළමුවෙනි අතුරුකපේදී කකුසඳ බුදුන් ද, දෙවෙනි අතුරුකපේදී කෝණාගම බුදුන් ද, තෙවෙනි අතුරුකපේදී කසුප් බුදුන් ද, සතරවෙනි අතුරුකපේදී ගෞතම බුදුන් ද පහළ වූහ. ලබන පස්වෙනි අතුරුකපේදී මෛත්‍රී බුදුන්

පහළ වන්නාහුය. ඉතුරු එකුන්සැටක් අතුරුකප් බුද්ධශූන්‍යව ගත වන්නාහුය.

## විවත්තිස්ථායී කල්පය නිමි.

විවත්තිස්ථායි කල්පය මේසා මහත් විශාලව පහළ වන්නේ නැවත කල්ප විනාශ ගින්න විශාලව පහළ වීම පිණිසය. එහෙයින් කල්ප විනාශ ගින්න විශාලව මවා පාන්නා වූ මැවුම්කාරයෙක් ගැන සොයා පරීක්ෂා කිරීම උවමනා නොවේ ම ය. කල්ප විනාශ ගින්න විශාලව පහළ වන්නේ නැවත කල්පය පහළවීමට කාරණාවූ ඍතු බීජ විශාලව ඇතිවීම පිණිසය, එහෙයින් මවාපාන්නා වූ මැවුම්කාරයෙක් ගැන සොයා පරීක්ෂාකිරීම උවමනා නොවේ ම ය. ඍතුබීජ විශාලව ඇතිවන්නේ කල්ප සම්පාදක වෂීාව විශාලව පහළ වීම පිණිසය. එහෙයින් කල්ප සම්පාදක වෂීාව විශාලව මවාපාන්නා වූ මැවුම්කාරයෙක් ගැන සොයා පරීක්ෂා කිරීම උවමනා නොවේ ම ය. කල්ප සම්පාදක වෂීාව විශාලව පහළවන්නේ මහපොළොව මහමෙර ආදී අවකාශලෝකය විශාල ලෙස පහළවීම පිණිසය. එහෙයින් මේ අවකාශලෝකධාතුව මවාපාන්නා වූ මැවුම්කාරයෙක් ගැන සොයා පරීක්ෂා කිරීම උවමනා නොවේ ම ය. අවකාශ ලෝකධාතුව විශාලව පහළවී දරා සිටින්නේ නැවත කල්පවිනාශ ගින්න විශාලව පහළවීම පිණිසය. එහෙයින් මවාපාන්නා වූ මැවුම්කාරයෙක් ගැන සොයා පරීක්ෂා කිරීම උවමනා නො කරනවා පමණක් නොව මැවුම් කාර දෙවිවරු ලක්ෂයකගේ කෝටියකගේ වීයඝීයෙනුත් වලක්වා ලිය නොහැකි වූ අතිශයින් විශාල ධර්ම නියාමයාගේ බලයෙන් ම අක්මුල් නැති අනවරාග්‍ර සංසාරය මුළුල්ලෙහි හේතුඵල සම්බන්ධයෙන් කල්ප පරම්පරාව නො සිඳී පවත්නා බව ද දත යුතු ම ය.

## අවකාශලෝකය නිමි.

මුල් බීජය, කඳු බීජය, පුරුක්බීජය, අක්බීජය, බීජ බීජය යන පඤ්චප්‍රකාර බීජයෙන් පැලවෙන්නාවූ සංස්කාරලෝකයයි කියන ලද අඹ දඹ තල් කිතුල් බට තෘණ සාලි වීහි ආදී වෘක්ෂලතා සමූහය බීජනියාම ඍතුනියාම බලයෙන් පහළවී වැඩෙන ක්‍රමය කියනු ලැබේ. ලෝක ව්‍යවහාරයෙන් බීජය නම් කියන ලද මුල්, කඳු, පුරුක්, අක්, බීජ බීජ යන පසය. ධාතු දේශනාව වූ අභිධර්ම ක්‍රමයෙන් වනාහි එක ම මුල්බීජය තුළ පෘථිවි,ආපෝ, තේජෝ,වායෝ,වර්ණ, ගන්ධ, රස, ඕජා යයි කියා ධාතු අටක් තිබේ. ඒ ධාතු අටදෙන අතුරෙන් අඞ්කුරය හටගැන්මට හෙවත් පැලවීමට කාරණා වූ හෙයින් තේජෝධාතුව ම ඒකාන්තයෙන් බීජය වේ. ඉතුරු පෘථිවි ආදී ධාතු සත අඞ්කුරය නිපදවීමට ශක්තියක් නැති හෙයින් ඒකාන්තයෙන් බීජ නොවෙත් ම ය. හුදෙක් ඍතුසඞ්ඛ්‍යාත තේජෝ ධාතු බීජයාගේ පරිවාර ධාතුහු ම වෙති. ඉතුරු කඳු, පුරුක්, අක්, බීජ බීජද මෙසේ බෙදා අවබෝධ කරගත යුතු. අඹගස කුමකින් පැලවී හටගත්තේදැයි විචාළවිට ධාතුවිශේෂ නොදත් සාමාන්‍ය මහජනයාගේ මතයෙන් අඹබීජයෙන් පැලවී හටගත්තේයයි විසඳිය යුතු. අභිධර්ම ධාතු දත් පණ්ඩිතයන්ගේ මතයෙන් අඹගස අඹබීජයෙහි තිබෙන තේජෝධාතු සඞ්ඛ්‍යාත ඍතු බීජයෙන් පැලවී හටගත්තේ යයි විසඳිය යුතු. සාමාන්‍ය මහජනතෙම අභිධර්මධාතු චක්ෂුව නොලත් හෙයින් තම තමන්ගේ ඇසට පෙනෙන ආකාරය ම ගෙන විසඳති. (F,A) (B,A) ආදී ධාතු ශාස්ත්‍රඥයෝ සහ අප බුද්ධාගමේ අභිධර්ම පණ්ඩිතයෝ වූ කලී අඹ බීජය තුළ කෙතෙක් ධාතු තිබේද යනු ධාතුචක්ෂුසින් දකිති. අඹ බීජය තුළ හපගතිය පෘථිවි ධාතුය. යූෂ ගතිය ආපෝ ධාතුය. ද්විප්‍රකාර උණු සිහිල් ගතිය තේජෝ ධාතුය. තල්ලුවී පවතින විෂ්ටම්භන ගතිය වායෝ ධාතුය. වර්ණය වර්ණධාතුය. ගන්ධය ගන්ධ ධාතුය. රසය රසධාතුය. ශ්ලෙෂගතිය ඕජාධාතුය. මෙසේ ධාතු අට වෙන් වශයෙන් ඥාණචක්ෂුසින් දුටු කල්හි අඹ බීජයයි කියා නැති බව මනාව වැටහේ. එසේ ම ධාතු අට ඥාණචක්ෂුසින් දුටුකල්හි අඹගසයයි කියා නැති බව ද මනාව වැටහේ ම ය, මෙසේ හුදකලාව ධාතු රැසක් ම පෙනීයන්නේය.

ඉතුරු බීජයන්හි සහ වෘක්‍ෂලතාවන්හි ද මෙසේ ම ධාතු අට වෙන් වශයෙන් බෙදා අවබෝධ කරගත යුතු. ධාතුචක්‍ෂුව ධාතුඥානය නැති අයගේ මතයෙන් අඹගස් අඹ බීජයෙන් පැලවී හටගනිත්යයි කියා දැනට තිබෙන අඹගස් ගැන නම් කියහැකි වේ, කල්පය පටන් ගැන්මෙහි පළමුකොට ඇතිවූ අඹගස් ගැන අඹ බීජයෙන් පැලවී හටගත්තාහුයයි කිය නො හැක්කේ ම ය, කුමක්හෙයින් ද යත්, කල්පය පටන් ගැන්මෙහිදී අඹ බීජ නො තිබුණු හෙයිනි, එහෙයින් මෙහිදී ධාතු චක්‍ෂුව ධාතු ඥානය නො ලත් අයවී නම් කිසිවක් කිය නොහැකි යයි කියාද මැවීම විශ්වාස කරන අය වී නම් මැවුම්කාර දෙවියන් විසින් මවන ලද්දාහුයයි කියා ද කියනවා ඇත, ධාතුඥානය ධාතුචක්‍ෂුව උපදවාගත් පණ්ඩිතයෝ වනාහි ධාතුචක්‍ෂුසින් ධාතු අට දැක බෙදා බලා ඒකාන්තයෙන් දැනට තිබෙන අඹගස් පවා අඹ බීජයෙන් පැලවී හටගත්තා නොව අඹ බීජය තුළ තිබෙන ධාතු අටදෙන අතුරෙන් ඍතුබීජ යයි කියන ලද තේජෝ ධාතුවෙන් ම පැලවී හටගත්තාහුයයි කියත් ම ය, ඒ තේජෝගින්න ද කල්පය සෑදෙන්නට පළමු කල්පය පහළවීමට හේතුවූ ඍතුව තුළම අඹගස් පහළවීමට හේතුවූ අඹ ඍතුව වශයෙන් ද, දඹ ගස් පහළවීමට හේතුවූ දඹඍතුව වශයෙන් ද, පොල්ගස් පහළවීමට හේතුවූ පොල්ඍතුව වශයෙන් ද, පුවක් ගස් පහළවීමට හේතුවූ පුවක්ඍතුව වශයෙන් ද, එසේම ඒ ඒ වෘක්‍ෂලතා පහළවීමට හේතු වූ ඒ ඒ වෘක්‍ෂලතා ඍතුවශයෙන් ද වෙන වෙන ම දරා සිටියාහු වෙති. අතිශයින් ම සූක්‍ෂම වූ ධාතු ඍතු විශේෂයකි, ඒ ධාතු ඍතු විශේෂය නිල්වණී වෘක්‍ෂලතා පහළවීමට බීජවූ හෙයින් හරිත තේජෝධාතුයයි ව්‍යවහාර කරනු ලැබේ. ඒ හරිත තේජෝධාතු විශේෂය ම වෘක්‍ෂලතා පැලවී හටගැන්මට ඒකාන්තයෙන් බීජවෙයි, එහෙයින් කල්පය පළමුකොට පහළවී මෙහි අඹ බීජ නැතිවූ නමුත් අඹගස් ඇතිවිය හැකි වේ, දඹ බීජ නැතිවූ නමුත් දඹගස් ඇතිවිය හැකි වේ. පොල් බීජ නැතිවූ නමුත් පොල් ගස් ඇතිවිය හැකි වේ, පුවක් බීජ නැතිවූ නමුත් පුවක්ගස් ඇතිවිය හැකි වේ. ඒ ඒ බීජජාති නැතිවූ නමුත් ඒ ඒ වෘක්‍ෂලතා ඇතිවිය හැකිවේ ම යයි මෙසේ විසඳත්

ම ය, ඒ හරිත තේජෝධාතු විශේෂයෝ ද ආදි කල්පකාලයෙන් පසු පෘථිවිරස ආපෝරස පිරිහීමෙන් සමහර ගස් වල මුලේ ද සමහර ගස්වල කඳේ ද සමහර ගස්වල පුරුකේ ද සමහර ගස්වල දලුවේ ද රඳාගත්හ. ඒ එසේමය. අඹ දඹ ආදී වෘක්ෂලතාවෝ බීජ බීජයෙන් හටගනිති, ඊට නිදර්ශනයක් නම් පෙර ගිනි ගල්ගැමෙන් ගින්න ලබා ගත්තුය, මෙකල වනාහි ඒ ගල්වර්ග යෙන් ගිනි ඇවිලීමට හේතුවූ ධාතු යුෂ උපුටාගෙන තනන ලද ගිනිකූරුවල ගිනිබීජ රඳාගත් හෙයින් ඒ ගිනිකූරු ගැමෙන් ගිනි ඇවිලගන්නාක් මෙනි. මෙහි අඹ දඹ ආදී වෘක්ෂලතා පැලවී හටගැන්මට හේතුවූ සියළු බීජ වර්ග ගිනි කූරු අග තිබෙන වෙඩිබෙහෙත් ගුලි හා සමානය. අඹ දඹ ආදී වෘක්ෂලතාවෝ එය ගිනිපෙට්ටියේ දැල ගැමෙන් ඇවිලී හටගන්නාවූ ගිනිදැල්ල හා සමානය, එහෙයින් පෘථිවි ආපෝ තේජෝ වායෝ යන සතරමහ ධාතූන් අතුරෙන් තේජෝධාතු ගින්න ම වෘක්ෂලතා නමැති ගිනිදැල්ල උපදවන්නේය. ඉතුරු තිදෙන ඊට අනුබල දෙන උපස්ථම්භ ධාතු ම වෙති, තවද මේ තේජෝධාතුගින්න සත්ත්වයන් අතර මැණිවරු හා සමානය, වෘක්ෂලතාවෝ පුත්‍ර දුහිතෘන් හා සමානය. යථෝක්ත බීජවර්ග පැලවී හටගන්නා විට ද අඞ්කුර ගස් අතු රිකිලි කොළ දළු කැකුළු මල් ගෙඩි ඇට මද සිවි පොතු එලේ හර වර්ණ ගන්ධ රස යනාදී සියල්ල බීජනියාම ධර්මයට යටහත්ව ම පහළ වන්නේය, එහෙයින් ඒ සියල්ල ද බීජයාගේ ජාතියට ගතියට අනුව ම හටගනී, ඒ එසේමය. අඹ බීජයක් රෝපනය කිරීමෙන් අඞ්කුරය හටගන්නා කල්හි පූර්ව පූර්ව අඹගස්වල අඞ්කුරයට බඳුව සටහනින් යුක්තව ම හටගනී, දඹ පොල් පුවක් ආදී වෘක්ෂයන්ගේ අඞ්කුරයන්ට බඳු අන්ආකාරයකින් හටනොගනී ම ය, ගස් අතු රිකිලි කොළ දළු ආදිය ද එසේ ම ය. සමහර ගස්වල මෙම බීජ නියාම බලයෙන් විසිතුරුව හටගන්නා ගස් අතු රිකිලි ආදී සටහන් චිත්‍රකාර්මිකයන්ට අඳින්නට පවා දුෂ්කර වූ ආකාරයෙන් හටගනී. මෙතෙකින් බීජනියාමයාගේ බලපරාක්‍රමය දත යුතු.

දැන් ඍතු නියාමයාගේ බලය දක්වනු ලැබේ. හේ කෙසේදයත්, මේෂ වෘෂභාදී රාශි දොළොස අතුරෙන් ඒ ඒ රාශිවල ඒ ඒ මාසවල මල්හටගන්නා ගස්වල මල් ද, ගෙඩි හටගන්නා ගස්වල ගෙඩි ද හටගනී. ඒ එසේ ම ය. අණ කරන්නෙක් නියම කරන්නෙක් නැතිව ඒ ඒ රාශි ඒ ඒ මාස පැමිණි විට වනාන්තරයක් පාසා මල් හට ගන්නා ගස්වල මල් ද, ගෙඩි හටගන්නා ගස්වල ගෙඩි ද හටගනී. මෙතෙකින් ඍතුනියාමයාගේ බලපරාක්‍රමය දතයුතු. ඒ ඍතුව ද ග්‍රීෂ්මඍතුව වර්‍ෂාඍතුව හේමන්තඍතුව යයි තෙවැදෑරුම්ය. ග්‍රීෂ්ම ඍතුව නම් ග්‍රීෂ්ම ධාතු ගින්නයි. වර්ෂා ඍතුව නම් වර්ෂා ධාතු ගින්නයි. හේමන්ත ඍතුව හේමන්තධාතු ගින්නයි. ග්‍රීෂ්ම ඍතුවෙහි නම් ග්‍රීෂ්මගතිය වර්‍ෂාඍතුව පහළවීමට කරුණු වේ. හේමන්ත ඍතුවෙහි සිහිල් ධාතුගින්න වර්ධනය වීමෙන් සිහිල් මෘදු ගුණය ක්‍ෂය වී යාම ග්‍රීෂ්ම ඍතුව පහළ වීමට කරුණු වේ. නැවතත් ග්‍රීෂ්ම ඍතුවේ ග්‍රීෂ්ම ගතිය වර්‍ෂා ඍතුව පහල වීමට කරුණු වේ. මෙසේ මේ ස්වභාව කිසි ම කෙනකුගේවත් නිර්මාණයක් නැතිව ඍතු ඍතුහු ම ඔවුනොවුන්ගේ පරම්පරාගත ප්‍රතිසංස්කරණයෙන් කල්ප විනාශය දක්වා අවුරුද්දක් පාසා මසක් පාසා අවිච්ඡින්නව පවතින්නේය. අඹ දඹ පොල් පුවක් බට තෘණ ආදී වෘක්‍ෂලතාවෝ ද ඍතුන්ගේ ප්‍රතිසංස්කරණයට අනුව ම හටගන්නාහුය. මේ ඍතු නියාම ධර්මයාගේ බලපරාක්‍රමයෙන් සංස්කාර ලෝකය පහළ වී පවත්නා ක්‍රමයයි.

දැන් අවකාශලෝක සංස්කාරලෝක දෙකට ම සාධාරණ වූ ධර්‍මනියාම බලය කියනු ලැබේ. ධාතුඥාණාලෝකය නොලත් අඳුරේ වාසය කරන මනුෂ්‍යයෝ ඉර්ධිබලය දැනීමට විඥ්ඥාණයක් ඇති සත්ත්වයා තුළ ම ඇතිවේ. දැනීමට විඥ්ඥාණයක් නැති වන පර්‍වතාදියෙහි ඉර්ධිබලයක් නැත්තේයයි හඟිති. අභිධර්ම ක්‍රමයෙන් වනාහි පුද්ගලයාය, සත්ත්වයාය, වනය, පර්වතය කියා නැත්තේ ම ය. සියළු ම අවකාශලෝක ද්‍රව්‍ය සම්භාරයෝ ද ධාතු කුඩු ධාතු කැලි ධාතු රාශියක් ම ය. සියළු සංස්කාරලෝක ද්‍රව්‍ය සම්භාරයෝ ද ධාතු කුඩු ධාතුකැලි ධාතු රාශියක් ම ය.

සියළු සත්ත්ව ලෝක ද්‍රව්‍යසම්භාරයෝද ධාතුකුඩු ධාතුකැලි ධාතු රාශියක් ම ය. ලෝකයෙහි ඒ ඒ කෘත්‍යසිද්ධියෙහි පොහොසත් කෘත්‍යනිෂ්පාදක ශක්තිය ඉර්ධිබලයයි කියනු ලැබේ. යම්කිසි වස්තුවක් ඇතිවී යම්කිසි කෘත්‍යසිද්ධියක් වුවහොත් ඒ වස්තුවෙහි එක්තරා කෘත්‍යසම්පාදක ඉර්ධිබලයක් ඇති බව දත යුතු වේ. එසේ කෘත්‍ය සම්පාදක ඉර්ධිබල සියළු ධාතුන්හි ම මඳ වශයෙන් හෝ බහුල වශයෙන් හෝ ඇත්තේ ම ය. මහපොළොවෙහි සියළු සංස්කාර ලෝක ද්‍රව්‍ය සහ සත්ත්ව ලෝකද්‍රව්‍යත් උසුලාසිටිය හැකි ඉර්ධිබලයක් තිබේ. සත්ත්වයන් කෙරෙහි ඒ ඉර්ධිබලය නැත්තේ ම ය. වර්ෂා ජලයෙහි සියළු සංස්කාර ලෝක ද්‍රව්‍ය සහ සත්ත්ව ලෝකද්‍රව්‍යත් රක්‍ෂාකළ හැකි ඉර්ධි බලයක් තිබේ. සත්ත්වයන් කෙරෙහි ඒ ඉර්ධිබලය නැත්තේ ම ය. සංස්කාරලෝක සත්ත්වලෝකයන්ගේ මුහුකරවා ලීමෙහි සහ ආලෝකය පතුරුවාලීමෙහි ද පොහොසත් ඉර්ධිබලයක් ගින්නෙහි ද සූර්‍ය්‍ය විමානයෙහි ද තිබේ. සත්ත්වයන් කෙරෙහි ඒ ඉර්ධිබලය නැත්තේ ම ය. යටත්පිරිසෙයින් කෑමට බත් පිසගැන්ම පවා මහපොළොව දිය දර ගින්දර නැත්නම් තනිකර මනුෂ්‍ය ඉර්ධිබලයෙන් කළ හැකි නොවේ. පොළොව දිය දර ගින්දර සම්පූර්ණ වූ කල්හි ම මනුෂ්‍ය ඉර්ධිබලය ඇතිවන්නේය. එහෙයින් පොළොව දිය දර ගින්දර වල ද තම තමන්ට අයත් විෂයෙහි තම තමන්ගේ ශක්තියට අනුව කෘත්‍යසම්පාදක ඉර්ධිබලය ඇති බව දත යුතු. වෙනස නම් සත්ත්වයන් කෙරෙහි දැනීම පිණිස විඥ්ඥාණයක් ද ඥාණයක් ද ඇත්තේය. එහෙයින් දියෙන් කටයුතු කෘත්‍යයෙහි දිය ද දරවලින් කටයුතු කෘත්‍යයෙහි දර ද ගින්නෙන් කටයුතු කෘත්‍යයෙහි ගින්න ද සොයා ගෙන එහි යොදවා ලති. ඒ එසේමය, මෙකල බටහිර දේශවාසී ශාස්ත්‍රඥයෝ ඒ ඒ කඳුකරවල ඒ ඒ වනාන්තරවල ධාතුබලය සොයා ඇවිදිති. මේ ධාතුශාස්ත්‍රඥයන්ට සහ ආභිධම්මික පණ්ඩිතයන්ටත් ලැබී තිබෙන ධාතු ආලෝකයයි. මෙසේ අවකාශලෝක සංස්කාර ලෝකයන්හි මැවුම්කාරයකුගේ නිර්මාණයක් නැතිව ම පහළවීමට හේතුවූ ප්‍රත්‍යයන්ගේ සාමාග්‍රිය ඇති කල්හි ඒ ඒ හේතුවෙන් ඒ ඒ ඵල පරම්පරාව පහළවීම ද

පිරිහීමට කල් පැමිණිවිට පිරිහී නැතිවීම ද යන මේ සියල්ල ධර්මනියාමයාගේ බලපරාක්‍රමයෙන්ම සම්පාදනය වන්නේය.

දැන් කර්මනියාම බලයෙන් සත්ත්වලෝකය පහළවන ක්‍රමය කියනු ලැබේ. බටහිර දේශවාසීන්ගේ ධාතුවිභඞ්ග පොත්වල රූප ධාතු බෙදන ක්‍රමයමුත් නාමධාතු බෙදන ක්‍රමය දක්නා නො ලැබේ. නාමධාතු බෙදීම රූපධාතු බෙදීමට වඩා ශතසහස්‍රවාරයකින් ද විශාල ම ය, ගැඹුරු ම ය. අප බුද්ධාගමේ අභිධර්මපිටකයෙහි පමණක් දක්නා ලැබෙන ක්‍රමයකි. එහෙයින් මෙතැන් පටන් (F.A) (B.A) ආදී ධාතුශාස්ත්‍රඥයන්ට විෂය නොවූ ආභිධම්මික පණ්ඩිතයන්ට ම විෂය වූ නාමධාතු විභාගක්‍රමය ප්‍රකාශවන බව දත යුතු. සත්ත්වයකුගේ සන්තානයක් තුළ රූපස්කන්ධ පරම්පරාව නාමස්කන්ධ පරම්පරාව යයි කියා පරම්පරා දෙකක් තිබේ. එහි රූපස්කන්ධ පරම්පරාව නම් රූපධාතු පරම්පරාවයි, නාමස්කන්ධ පරම්පරාව නම් නාමධාතු පරපම්පරාවයි. එයින් රූපධාතුපරම්පරාවයයි කියන ලද සත්ත්වශරීරය භවයකට වරක් මරණයෙන් පරම්පරාව සිඳී අවසාන වන්නේය, නාමධාතුපරම්පරායෙහි වනාහි පරම්පරාව සිඳී අවසානවන්නේය යි කියා නැත්තේය, අනාදිමත් සංසාරය මුළුල්ලෙහි අනන්තර ප්‍රත්‍යයෙන් ඒකාබද්ධ වී පවත්නීය. කල්ප විනාශයේදී යට යට භූමි නැසීගිය කල්හි ඒ නාමධාතු පරම්පරාවේ තම තමන්ට අයත් කර්මය විසින් නංවන ලදුව මතු මතු භූමිවල ක්‍රමයෙන් පහළවී යති. නැවත කල්පය ඇතිවූ කල්හි අකුශල පක්‍ෂය අවකාශ ලැබීමෙන් ඒ නාමධාතු පරම්පරාවෝ යට යට භූමිවල පහළ වී යති. ඒ නාම ධාතු පරම්පරා පහළ වන තැන්වල රූපස්කන්ධයෝ ද පහළ වී යති. මේ කිසි ම කෙනකුගේ නිර්මාණයක් නැතිව කර්ම නියාම බලයෙන් සත්ත්ව ලෝකය ඇතිවී පවත්නා ක්‍රමයයි, කර්මය නම් විඤ්ඤාණ සිත හා යුක්ත වූ චේතනා ධාතුවයි. ඒ චේතනා ධාතුව සියළු තන්හි කායිකවාචසිකාදී ව්‍යාපාරයක් පාසා විඤ්ඤාණ සිත පුබුදුවා නැගිටවා හරින ධාතුවකි. එහෙයින් ඊට චේතනාවයයි කියා ව්‍යවහාර කරනු ලැබේ, ඒ එසේමය,

විඤ්ඤාණසිත සොළවා පුබුදුවා හරින ධාතුවක් නැත්නම් මොන ම කටයුත්තක්වත් සිද්ධ විය හැකි නොවේ, හුදෙක් විඤ්ඤාණසිත සොළවා පුබුදවා හරින ධාතුවක් තිබෙන නිසා ම කායිකාදී ඒ ඒ ව්‍යාපාර සිද්ධ වන්නේය, එහෙයින් ඒ සොළවා පුබුදුවා හරින ධාතුව සියලු කෘත්‍යයෙක්හි ම ප්‍රධානියා වේ. ඒ නිසා ඊට කර්මය යි කියා ද ව්‍යවහාර කරනු ලැබේ.

චේතනා ධාතුවෙන් කායාංග වාචාංගයන් සොලවා පුබුදුවා හරින ක්‍රමය මෙසේ දත යුතු. යම් කිසි කෙනෙක් කැලෑවකට යන ගමනේදී වතුර දොලක මහත් මත්ස්‍ය රැනක් දක්නේය. ඔහු තුළ මත්ස්‍යයන් අල්වා ගැනීම පිණිස කායාඞ්ග සොළවා ප්‍රබෝධ කරන්නා වූ චේතනාධාතුව ඉදින් නො නැගිටියහොත් දර්‍ශන මාත්‍රයෙන් ම අවසාන වෙයි, ඉදින් චේතනාතොම කායාඞ්ග සොළවා පුබුදුවා නැගිටියහොත් මාළු ඇල්වීම් කෘත්‍යය ද ඇතිවන්නේය, එහෙයින් ඒ ඒ කෘත්‍යයෙහි චේතනාධාතුව ම ප්‍රධානියා වේ. ඊට කර්මයයි කියා ද කියනු ලැබේ, ඒ චේතනා සඞ්ඛ්‍යාත කර්මය විඤ්ඤාණසිත හා සම්ප්‍රයුක්තව උපදනාමුත් ධාතුන්ගේ ස්වභාවලක්‍ෂණ වශයෙන් විඤ්ඤාණය අනිකෙක. චේතනා සඞ්ඛ්‍යාත කර්මය අනිකෙක, එසේ ම සුඛවේදනා - දුක්ඛ වේදනා- සෝමනස්ස වේදනා - දෝමනස්ස වේදනා - ලෝභ - ද්වේෂ - මෝහ - මාන - ඊර්‍ෂ්‍යා - මච්ඡරියාදී චෛතසිකයෝද, ශ්‍රද්ධා - ප්‍රඥා - ස්මෘති - හිරි - ඔත්තප්ප - මෛත්‍රී - කරුණාදී චෛතසිකයෝ ද, ස්වභාව ලක්‍ෂණ වශයෙන් අන්‍ය ධර්ම කෙනෙක. විඤ්ඤාණය අන්‍ය ධර්මයෙක, මීට උපමාවක් නම් සිත ඉඟුරු, ලුණු, මිරිස්, ඇනු ආදිය ගෙන පිසන ලද දිය හොද්දේ වතුර හා සමානය. චේතනාදී දෙපනස් චෛතසික ධර්මයෝ ඉඟුරු, ලුණු, මිරිස්, ඇනු ආදී ඒ ඒ ද්‍රව්‍ය රසයන් හා සමානය. මිශ්‍ර වූ නමුත් යම් සේ ඉඟුරු, ලුණු, මිරිස්, ඇනු ආදී ද්‍රව්‍යයෝ රසධාතු වශයෙන් වෙනස් වූවාහු වෙත් ද එමෙන් චේතනාදී චෛතසික ධර්මයෝ විඤ්ඤාණයයි කියන ලද සිත හා මිශ්‍ර වූ නමුත් ධාතු ලක්‍ෂණ

වශයෙන් වෙනස් වූවාහු ම වෙති. ඒ එසේමය, වතුරේ කෘත්‍යය ලුණේ නැත්තේය. ලුණේ කෘත්‍යය වතුරේ නැත්තේය. එමෙන් ම විඤ්ඤාණයේ කෘත්‍යය චේතනාවේ නැත්තේය. චේතනාවේ කෘත්‍යය විඤ්ඤාණයේ නැත්තේය.

මූලබීජාදී බීජයෝ යම් සේ අඹ දඹ ආදී වෘක්ෂ හටගැන්මට බීජ වෙත් ද එමෙන් චේතනාධාතුව සත්ත්වයන්ගේ හටගැන්මට බීජය වේ. අඹබීජයෙන් අඹගස් දඹ ආදී බීජයෙන් දඹ ආදී ගස් හටගන්නාක් මෙන් චේතනා බීජයෙන් ඒ ඒ භවයන්හි මනුෂ්‍යගස් දිව්‍යගස් බලුසිවල් ආදී ගස් හට ගනිත්. මෙහි මනුෂ්‍ය ගස් නම් මනුෂ්‍ය ශරීරයෝ යි. දිව්‍ය ගස් නම් දිව්‍ය ශරීරයෝයි. බලු සිවල් ආදී ගස් නම් බලු සිවල් ආදී ශරීරයෝයි, අඹ දඹ ආදී රූප බීජයෙන් අඹ දඹ ආදී රූපගස් හටගන්නාක් මෙන් චේතනාකර්‍ම නමැති නාම බීජයෙන් ඒ ඒ භවයන්හි ප්‍රතිසන්ධි විඤ්ඤාණ නමැති නාමගස් හටගනිති, එක එක සත්ත්වයෙක් තුළ ඒ චේතනාකර්‍ම අනේකප්‍රකාර සුචරිතභාවයෙන් ද අනේකප්‍රකාර දුශ්චරිතභාවයෙන් ද ඇතිවේ. එයින් මරණාසන්න කාලයෙහි යහපත් සිතක් ඇති වී සුචරිතකර්මයකට අවකාශ ලැබී නම් ඒ සුචරිතකර්මය විසින් ඒ සත්ත්වයා සුගතිභවයකට පමුණුවනු ලැබේ, මරණාසන්න කාලයෙහි සිත නරක් වීමෙන් දුශ්චරිත කර්‍මයකට අවකාශ ලැබී නම් ඒ දුශ්චරිත කර්‍මය විසින් ඒ සත්ත්වයා දුර්ගතිභවයකට පමුණුවනු ලැබේ. මූලබීජාදී බීජයෝ මහාපෘථිවියෙහි යම් ස්ථානයෙක්හි වැටීනම් ඒ ස්ථානයෙහි වෘක්ෂලතා උපදවන්නාක් මෙන් කුශලාකුශල චේතනා කර්‍මබීජයෝ ද තම තමන් වැටුණු භූමියෙක්හි ප්‍රතිසන්ධිස්කන්ධ නමැති වෘක්ෂලතා උපදවන්නාහුය, ඒ ඒ භවයන්හි අභිනව අභිනව ප්‍රතිසන්ධිස්කන්ධ පහළ වූ කල්හි පුද්ගලයා ද ඒ භවයට පැමිණියේ වේ. ඒ කර්‍මය ද පුද්ගලයා ඒ භවයට දමාගැසූ කර්මයයි ලෝකව්‍යවහාරයෙන් කියනු ලැබේ. ඒ පුද්ගලයා විසින් ඒ භවයෙහි ජීවිතය ද කර්‍මය විසින් දෙන ලදින් ලද්දේය, ස්කන්ධ ද කර්‍මය විසින් දෙන ලදින් ලද්දේය, මේ ආදී වශයෙන් කියනු ලැබේ.

සංස්කාර ලෝකයයි කියන ලද අඹ, දඹ, පොල්, පුවක්, නා, පනා ආදී වෘක්ෂලතාවන්ගේ හරිත සත්‍වයයි කියන ලද බීජධාතුවට ජීවිතයක් සිතක් ඥාණයක් නැත්තේය. එසේ ද වුවත් අභිනව වෘක්ෂලතා නිපදවීමෙහි කෙතරම් ශක්තියක් තිබේද? සත්ත්වලෝකයාගේ බීජය වූ චේතනා ධාතුව වූ කලී ජීවිතයක් සිතක් ඥාණයක් ඇත්තේය. එහෙයින් අභිනව ස්කන්ධ නිපදවීමෙහි ශක්තිය ගැන කියනුම කවරේද? හුදෙක් අතීතභවයෙහි ඒ කර්‍මය රැස්කරද්දීත් සත්ත්වයෙක පුද්ගලයෙක කියා කෙනෙක් ඇති වුනා නොව රූපධාතු නාමධාතු පුඤ්ජයක් ම ඒකාන්තයෙන් ඇති වූයේ වේ. ප්‍රත්‍යුපන්න භවයෙහි ද පුද්ගලයෙක සත්ත්වයෙක කියා කෙනෙක් පහළවුනා නොව අභිනව රූපධාතු නාමධාතු පුඤ්ජයක් ම පහළ වූයේ වේ. මෙසේ සුචරිත කර්‍මයෙන් සුගතිභවයට පැමිණීම හා දුශ්චරිත කර්‍මයෙන් දුර්ගතිභවයට පැමිණීමත් සුචරිත දුශ්චරිතයන් සම්බන්ධ කර්‍මනියාම බලයෙන් ම සිද්ධ වන්නේය. අන් කිසිවකු විසින් පමුණුවන ලද්දේයයි කියා නැත්තේ ම ය.

සංස්කාර ලෝකයෙහි ලා කියන ලද බීජනියාමය වෘක්ෂලතාවන් කෙරෙහි පමණක් නොව සත්ත්වයන් කෙරෙහි ද ලැබෙන්නේ ය. එයින් සත්ත්වයන් තුළ ලැබෙන බීජ නියාමය නම් මවුපියන්ගෙන් හටගන්නාවූ ශුක්‍රශ්‍රෝණිත සංඛ්‍යාත බීජයන්ගේ නියමයයි. දරු උපතේදී ඒ ශුක්‍රශ්‍රෝණිත බීජ නියාමය දරුවාගේ සන්තානයෙහි කර්‍ම නියාමය හා සහාය භාවයට පැමිණේ. මේ අර්ථය උපමා වශයෙන් මෙසේ දතයුතු. මව්ගේ ශුක්‍ර ශ්‍රෝණිත ධාතු කොට්ඨාසය, වැපිරීමට ස්ථාන වූ කුඹුරේ සමතලා භූමිය හා සමානය. පියාගේ ශුක්‍රශ්‍රෝණිත ධාතු කොට්ඨාසය එහි තිබෙන ආපෝරසය හා සමානය. කර්‍මයයි කියන ලද නාම ධාතු බීජය එහි වපුරන ලද ධාන්‍ය බීජ හා සමානය. ප්‍රතිසන්ධි විඥ්ඥාණය ඒ ධාන්‍ය බීජයෙන් හටගන්නාවූ ධාන්‍යාඞ්කුර හා සමානය. ඒ අඞ්කුරය ද ඒ භවයෙහි පහළවන තෙක් නාම රූපස්කන්ධයන්ගේ බීජ ස්ථානයෙහි පිහිටියේ වේ. එහෙයින් මතුදක්වනු ලබන

පටිච්චසමුප්පාද කථායෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය අඹ ඇට හා උපමා කොට දක්වනු ලැබේ. අඹ ඇටෙන් හටගන්නා වූ මොටියන් අතුරිකිලි ආදී අවයවයෝ බීජනියාම ශක්තිය නො ඉක්මවා අඹ මොටියන් අඹඅතු අඹරිකිලි ආදී අඹ අවයව ම වන්නාක් මෙන් ඒ ඒ මවුපියන් කෙරෙහි කර්මය විසින් පමුණුවන ලදුව ඇතිදූඩිවෙන දූදරුවෝ මවුපියන්ගෙන් හටගන්නා වූ ශුක්‍රශ්‍රෝණිත සඞ්ඛ්‍යාත බීජ ශක්තියෙන් මවුපියන්ගේ ලිඞ්ග යට ආකල්පයට අනුව ඇතිදූඩිවෙති. ඒ එසේමය, දූදරුවන් දක මොවුන්ගේ මවුපිය මුතුන්මිත්තෝ සිංහළයෝය, ද්‍රවිඩයෝය, හම්බයෝය, යොන්නුය, ඉංග්‍රීසීහුය, ලන්සීහුයයි කියා ඇඳින ගත හැක්කේ ම ය. ගවයන් කෙරෙහි පමුණුවන ලදුව ඇති දූඩි වුවහොත් ඒ ගවපෝතකයන්ට ගවලිඞ්ගය ගව ආකල්පය, බල්ලන් කෙරෙහි පමුණුවන ලදුව ඇති දූඩිවුවහොත් ඒ බලුපැටවුන්ට බලුලිඞ්ගය, බලු ආකල්පය, කවුඩන් කෙරෙහි පමුණුවන ලදුව ඇතිදූඩිවුවහොත් ඒ කවුඩුපෝතකයන්ට කවුඩු ලිඞ්ගය, කවුඩු ආකල්පය, කවුඩු වර්ණය, කොකුන් කෙරෙහි පමුණුවන ලදුව ඇති දූඩි වුවහොත් ඒ කොක් පැටවුන්ට කොක් ලිඞ්ගය, කොක් ආකල්පය, කොක්වර්ණය ද ඇතිවේ, මෙසේ ඇඳින ගත හැක්කේ ම ය. මේ කර්මනියාමයෙහි බීජනියාමය මිශ්‍රවන ක්‍රමයයි.

කුශලාකුශල කර්ම දෙකොටස අතුරෙන් කුශල කර්මයතෙම රැස්කිරීමේදී කුඩාකර්මය මහත්කර්මයයි ක්‍රමයෙන් හීන ප්‍රණීත වන බව දත යුතු. කෙසේද යත්? මස්සක් අගනා දානමය කුශල කර්මය, මසුදෙකක් අගනා දානමය කුශල කර්මය, මසුහතරක් අගනා දානමය කුශල කර්මය, කහවණුවක් අගනා දානමය කුශල කර්මය, කහවණු දහයක්, සියයක්, දහසක්, ලක්ෂයක්, දසලක්ෂයක්, කෝටියක් අගනා දානමය කුශල කර්මය යනාදී වශයෙනි. එයින් මහත් කුශලකර්මය මහත් රජකුලවල ප්‍රතිසන්ධිය ගෙන දෙන්නේය. එසේ ප්‍රතිසන්ධිය දුන් කල්හි මවුපියසන්තක සියලු රාජ ඓශ්වෛයර්යයෝද ඒ දරුවාට අයත් දැවැද්දවී යති. මේ කර්මයෙන් සම්පත් ලැබෙන ක්‍රමයයි. එසේ

ලැබීමට පවා නොයෙක් ලෙස අන්තරායකර හේතු ඇතිවිය හැක්කේ ය. සිටු ගෘහපති කුලවල ප්‍රතිසන්ධිග්‍රහණයෙහි ද මේ ක්‍රමයෙන් ම යි. ඇතැම් කර්මයක් තෙමේ දුර්වල වූ හෙයින් රජ සිටුකුලවල ප්‍රතිසන්ධි ගෙන දිය නොහී ගොවිතැන් වෙළහෙළඳාම් ආදියෙන් දිවි පවත්වන කුලවල ම ප්‍රතිසන්ධිය ගෙන දෙන්නේය. ඒ එසේමය. ද්‍රතිය ප්‍රධාන න්‍යාය විස්තර කථායෙහි කියන ලද ප්‍රත්‍යුත්පන්න කර්මය, ඥානය, වීර්‍ය්‍යය යන මොව්හු එබඳු කර්‍ම-යෙන් ජනිත ප්‍රතිසන්ධි ඇත්තවුන්ට සම්පත් ගෙන දීමෙන් පිහිට වෙති. කර්මය වූ කලී අනේක ප්‍රකාරය. කියයුතු වූ දතයුතු වූ නොයෙක් ප්‍රභේද ඇත්තේය.

## සත්ත්ව ලෝකයෙහි සාපේක්ෂ කර්‍ම නියාමය නිමි.

දැන් චිත්ත නියාම ක්‍රමය කියනු ලැබේ. මේ ශරීරයෙහි දකින සිත, ඇසෙන සිත, ගඳ දැනගන්නා සිත, රස දැනගන්නා සිත, ස්පර්ශ දැනගන්නා සිත, සිතන සිතයයි සිත් සයකොටසක් තිබේ. එයින් ඇස තුළ පහළවී නිල්වන් රන්වන් ආදී වර්ණ දක්නා සිත දකින සිත නම් වේ. කණ තුළ පහළවී මුවහඬ හෙනහඬ ආදී ශබ්ද ඇසෙන සිත ඇසෙන සිත නම් වේ. නාසය තුළ පහළ වී සුගඳ දුගඳ දැනගන්නා සිත ගඳ දැනගන්නා සිත නම් වේ. දිව තුළ පහළවී ලුණු ඇඹුල් ආදී රස දැනගන්නා සිත රස දැනගන්නා සිත නම් වේ. හිස්මුදුන පටන් දෙපතුල දක්වා සියලු කය තුළ පහළවී ඇඟේ වදින ස්පර්ශ දැනගන්නා සිත ස්පර්ශ දැනගන්නා සිත නම් වේ. හෘදය තුළ පහළවී නොයෙක් අරමුණු දැනගන්නා සිත සිතන සිත නම් වේ. ඒ චිත්තයන්ගේ අරමුණු ද, වර්ණඅරමුණු, ශබ්දඅරමුණු, ගන්ධ අරමුණු, රස අරමුණු, කයෙහි ස්පර්ශ වන අරමුණු, නොයෙක් ලෙස සිතීමෙන් දැනගණු ලබන අරමුණුයයි කියා සයවැදෑරුම් වේ. ඇසට රූපාරමුණක් සම්මුඛ වූ විට ඇස තුළ දක්නා සිත පහළ වීමෙන් ඒ අරමුණ පෙනීයයි. මුහුණ අන්දෙසකට හැරවීමෙන් හෝ ඇස පියාගැන්මෙන්

හෝ ඒ දක්නා සිත නිරුද්ධ වෙයි. මෙසේ ඒ ඒ රූපාරමුණු සම්මුඛව දැකීමෙහි ඇස තුළ චිත්තයන්ගේ උත්පත්තිය හා නිරෝධය දතයුතු, ශබ්දයක් ඇති වූ විට කණ තුළ ඇසෙන සිත පහළවීමෙන් ශ්‍රවණය වේ. ඒ ශබ්දය සංසිඳීම හා සමග ඒ ශබ්දය අරමුණු කොට ගෙන උපන් සිත ද නිරුද්ධ වේ. මෙසේ ඒ ඒ ශබ්ද අරමුණු වීමෙහි කණ තුළ චිත්තයන්ගේ උත්පත්තිය හා නිරෝධය දතයුතු. ගන්ධාරමුණක් ඇති වූ විට නාසය තුළ ගඳ දන්නා සිත පහළවීමෙන් ඒ ගඳ දැනගනී. ඒ ගන්ධය සංසිඳීම හා සමග ඒ ගන්ධය අරමුණු කොටගෙන උපන් සිත ද නිරුද්ධ වේ. මෙසේ ඒ ඒ ගඳ සුවඳ අරමුණුවීමෙහි නාසය තුළ චිත්තයන්ගේ උත්පත්තිය හා නිරෝධය දත යුතු. රසාරමුණක් අරමුණු වූ විට දිව තුළ රස දන්නා සිත පහළවීමෙන් රසය දැනගනී. ඒ රසාරමුණ සංසිඳීම හා සමග ඒ රසාරමුණ අරමුණු කොටගෙන උපන් සිත ද නිරුද්ධ වේ. මෙසේ ඒ ඒ රසාරමුණු අරමුණුවීමෙහි දිව තුළ චිත්තයන්ගේ උත්පත්තිය හා නිරෝධය දත යුතු. සපර්ශ දැනෙන සිත් වූ කලී සියලු ශරීරයෙහි ම පහළ වේ. ඉදිකටුමුණකින් හැන බැලූ විට හිස්මුදුන පටන් දෙපතුල දක්වා යම් තැනෙක රිදුම ඇතිවේ ද එය ස්පර්ශයන්ගේ සඝට්ටණයෙන් සිත් ඉපදීමට ස්ථාන වේ. ඒ සියලු සිරුර තුළ ඒ ඒ අඞ්ගයන්හි ස්වල්ප ස්පර්ශ දැනෙන සිත් ද පහළ වේ. දුක්වේදනා, සහිතවී ආවිට රිදුම්සිත්, කෙවුම්සිත්, හිරිසිත්, උෂ්ණසිත්, ගිමන්සිත්, විඩාසිත්, දැවිලිසිත්, සිහිල්සිත් යනාදී වශයෙන් නොයෙක් අන්දමේ සිත් උපදී. මෙහි චිත්තයන්ගේ උත්පාදනිරෝධය කියන ලද නයානුසාරයෙන් දත යුතු. සාමාන්‍ය මනුෂ්‍යයෝ ඒ රිදුම් කෙවුම් ආදිය චිත්තධාතුයයි කියා හෝ විඥාන ධාතුයයි කියා හෝ නාමධාතුයයි කියා හෝ නො දනිති. ග්‍රීෂ්ම කාලවල සියලු ශරීරය තුළ එබඳු දැවිලි සිත් නොයෙක් ලෙස උපදී. එසේ උපදින සිත්රැස ඇගේ සම හා එකක්කොට ගෙන ඇගේ සම දැවිලිකෙරේයයි ගෙන ව්‍යවහාර කරති. හිසරුදා කෙරේයයි දනිත්මුත් හිසේ දුක්වේදනා සහිත විඥානසිත් පහළවේයයි නො දනිත්. හිසරුදාව සංසිඳීයයි දනිත් මුත් ඒ රුදාකළ විඤ්ඤාණසිත් නිරුද්ධවීයයි නො දනිත්. ඒ ඒ

ශරීරාවයවයන්හි රිදුම ඇතිව නිරුද්ධවීම ද මේ ක්‍රමයෙන් දත යුතු. හෘදය තුළ පහළවන දැනීමෙන් යුක්ත වූ සිත වනාහි විටින් විට ලෝභ සහගතව ද, ද්වේෂ සහගතව ද, මෝහ සහගතව ද, ශ්‍රද්ධා සහගතව ද, මෛත්‍රී සහගතව ද, ප්‍රඥාසහගතව ද මේ ආදී වශයෙන් අනේකප්‍රකාර ප්‍රභේදවත්ව පහළ වේ. ලෝභ අරමුණක් සම්මුඛ වූ විට ලෝභය හා යෙදී හෘදය තුළ පහළවන දැනීම ලෝභ සිතයයි කියනු ලැබේ. ද්වේෂ අරමුණක් සම්මුඛ වූ විට ද්වේෂය හා යෙදී හෘදය තුළ පහළවන දැනීම ද්වේෂ සිතයයි කියනු ලැබේ. මෝහාදියෙන් යුක්ත වූ සිත් ද මෙසේ ම දත යුතු. මෙසේ මේ චිත්ත ධාතුව හෘදය තුළ ඇතිව නැතිවෙමින් පවත්නා බව දත යුතුය. සිත් දෙකක් එක වර ඉපදීයයි කියා නැත්තේය. අනන්තර ප්‍රත්‍යවශයෙන් එකක් ඉපද නිරුද්ධ වූ කල්හි ම අනික් සිතක් උපදී. ඒ එසේ ම ය. වරින්වර නොයෙක් යක්ෂාවේස ඇති එක්තරා ආතුරයෙක් වෙසේ, ඔහු තුළ වරකට එක යකෙක්මුත් යක්කු දෙන්නෙක් ආවේස නො වන්නාක් මෙන් මේ ශරීරය තුළ ද, එකවර එක සිතක්මුත් සිත් දෙකක් නූපදිත් ම ය, ශරීරාවයවයන් වාග් අවයවයන් ක්ෂණයකින් පුබුදුවා යාම් ඊම් හා කීම් බිණීම් ආදිය කර විය හැකි චිත්ත ශක්තිය වූ කලී කියන ලද ඒ හෘදය තුළ පහළවන්නීය. මනුෂ්‍යයෝ වනාහි ඒ හෘදය තුළ පහළවන චිත්තයන් ගැන ඇතිව නැතිවෙමින් පවත්නා බව නොදත් හෙයින් නොයෙක් ලෙස දැනීමෙන් යුක්ත වූ එක ම සිතක් නිතර පවත්නේයයි වරදවා හඟිත්. මේ නොයෙක් ආකාර උපදනා සිත බෙදා දැක්වීමයි.

දැන් චිත්ත නියාම විශේෂ ක්‍රමය කියනු ලැබේ. පෙර පසුව උපදනා සිත් පේළියක් වීථියක් නම් වේ. ඒ වීථිය ද රූප දක්නා වීථිය, ශබ්ද අසන වීථිය, ගඳ සුවඳ දන්නා වීථිය, රසදන්නා වීථිය, ස්පර්ශ දන්නා වීථිය, සිතීමෙන් දන්නා වීථියයි කියා සය වැදෑරුම් වේ. ඒ ඒ රූපාරමුණු දක්නා වීථි උපදනා ක්‍රමය නම් :- ඇසට යම්කිසි රූපාරමුණක් හමුවූ විට මේ කිමෙක්ද කියා මෙනෙහි කරන සිත, දක්නා සිත, බාරගන්නා සිත, විමසන සිත, ව්‍යවස්ථා

සිත, විඳින සිත, එහි එල්බීමෙන් උපදනා සිතයයි පිළිවෙලින් සිත් සත්කොටසක් ඉපද නිරුද්ධවේ. එයින් දක්නා සිත පමණක් ඇස තුළ උපදී. ඉතුරු සිත් සයකොටස හෘදය තුළ උපදනා බව දතයුතු. ඒ ඒ ශබ්ද සම්මුඛ වූ විට අසන වීථි පහළවන ක්‍රමය නම්:- කණට යම්කිසි ශබ්දයක් හමුවූවිට මේ කිමෙක්ද කියා මෙනෙහි කරන සිත, අසන සිත, බාරගන්නා සිත, සෙස්ස පෙරමෙනි, ඒ ඒ ගන්ධජාති සම්මුඛ වූ විට ගඳදන්නා වීථි පහළවන ක්‍රමය නම්:- නාසයට යම්කිසි ගඳක් හමුවූවිට මේ කිමෙක්ද කියා මෙනෙහි කරන සිත, ගඳ දන්නා සිත, බාරගන්නා සිත, සෙස්ස පෙරමෙනි, ඒ ඒ රස ජාති සම්මුඛ වූ විට රස දන්නා වීථි පහළවන ක්‍රමය නම්:- දිවට යම්කිසි රසයක් හමුවූ විට මේ කිමෙක්ද කියා මෙනෙහි කරන සිත, රසදන්නා සිත, බාරගන්නා සිත, සෙස්ස පෙරමෙනි, ඒ ඒ ස්පර්ශජාති සම්මුඛ වූ විට ස්පර්ශ දන්නා වීථි පහළවන ක්‍රමයනම් :- ශරීරයට යම්කිසි ස්පර්ශයක් හමුවූ විට මේ කිමෙක්ද කියා මෙනෙහි කරන සිත, ස්පර්ශ දන්නා සිත, බාර ගන්නා සිත, සෙස්ස පෙර මෙනි, අසන සිත කණ තුළ ද, ගඳ දන්නා සිත නාසය තුළ ද, රසදන්නා සිත දිව තුළ ද, ස්පර්ශ දන්නා සිත ශරීරාවයවයන්හි ද උපදී. ඉතුරු සිත් සය කොටස හෘදය තුළ ම උපදනා බව දත යුතුය. මීට උපමාවක් නම් :- එක්තරා රාජගෘහයෙක රජ ඇතුළු සියලුදෙන රාත්‍රිකාලයෙහි නිද්‍රාවට පැමිණියේ වේ. එකල්හි සොරෙක් අවුත් රාජගෘහයෙහි දොර හළේය. එවිට රජ මෙහෙකරුවෙක් පිබිදී මිනිසෙක් දොර හැරියේ දෝයි කල්පනා කොට දෙරටුපාලයා පුබුදවා බලව යයි කීය. දොරටුපාලකතෙම නැඟිට බලා යතුරු සිදුරෙන් සොරා දැක ගෘහාරක්ෂකයකුට සොරු දොර හළ බව කීය. එවිට ගෘහාරක්ෂකතෙම නැඟිටගොස් ඇල්වූ කල්හි සොරු අසුවිය. තනතුරුලත් අමාත්‍යයෙක් නැඟිට විත්ති පැමිණිලි දෙපක්ෂය විභාග කළේය. අනෙක් අමාත්‍යයෙක් නැඟිට නඩු විභාගය බලා ඒකාන්තයෙන් සොරෙක් කොට තීන්දුව දුන්නේය. රජතෙම තීන්දුව ලෙස දඬුවම් පැමිණවූය. රාජමාණවකයෝ සොරු ඉනඉහ සියල්ලක් පැහැරගත්තුය. සත්ත්වයන්ගේ ස්කන්ධය මේ උපමායෙහි

රාජගෘහය හා සමානය. ඒ ස්කන්ධකයේ භවාඞ්ග සිතින් යුත් කාලය රජ ඇතුළු සියලු දෙනාගේ නිද්‍රාකාලය හා සමානය. ඇස් කන් ආදී පස්දොර රජගෙයි දොර හා සමානය. බාහිර රූපාදී අරමුණු රැස සොරු හා සමානය. ඒ රූපාදී අරම්මණයන්ගේ ඇස් කන් ආදී පස්දොර ගැටීම සොරු දොර හැරීම හා සමානය. අරමුණු මෙනෙහි කරන සිත, දක්නා සිත ආදී සිත් සොරු දිටු රජ මෙහෙකරු ආදී රාජපුරුෂයන් හා සමානය. මේ උපමා උපමේය සංසන්දනයයි. මෙහි පෙනීම්, ඇසීම්, ගඳදැනීම්, රස දැනීම්, ස්පර්ශ දැනීම්, ක්‍රියාරැස ධාතුන් සම්බන්ධ ඔවුනොවුන්ගේ ස්වලක්ෂණ ධාරණ මාත්‍රයක් මය, පුද්ගලයා කෙරෙහි වනාහි මම දකිමි, මම අසමි, මම ගඳ දනිමි, මම ස්පර්ශ දනිමියි කියා නැත්තේ ම ය. උපමාව ද ධාතුන්ගේ උත්පත්ති ක්‍රමය අනුව සංසන්දනය කළ යුතු. මේ ඇස් කන් ආදී පස්දොර චිත්තවීථි පහළවන ක්‍රමයයි. යට කියන ලද අරමුණුත් සමග ලෝක ධර්ම වශයෙන් පවත්නා අරමුණු සියල්ලක් දැනගැනීමෙහි මනෝද්වාර වීථි පහළ වන ක්‍රමය නම්:- යම් කිසි ධර්මයක් මනෝද්වාරයට හමුවූ විට මේ කිමෙක්ද කියා මෙනෙහි කරන සිත, ප්‍රස්ථාර සිත, එහි එල්බෙන සිතයයි තෙවැදෑරුම් සිතෙක් උපදී. පඤ්චද්වාර වීථීන්හි විඳින සිත හා මේ මනෝද්වාරයෙහි ප්‍රස්ථාර සිතත් ජවන් සිතයයි කියනු ලැබේ. වේගවත් තේජසින් යුත් සිත් කොටසෙක යනු අදහසයි. එයිනුත් මේ මනෝද්වාර සිත ම බලවත් ප්‍රස්ථාර ජවනය වේ. සත්ත්ව ලෝකයෙහි රෑ නලිය-නලියා දවල් නලිය-නලියා කෙරෙන ක්‍රියාරැස මනෝද්වාර ජවනයන්ගේ කෘත්‍යය වේ. මනෝද්වාරයෙහි මේ ජවන වේගය සංසිඳීගිය විට සියලු සත්ත්වයෝ ම මළ මිනිසුන් හා සමාන වෙති. ඒ එසේ ම ය. මේ ජවනවේගය සංසිඳී ගියවිට සත්ත්වයෝ ඇසට රූපයක් පෙණුනත් පෙණුනු බව පවා නො දනිති. කණට ශබ්දයක් ඇසුනත් ඇසුනු බව පවා නො දනිති. නාසයට ගඳක් වැදුනත් ගඳ බව පවා නො දනිති. දිවට රසක් හමුවුනත් රස බව පවා නො දනිති. ශරීරයට ස්පර්ශයක් හමුවුනත් ස්පර්ශවුණු බව පවා නො දනිති. මනෝද්වාරයෙහි

මේ ජවනශක්තිය ඇති වූ විට වනාහි ඇසට රූපයක් පෙණුනි නම් පෙණුන බවද, කණට ශබ්දයක් ඇසුණි නම් ඇසුණු බවද, නාසයට ගඳක් වැදුනිනම් ගඳ බවද, දිවට රසයක් හමුවුණි නම් රස බවද, ශරීරයට ස්පර්ශයක් හමුවුනිනම් ස්පර්ශවුණු බව ද දනිත් ම ය. එහෙයින් දක්නා වීථියට අනතුරුව ද -පෙ- ස්පර්ශ දන්නා වීථියට අනතුරුව ද මනෝද්වාර වීථි බොහෝ ගණනක් උපදිත් ම ය. දක්නා වීථිය ආදී පඤ්චද්වාර විථි හා සම්බන්ධයක් නැතිව හුදකලාව සිතීම් කෘත්‍යයෙන් උපදනා මනෝද්වාර වීථිවූ කලී අතිශයින් ම බොහෝයි. මෙසේ මෙය කිසිකෙනකුගේ විධානයකින්වත් මැවීමකින්වත් නොව හුදකලාව චිත්ත නියාම ධර්මයාගේ බලපරාක්‍රමයෙන් වන පහළවීමක් බව දත යුතු. දුම්යන්ත්‍රවල මුල් ඇණය කරකවා තරඞ්කය ඉවත් කළහොත් සියලු දුනු රෝදාදී යන්ත්‍රාවයවයෝ ස්වකීය ස්වකීය කෘත්‍යයෙන් අන්තිමය දක්වා මෙසේ ක්‍රියා කෙරෙත්ද? එමෙන් ඇසට රූපයක් හමුවූ විට පෙනෙන වීථි දැනෙන විථි ආදී වීථීහු ක්‍රමක්‍රමයෙන් පහළ වෙති. මුහුණ අන්දෙසකට නො හරවා ඇස නො පියා මට නො පෙනේවයි හැඬුවත් වැලපුනත් ඒ වීථීහු දර්ශන දුඃඛයෙන් ඒ පුද්ගලයා පෙළත් ම ය. එසේ ම බෙර දවුල් ආදී ශබ්දයක් හමුවූ විට මට නො ඇසේවයි හැඬුවත් වැලපුනත් ශ්‍රවණ වීථීහු ශ්‍රවණ දුඃඛයෙන් ඒ පුද්ගලයා පෙළත් ම ය. බලුකුණප ගෙරිකුණප ආදී කුණප දුර්ගන්ධයක් හමු වූ විට මට ගඳ නො වදීවයි, හැඬුවත් වැලපුනත් ගන්ධාග්‍රහණ වීථීහු ගන්ධ දුක්ඛයෙන් ඒ පුද්ගලයා පෙළත් ම ය. අතිශයින් කටුක තිත්ත රසාදී රස හමුවීමෙහි මට රස නො දැනේවයි හැඬුවත් වැලපුනත් රසදන්නා වීථීහු රස දුක්ඛයෙන් ඒ පුද්ගලයා පෙළත් ම ය. හිසරුදා උණසන්නිපාතාදී රෝග ඇතිවූ විට රුජාචිත්ත වීථි හා උෂ්ණ චිත්ත වීථිද වණපිළිකාදිය ඇති වූ විට ශාරීරාවයවයන්හි ඇතිවන වේදනා වීථි හා කෙවුම් වීථිද, යම් තාක් ඒ රෝගාබාධ සංසිඳීමට නො පැමිණියේ ද ඒ තාක් ඒ පුද්ගලයා පෙළත් ම ය. විඳීම ප්‍රකට වීම

පිණිස අනිෂ්ටාලම්බන හමුවීමෙහි කියන ලද මේ ක්‍රමයෙන් ම ඉෂ්ටාලම්බන හමුවීමෙහි ද චිත්තනියාම ක්‍රමය දත යුතු.

## සත්වලෝකයෙහි චිත්තනියාම ක්‍රමය නිමි.

දැන් ධර්මනියාම ක්‍රමය කියනු ලැබේ. නිදානවග්ගසංයුත්ත නිකායෙහි පටිච්චසමුප්පාදය සත්ත්වලෝකයාගේ ධර්ම නියාමයයි වදාළේය. කෙසේද යත් 1. අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, 2. සඞ්කාර පච්චයා විඤ්ඤාණං, 3. විඤ්ඤාණපච්චයා නාමරූපං 4.නාමරූපපච්චයා සළායතනං 5. සළායතනපච්චයා ඵස්සෝ, 6. ඵස්සපච්චයා වේදනා 7. වේදනාපච්චයා තණ්හා, 8. තණ්හා පච්චයා උපාදානං, 9. උපාදානපච්චයා භවෝ, 10. භවපච්චයා ජාති, 11. ජාතිපච්චයා ජරාමරණං යන ඒකාදශප්‍රකාර හේතුඵල දුක්ඛයන්ගේ වශයෙනි.

(1) **අවිජ්ජාපච්චයා සඞ්ඛාරා**, මනුෂ්‍යයා ය, දෙවියා ය, බ්‍රහ්මයා යයි ව්‍යවහාර කරන ලද නාමරූපසකන්ධ රාශිය මනුෂ්‍යයෙක් දෙවියෙක් බ්‍රහ්මයෙක් සත්ත්වයෙක් පුද්ගලයෙක් නොව අතිශයින් භයානක වූ නාම රූපධාතු පුඤ්ජයක් ම යයි කියා මනාව නො දැනීම හේතුකොට ගෙන නැවත නැවත නාමස්කන්ධ රූපස්කන්ධ උපදවන සංස්කාර ධර්මයෝ පහළවෙත් ම ය, (2) **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**, සංස්කාර නමැති බිජුවට රැස්කරමින් පෝෂ්‍යකිරීම හේතුකොට ගෙන අනතුරු භවයෙහි පහළවන නාමරූපස්කන්ධයන්ගේ බීජය වූ විපාක විඤ්ඤාණ නමැති ප්‍රධාන ධාතු කොට්ඨාසය පහළ වේ. (3) **විඤ්ඤාණපච්චයා නාමරූපං**, විපාක විඤ්ඤාණය නමැති ඒ ප්‍රධාන ධාතුකොඨාසය පහළවීම හේතුකොටගෙන නාම රූප යන ද්විප්‍රකාර කය පහළ වේ. ඵස්ස වේදනා, සංඥා, චේතනාදී චෛතසික රාශිය නාමකය යයි කියනු ලැබේ. (4) **නාමරූපපච්චයා සළායතනං**, නාමරූප යන ද්විප්‍රකාර කය පහළවීම හේතුකොටගෙන රූපකයෙහි වර්ණය ශබ්දය ගන්ධය රසය ස්පර්ශය යන පඤ්චප්‍රකාර

ආලම්බනයන්ගේ ප්‍රවේශනය පිණිස ප්‍රසාද වස්තුද්වාර පසක් ද නාමකයෙහි ආලම්බනයන්ගේ ප්‍රවේශනය පිණිස මනෝප්‍රසාද ද්වාරයක් ද යන ප්‍රසාදද්වාර ෂට්කය පහළ වේ. චක්ඛු සෝත ඝාන ජිව්හා කාය යන පස ප්‍රසාදද්වාරයයි කියනු ලැබේ. (5) **සළායතන පච්චයා ඵස්සො**, ප්‍රසාද වස්තු ෂට්කය නමැති දොර කවුළු සය පහළවීම හේතුකොට ගෙන ඒ ඒ ද්වාරයෙහි ප්‍රසාද අරමුණු විඥ්ඤාණ යන ධම්ත්‍රිකයාගේ සඡ්ටණ සඞ්ඛ්‍යාත ඵස්ස ෂට්කය පහළවේ. (6) **ඵස්සපච්චයා වේදනා**, ප්‍රසාද අරමුණු විඥ්ඤාණ යන ධම්ත්‍රිකයාගේ සඡ්ටණ සඞ්ඛ්‍යාත ඵස්ස ෂට්කය හේතුකොට ගෙන විඳීමයයි කියන ලද වේදනා ෂට්කය පහළ වේ. (7) **වේදනා පච්චයා තණ්හා**, විඳීමයයි කියන ලද වේදනා ෂට්කය හේතුකොටගෙන ඒ විඳීමට කාරණ වූ කාමවස්තූන් කෙරෙහි ආසාවයයි කියන ලද තෘෂ්ණා ෂට්කය පහළ වේ. (8) **තණ්හා පච්චයා උපාදානං**, තෘෂ්ණා ෂට්කය හේතුකොට ගෙන බලවත් තෘෂ්ණාවෙන් දැඩිලෙස ගැනීමයයි කියන ලද උපාදානය පහළ වේ. (9) **උපාදාන පච්චයා භවෝ**, බලවත් තෘෂ්ණාවෙන් දැඩිලෙස ගැනීම නම් වූ උපාදානය හේතුකොට ගෙන උපාදානයට ම හිත පිණිස කාය වාග් මනෝ යන තිදොර පැවති උත්සාහයයි කියන ලද සුචරිත දුශ්චරිත යන ද්විප්‍රකාර භවය පහළ වේ. (10) **භව පච්චයා ජාති**, සුචරිත දුශ්චරිත යන ද්විප්‍රකාර භවය හේතුකොට ගෙන චුතියට අනතුරුව නැවතත් ස්කන්ධයන්ගේ හටගැන්මයයි කියන ලද ජාතිය පහළ වේ. (11) **ජාතිපච්චයා ජරාමරණං**, ස්කන්ධයන්ගේ අභිනව අභිනව හටගැනීම ඇති හෙයින් හටගත් හටගත් සියළු ස්කන්ධයන්ගේ පරණ වීමෙන් දිරීම හා මැරීම ද වන්නේය.

## මේ එකොළොස් වැදෑරුම් වූ පටිච්චසමුප්පාද හේතුඵල දුක්ඛයන්ගේ අර්ථ යෝජනාවයි.

මෙහි අවිද්‍යා සංස්කාර දෙක අතීත භවයෙහි ඇති වූ ධර්මයෝයි, විඥ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා,

තණ්හා, උපාදාන, භව යන අට මේ පවත්නා භවයෙහි පහළවූ ධර්මයෝයි. ජාති, ජරා, මරණ යන තුන අනාගත භවයෙහි පහළ වන්නා වූ ධර්මයෝයි.

විඤ්ඤාණය මේ පවත්නා භවයාගේ පටන්ගැන්මයි. ඒ පවත්නා භවය පටන්ගැන්මට හේතුවූ ධර්මයෝ නම් අවිද්‍යා සංස්කාර දෙක ය. පවත්නා භවයාගේ පූර්වාන්තය නම් ඒ අවිද්‍යා සංස්කාර දෙදෙනා ම ය. මෙයින් ඉකුත් වූ භවයක් ඇති බව සුප්‍රකටය. ඉකුත්ව ගිය භවය නම් විඤ්ඤාණ නාමරූපාදී අටවැදෑරුම් ධර්මයෝ ය. ඒ භවයෙහි ද විඤ්ඤාණය පටන් ගැන්ම වේ. ඒ විඤ්ඤාණය පටන්ගැන්ම පිණිස අවිද්‍යා සංස්කාර දෙක ඊටත් පූර්වභවයෙහි පහළ වූ හේතු ධර්මයෝ ය. මේ ක්‍රමයෙන් අතීත සංසාරයෙහි භවයෙන් භවයට ඉමක් නැතිව අනාදිමත්ව අවිද්‍යා සංස්කාර දෙක පහළ වූ බව දත යුතු.

ජාතිය අනාගත භවයාගේ පටන්ගැන්මයි. අනාගත භවය නම්, විඤ්ඤාණ නාම රූපාදී අටවැදෑරුම් ධර්මයෝයි. ඒ විඤ්ඤාණාදී අටවැදෑරුම් ධර්මයන් අතුරෙන් කර්ම භවය අන්තිම අඞ්ගය වේ. ඒ අන්තිම අඞ්ගය වූ කර්ම භවය හේතුකොට ගෙන ඊට අනතුරු අනාගත භවයෙහි ජාතිය ඇතිවන්නීය. මෙහි ද අනාගත භවය නම් විඤ්ඤාණ නාම රූපාදී අටවැදෑරුම් ධර්මයෝ ම ය. ඒ අටවැදෑරුම් ධර්මයන් අතුරෙන් කර්මභවය හේතුකොට ගෙන ඊටත් අනතුරු අනාගත භවයෙහි ජාතිය ඇතිවන්නීය. මේ ක්‍රමයෙන් අනාගත සංසාරයෙහි ද භවයෙන් භවයට ඉමක් නැතිව ජාතිය ඇතිවී යන බව දත යුතු. මෙසේ අනවරාග්‍ර සංසාරයෙහි කිසිකෙනකුගේවත් නිර්මාණයක් නැතිව නාම රූප ධර්මයන්ගේ හේතු ඵල වශයෙන් නො සිඳී පවත්නා පරම්පරාව ධර්ම නියාමයයි කියනු ලැබේ.

මෙම හේතු ඵල පරම්පරාව උපමා වශයෙන් මෙසේ දත යුතු. භවයක් පහළවීමෙහිදී ඊට හේතුවන අවිද්‍යාව පෘථිවිය හා

සමානය. තෘෂ්ණාව වෂීජලය හා සමානය. සඞ්ඛාර යයි කියන ලද චේතනා ධාතුව අඹ බීජය හා සමානය. දෙවෙනි භවයෙහි ප්‍රතිසන්ධි විඥ්ඥාණය අඹ බීජයෙන් හටගන්නා අඹ අඞ්කුරය හා සමානය. නාම කය රූප කය යන ද්විප්‍රකාර කය ඒ අඹ අඞ්කුරයෙන් වැවීගිය අඹගස හා සමානය. මෙහි විඥ්ඥාණයයි කියන ලද චිත්තයාගේ පරිවාර ධර්මයෝ ඵස්ස වේදනා සංඥා චේතනාදී වූ ද, විතර්ක විචාර වීයර්‍යාදී වූ ද ලෝභ ද්වේෂ මෝහ මාන දෘෂ්ටයාදී වූද, ශ්‍රද්ධා ස්මෘති හිරි ඔත්තප්ප ප්‍රඥාදී වූද යන මොවුන්ගේ වශයෙන් යම් හෙයකින් අතිශයින් බොහෝ වෙත්ද එහෙයින් ඔව්හු නාමකයයි කියනු ලැබෙත්. චක්‍ෂුරාදී ආයතන ෂට්කය අඹමල් කිනිති හා සමානය. චක්ඛු සම්ඵස්සාදී ඵස්ස ඡක්කය අඹමල් කැකුළු හා සමානය. චක්ඛු සම්ඵස්සජා වේදනාදී වේදනා ඡක්කය අඹමල් හා සමානය. චක්ඛු සම්ඵස්සජා තණ්හාදී තණ්හා ඡක්කය අඹගැට හා සමානය. උපාදාන චතුෂ්කය පැසුණු අඹඵල හා සමානය. කර්මභවය එහි හටගත් අඹ බීජය හා සමානය. ජාතිය ඒ අඹ බීජයෙන් හටගන්නා දෙවෙනි අඹගස හා සමානය. මේ හේතුඵල වශයෙන් එකිනෙක පහළවන ධර්ම පරම්පරාව හැඟවීම පිණිස දක්වන ලද අඹ උපමාවයි.

## සත්ත්වලෝකයෙහි ධර්මනියාමය නිමි.

කියන ලද ලෝකත්‍රයාගේ පහළවීම සම්බන්ධව කථාකරන කථිකයන් විසින් ද්විප්‍රකාර සත්‍යයන් හා ද්විප්‍රකාර ව්‍යවහාරත් උගෙන කථා කළ යුතු වේ. ද්විප්‍රකාර සත්‍යය යනු සම්මුති සත්‍ය පරමාර්ථ සත්‍ය යන දෙකය. එයින් සම්මුති සත්‍යය නම් ඒ ඒ ජාතික මනුෂ්‍යයන් විසින් සත්‍ය වශයෙන් ගෙන කරන ලද භාෂා ව්‍යවහාරයයි. අප සිංහල ද්වීපයෙහි හරකාට ගවයා, බල්ලාට සුණඛයායයි කරන ව්‍යවහාරය සැබෑවූ සම්මුති සත්‍යය නම් වේ. කවර කරුණක් හෙයින් සත්‍යවීද යත්? මේ දිවයින මනුෂ්‍යයන්ගේ

ව්‍යවහාරයට අනුව ව්‍යවහාර කිරීමෙන් කිසිකෙනකුටවත් කළ වඤ්චාවක් නොවන හෙයිනි. ගවයාය කියා සත්ත්වයෙක් සුණඛයාය කියා සත්ත්වයෙක් විද්‍යමාන බව ඒකාන්ත සත්‍යයකි. එහෙයින් ඒ සත්ත්වයන්ට ගවයාය සුණඛයාය කියා වෙන වෙන ම කරන ලද ව්‍යවහාරය සම්මුති සත්‍යය නම් වේ. මේ සම්මුති සත්‍යය මනුෂ්‍යයන්ගේ ව්‍යවහාරය අනුව පවතී. එහෙයින් මහජනයා එක්සත් වී පෙරලා ව්‍යවහාර කරනු කැමති නම් එසේ පෙරලා ව්‍යවහාර කළත් ඔවුනොවුන්ට කළ වඤ්චාවක් නොවේ ම ය.

පරමාර්ථ සත්‍යය නම් ධාතු ස්වභාව බලා ඊට අනුව කරන ලද ඍජු වූ ව්‍යවහාරයයි. නො දැනීමට මෝහය, දැනීමට ඥානයයි කියා කරන ව්‍යවහාරය ඍජු වූ සත්‍ය වූ ව්‍යවහාරය නම් වේ. නො දැනීමට ඥානය, දැනීමට මෝහයයි පෙරලිය හැකි ව්‍යවහාරයක් නොවේ. කවර කරුණක් හෙයින් පෙරලා ව්‍යවහාර නො කළ හැක්කේද යත්? යම් හෙයකින් පෙරලා ව්‍යවහාර කළහොත් පරමාර්ථ සත්‍යය බිඳී මිථ්‍යාදෘෂ්ටි වේද? එහෙයිනි. ඒ එසේ ම ය. යට කියන ලද සම්මුති සත්‍යය බිඳ ව්‍යවහාර කළහොත් මුසාවාදියෙක් වේ. මේ පරමාර්ථ සත්‍යය බිඳ ව්‍යවහාර කළහොත් මිථ්‍යාදෘෂ්ටිකයෙක් වේ. ද්විප්‍රකාර ව්‍යවහාරය නම් සූත්‍රාන්ත අභිධර්ම යන ව්‍යවහාර දෙකය. එයින් පුද්ගලයාය, සත්ත්වයයාය, බ්‍රහ්මයාය, දෙවියාය, මනුෂ්‍යයාය, ස්ත්‍රීය පුරුෂයාය යනාදී ව්‍යවහාරය සූත්‍රාන්ත ව්‍යවහාරය නම් වේ. සම්මුති සත්‍යයට අයත් ව්‍යවහාරයකි. නාමය, රූපය, ඵස්සය, වේදනාය, පෘථිවිය ආපෝය යනාදී ව්‍යවහාරය පරමාර්ථ ව්‍යවහාරය නම් වේ. පරමාර්ථ සත්‍යයට අයත් ව්‍යවහාරයකි.

මෙහි ප්‍රඥප්ති පරමාර්ථ දෙක්හි විස්තර විභාගය දක්වනු ලැබේ. යකඩ පාත්‍රය යන වචනයෙහි ප්‍රඥප්ති වාක්පථය පමණක් දන උගත්තු සම්මුති සත්‍ය ක්‍රමයෙන් යකඩ ම පාත්‍රය වේ, පාත්‍රය ම යකඩ වේ, යකඩයේ හා පාත්‍රයෙහිත් පාත්‍රයේ හා යකඩයෙහිත්

වෙනසක් නැතැයි කියත් ම ය. පරමාර්ථ සත්‍ය ක්‍රමයෙන් වූ කලී යකඩ, පාත්‍රය නොවේ, පාත්‍රය ද යකඩ නොවේ, යකඩ අනිකක්ය, පාත්‍රය අනිකක්යයි කිය යුතු වේ. ඒ එසේ ම ය, යකඩ ශබ්දයේ අර්ථය නම් ලෝහ ජාතියක් යනුයි. පාත්‍රශබ්දයේ අර්ථය නම් වටකුරුවට පෙනී යන සණ්ඨාන ප්‍රඥප්තිය යනුයි. එහෙයින් යකඩ යන නාමය සැලියක් හෝ වේවා, තැටියක් හෝ වේවා, පිහියක් හෝ වේවා, පොරොවක් හෝ වේවා, යකඩෙන් තනන ලද උපකරණයක් පාසා ම ව්‍යවහාර වේ. පාත්‍රය යන නාමය ද යකඩෙන් තනනලද්දේ හෝ වේවා, මැටියෙන් තනනලද්දේ හෝ වේවා, රණින් තනනලද්දේ හෝ වේවා, පාත්‍ර සටහන් වූ වස්තුවක් පාසා ම ව්‍යවහාර වේ. හුදෙක් යකඩ යන නාමය ඇති වස්තුවක් පාසා පාත්‍රය යන නාමය ව්‍යවහාර නොවේ. පාත්‍ර සටහන් වූ වස්තුවක් පාසා ද යකඩ යන නාමය ව්‍යවහාර නොවේ. ඒ පාත්‍රය ම පවා බිඳ සැලි තැටි ආදි යමක් කළහොත් යකඩ සැලිය යකඩ තැටිය යනාදී වශයෙන් යකඩ යන නාමය පමණක් ව්‍යවහාර වේ. ඒ යකඩ ම වූයේ වී නමුත් වෙනස් සටහනකට පෙරලී ගියහොත් පාත්‍රය යන ව්‍යවහාරය නොවේ ම ය. එහෙයින් අභිධර්ම ක්‍රමයෙන් යකඩ අනිකක්ය. පාත්‍රය අනිකක්යයි කියන ලදී. යකඩ ශබ්දයේ අර්ථය නම් ලෝහජාතියක්ය යනුයි. පාත්‍රශබ්දයේ අර්ථය නම් වටකුරුවූ සටහනෙක යනුයි. ලෝහජාතිය සටහන නොවේ. සටහන ද ලෝහජාතියක් නොවේ. බඩල්වැඩකාරයාගේ තැනීමෙන් යකඩ පහළවුනා නොව ලෝහ ගල් ජාතියකින් පහළ වූ ද්‍රව්‍යයකි. සටහන වනාහි බඩල්වැඩකාරයාගේ තැනීමෙන් ඇතිවූ ආගන්තුක ප්‍රඥප්ති මාත්‍රයකි. මෙසේ අභිධර්ම ක්‍රමයෙන් යකඩ ද්‍රව්‍යයත් පාත්‍ර සටහනත් වෙනස්කර බැලූ කල්හි සටහන යකඩ ද්‍රව්‍යය මෙන් ජාතියයි කියන ලද ඉපදීමක් ඇති දෙයක් නොවූ බව හා එසේ ජාතියයි කියන ලද ඉපදීමක් ඇති දෙයක් නොවූ හෙයින් ම පාත්‍රය කියා දෙයක් නැතිව හිස්වූ ප්‍රඥප්ති මාත්‍රයක් ම බව කීමට ඉඩ තිබේ. ලෝකයෙහි අතිශයින් ක්ෂුද්‍ර වූ තජ්ජාරිරේණු රථරේණු හිසකෙස් ලොම් ලෙහෙඩි උකුණු ක්‍රිමි

කුරු-කුහුඹුවන්ගේ පටන් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වශයෙන් පෙනීයන යම්තාක් සණ්ඨාන ප්‍රඥප්ති ඇද්ද ඒ සියල්ලක් ම කියන ලද පාත්‍ර සටහන මෙන් සටහන් මාත්‍රයක් බව දත යුතුය.

## මෙතෙකින් ද්විප්‍රකාර සත්‍යය හා ද්විප්‍රකාර ව්‍යවහාරයත් විස්තර වශයෙන් බෙදා දක්වන ලදී.

සත්ත්වතෙම භවයකින් භවයකට මාරුවීයාම කෙරේදැයි යමෙක් ඇසුවහොත් හෙතෙම ඉදින් ඥාණය මඳකෙනෙක් වී නම් සම්මුති සත්‍යයෙන් විසඳිය යුතුවේ. කෙසේද යත්? පින් කළාවූ පුද්ගලතෙම මරණින් මතු සුගතිගාමී වෙයි. පව් කළාවූ පුද්ගලතෙම මරණින් මතු දුගතිගාමී වෙයි. මෙසේ මාරුවී යාම කෙරේයයි විසඳිය යුතු. ඇසූ පුද්ගලතෙම ඉදින් ඥාණවන්තයෙක් වී නම් ස්ථානයට යෝග්‍ය ලෙස සම්මුති සත්‍යයෙන් ද විසඳිය යුතුවේ. පරමාර්ථ සත්‍යයෙන් ද විසඳිය යුතුවේ. පරමාර්ථ සත්‍යයෙන් කෙසේ නම් විසඳිය යුතුද යත්? සත්ත්වයෙක් කියා කෙනෙක් නැත. නැති සත්ත්වයෙක් ඇතියයි ගෙන මාරුවීයාම කෙළේය හෝ නො කෙළේයයි කීමට අවකාශයක් නැත. හුදෙක් නාම රූප ධර්ම දෙක පමණක් විද්‍යමානය. ඒ නාම රූප ධර්ම දෙක්හි ද, මේ ප්‍රත්‍යක්ෂ භවයෙහි පවා තැනකින් තැනකට මාරුවීයාමක් නැත. උප උපන් තන්හි ම නිරුද්ධ වෙයි. එහෙයින් සත්ත්වතෙම කෙසේ නම් භවයකින් භවයකට මාරුවීයාම කෙරේද? නො කෙරේ ම ය. හුදෙක් මේ ප්‍රත්‍යක්ෂ භවයෙහි සිත් සතන් තුළ ඇති වූ කුශලාකුශල කර්ම හේතුවෙන් මරණින් මතු භවයෙහි අභිනව නාම රූප ධර්ම දෙක පහළ වන්නාහුය. මෙසේ පහළවීම ම ලෝක ව්‍යවහාරයෙන් සත්ත්වයා භවයකින් භවයකට මාරුවීයාම කෙළේයයි ව්‍යවහාර කරනු ලැබේ. මෙසේ විසඳිය යුතු. මීට නිදර්ශනයක් නම්, මෑඳුවැලි අතුරා තනන ලද වැලි පාරක් තිබේ. එහි දිග ප්‍රමාණය සැතැප්ම දහයකි, පුළුල තුන්රියනකි, දෙරියනක් ඝනය, එහි සම්මුති සත්‍ය ක්‍රමයෙන් පාරක් තිබේ. පුළුල මෙ පමණය, ඝන මෙ පමණය, අසවල් ගම පටන් අසවල් ගමට වැටී

තිබේ. අසවල් ස්ථානය ඍජුය, අසවල් ස්ථානය ඇදය, අසවල් ස්ථානය උසය, අසවල් ස්ථානය පහත්ය යනාදී වශයෙන් ව්‍යවහාර කළ හැක්කේය. අභිධර්ම පරමාර්ථ සත්‍ය ක්‍රමයෙන් වනාහි වැලිතලාවක් වැලිරාශියක්මුත් පාරක්ය කියා එකක් නැත්තේය. දිගය, පුළුල්ය, සණය, උස්ය, පහත්ය, ඍජුය, ඇදය, කුදය කියා ද නැත්තේය. අසවල් ගම පටන් අසවල් ගමට වැටී තිබේයයි කියා ද නැත්තේය. එමෙන් ම එකී එකී නාම රූප ධර්මයක් ද මේ ප්‍රත්‍යක්‍ෂ භවයෙහි පවා අසවල් තැනින් අසවල් තැනට ගියේයයි කියා නැත. උපන් උපන් තන්හි ම නිරුද්ධ වේ. එහෙයින් සත්ත්වතෙම කෙසේ නම් භවයකින් භවයකට මාරුවීයාම කෙරේද? නො කෙරේ ම ය. මේ නිදර්ශනයෙහි වැලිකැට වෙන් වෙන් වශයෙන් දුටු විට පාර යන සටහන අතුරුදන්ව වැලිකැට ම පෙනී යන්නාක් මෙන් පස් ගල් කුඩු වෙන් වෙන් වශයෙන් දුටුවිට මහා පෘථිවි සටහන , මහාමේරු පර්වත සටහන, චක්‍රවාට පර්වත සටහන, සප්තකූට පර්වත සටහන යන මේ සියල්ලක් ද, ඥාණ චක්‍ෂුසෙහි අතුරුදන්ව ගල්කුඩු පස්කුඩු රාශියක් ම පෙනීයයි. අඹ දඹ පොල් පුවක් ආදී සියළු වෘක්‍ෂලතාදියත් සිඳබිඳ සුන්බුන්කර බැලුවහොත් ඒ ඒ සටහන් සියල්ලක් අතුරුදන්ව කුඩු රාශියක් ම පෙනීයයි.

ඒ ඒ නාම රූප ධර්මයන්ගේ තැනකින් තැනකට අබඇටයක් පමණකුදු මාරුවීයාමක් නැත්තේ ම ය. යටත්පිරිසෙයින් ආශ්වාස ක්‍ෂණයෙහි පහළවන නාම රූප දෙකේ ප්‍රශ්වාස ක්‍ෂණයට මාරු වී යයි කියාද, ප්‍රශ්වාස ක්‍ෂණයෙහි පහළවන නාම රූපදෙකේ ආශ්වාස ක්‍ෂණයට මාරුවීයයි කියාද නැත්තේ ම ය, ඒ ඒ ක්‍ෂණයෙහි පහළවන නාම රූප ධර්මයෝ ඒ ඒ ක්‍ෂණයෙහි ම නිරුද්ධ වන්නාහුය. නිරුද්ධවන ආකාරය මතු දක්වන ක්‍රමයෙන් බලා අවබෝධකර ගත යුතු.

ගලාබසින ගංගා ජලයක් දෙස හොඳින් බලා සිටි විට සෙලවෙමින් තල්ලුවෙමින් පවත්නා ආකාරය පෙනීයයි. එහි

සෙලවීම තල්ලුවීම නම් පරණ පරණ රූප කලාප බිඳීයාමෙන් අභිනව අභිනව රූප කලාප පහළවී පහළවී ඊමයි. අභිධර්ම ක්‍රමයෙන් පරණ පරණ රූප ධර්ම බිඳීයාමෙන් අභිනව අභිනව රූප ධර්ම පහළ වී ඊමට ලෝක ව්‍යවහාරයෙන් සෙලවීමය තල්ලුවීමයයි කියා ව්‍යවහාර කරනු ලැබේ. ඒ ජලය තුළ නො සෙල්වී නො තල්ලුවී සංසිඳී සිටි ජලය පිනිබිඳක් පමණකුදු තිබේදැයි සොයා බලනු. නො සෙල්වී නො තල්ලුවී තල ඇටයක් පමණකුදු තැනකින් තැනකට මාරුවිය හැකි ජලයක් තිබේදැයි සොයා බලනු. නො සෙල්වී නො තල්ලුවී එක ආශ්වාස ක්‍ෂණයක් පමණකුදු මාරුවිය හැකි ජලයක් තිබේදැයි සොයා බලනු. ඒකාන්තයෙන් ම සෙලවෙමින් තල්ලුවෙමින් සිටි ජලයමුත් සංසිඳී සිටි ජලයක් නො පෙනේ මය. සියළු ම ගංගායෙහි සෙලවෙමින් තල්ලුවෙමින් සිටි ජලයමුත් අබ ඇටයක් පමණවත් නො සෙල්වී නො තල්ලුවී සිටි ජලයක් නො පෙනේ මය. ඒ ඒ නාම රූප ධර්මයන්ගේ ආයු ප්‍රමාණය ඉපදීම දරා සිටීම නිරුද්ධවීමයයි කියා අවස්ථා තුනකට බෙදේ. ජලය තුළ අමුතුවෙන් අමුතුවෙන් ඇතිවන ක්‍රියා ගති සියල්ලක් ම අභිනව අභිනව රූප කලාපයන්ගේ ඉපදීම නම් වේ. ඒ ඒ ක්‍රියාවන්ගේ නැතිවී නැතිවී යාම නම් පරණ පරණ රූප කලාප නිරුද්ධවීම නම් වේ. උත්පාදය නිරෝධය යන දෙකේ අතර උපන් පරිද්දෙන් නො වෙනස්ව පවත්නා ගතිය දරා සිටීමයි. ඥාණයෙන් විමසා තීක්‍ෂණව බැලුවහොත් සියළු ගංගා ජලය තුළ ඇතිව නැතිවීමමුත් දරා සිටීම පවා දක්නා නො ලැබේ. මෙකල ඒ යුරෝපාකාර ධාතු ශාස්ත්‍රඥයන් විසින් සොයාගෙන තිබෙන කුඩා දේ මහත්වී පෙනෙන ධාතු කණ්ණාඩියෙන් බැලුවත් ඉපදීම නිරුද්ධවීමමුත් ස්ථිතික්‍ෂණය ප්‍රසාදචක්‍ෂුසට නො පෙනේ මය. ගලාබසින ජලය දෙස බැලුවහොත් වර්ණධාතුහුගේ සෙලවීම පෙනීයයි. එසේ පෙනීයාමෙන් ඉපදීම නිරුද්ධවීම යන දෙකේ වේගවත්කම කෙතරම් සීඝ්‍ර ද යනු දත හැකිය. ගලා නො බසින ජලයෙහි වනාහි සියළු ජලය පැතිර සිටි තේජෝ ධාතුයයි කියන ලද සෘතු ගින්නතෙම උණුසුම් ජලයක් නම් උෂ්ණ වේගයෙන්,

සිහිල් ජලයක් නම් සිහිල් වේගයෙන් නැගිට සිටී. ඒ එසේ ම ය, තේජෝධාතු ගින්නවූ කලී සංසිඳුණු ධාතු ගින්නක් නොවේ. ජලයට බැස පරීක්‍ෂාකර බැලුවහොත් උණුසුම් ජලයක් නම් උෂ්ණ වේගය හා සිහිල් ජලයක් නම් සිහිල් වේගයත් ජලයෙන් ස්පර්ශ වූ කායාඞ්ගයන්හි සඡ්ටණය වන බව දූනේ මය. එයින් උෂ්ණවේග ගතිය පංසු පෘථිවිය පෝෂ්‍ය කිරීමෙහි නියුක්තව සිටී.

ඒ එසේ ම ය, ඒ උෂ්ණ තේජෝගින්න වෘක්‍ෂලතා ඇතුළු පස්පොළොව තුළ දිවා රෑ දෙක්හි නො කඩව උණුසුම් වේගයෙන් පස්පොළොව පෝෂ්‍යකරමින් සිටී. සිහිල් වූ තේජෝගින්නේ වේගගතිය වනාහි ගල් පොළොව පෝෂ්‍ය කිරීමෙහි නියුක්තවී සිටී. ඒ එසේ ම ය, ඒ සීත තේජෝගින්න යට ගල් පොළොව සමග මහාමේරු පර්වත, චක්‍රවාට පර්වත, සප්තකූට පර්වත, හිමවත් පර්වත, තඹ, පිත්තල, ලෝහ, ගල් ආදී වස්තූන්හි දිවා රෑ දෙක්හි නො කඩව සිහිල් තේජෝධාතු වේගයෙන් ගල්පොළොව පෝෂ්‍ය කරමින් සිටී. ඒ ඒ දිශායෙන් හමන වාතය තුළ ද ගංගා ජලයෙහි මෙන් සෙලවෙමින් තල්ලුවෙමින් පවත්නා ගතියමුත් දරාසිටීමක් නැති බව මෙනයින් අවබෝධ කර ගත යුතුය. මෙසේ කියන ලද මහාපෘථිවි මහාමේරු පර්වතාදිය තුළ පහළවන රූපකලාපය කපවා නිරුද්ධ නොවී තැනකින් තැනකට කාලයකින් කාලයකට මාරුවීයාමක් නැත්තේ ම ය. සත්ත්වයා තුළ පහළවන නාමධර්මයෝ වූ කලී ඒ භවයෙහි නිරුද්ධ නොවී කෙසේ නම් අන්භවයක මාරු වී යෙත්ද? නොයෙත් ම ය. කියන ලද වාලුකා මාර්ග නිදර්ශනයෙහි වැලිකැට එකිනෙක එකට සම්බන්ධවී තිබෙන නිසා මේ මාර්ගය අසවල්තැන පටන් අසවල්තැනට වැටී තිබේයයි කියනු ලබන්නාක් මෙන් ද, ගංගාජල නිදර්ශනයෙහි ජල රූප කලාපයන්ගේ එකිනෙක එකට සම්බන්ධ වී තිබෙන නිසා මේ ගංගාව ශ්‍රීපාදකන්දේ පටන් සමුද්‍රය දක්වා ගලාබසීයයි කියනු ලබන්නාක් මෙන් ද, වාත නිදර්ශනයෙහි වාත රූප කලාපයන්ගේ එකිනෙක එකට සම්බන්ධ වී තිබෙන නිසා මේ වාතය අසවල්

ගම පටන් අසවල් ගමට හමායේයයි කියනු ලබන්නාක් මෙන් ද, සත්ත්වයා තුළත් පරණ පරණ රූපධාතු නාමධාතු විඥ්ඥාණ ධාතු බිඳි බිඳී ගියත් අභිනව අභිනව පහළවන නාම රූප ධාතු එකිනෙක සම්බන්ධව ධාතු පුඤ්ජයක් වීමෙන් මෙතනින් එතනට මේ ක්‍ෂණයෙන් ඒ ක්‍ෂණයට මේ භවයෙන් ඒ භවයට මාරුවීයාම කෙළේයයි ව්‍යවහාර කිරීමට ධාතුපුඤ්ජ ධර්මපුඤ්ජ සටහනක් වී තිබේ. මේ ආභිධර්මික පැණවතුන්ට එලිවී තිබෙන ආකාරයයි.

රූපධාතු නාමධාතු විඥ්ඥාණධාතු සන්තති වශයෙන් ප්‍රත්‍යුත්පන්නභවයෙහි නිරුද්ධව මතු භවයෙහි අභිනව නාමරූප දෙක පහළවෙත් නම් මේ මිනිස්ලොවින් චුතව මිනිස්ලොව ම උපදින සත්ත්වයා දෙවුලොව උපදින සත්ත්වයා බඹලොව උපදින සත්ත්වයා අපායේ උපදින සත්ත්වයා යන මොව්හු මෙයින් ඒක්‍ෂණයකින් චුතව ඒ ඒ භූමිවල ඒක්‍ෂණයකින් ම උපදින්නාහු ද? එසේ නොව ආවරණවීමකින් හෝ දූරාසන්නභාවයකින් හෝ වෙනස් වීමක් පෙරපසුවීමක් තිබේද? යනු ප්‍රශ්නයයි, ආවරණ වීමක් නැත, එක වර ම උපදින්නාහුය. ආවරණ වූ නිසා විනිවිද නො යයි, දුරවූ නිසා පසුව පැමිණෙයි, සමීපවූ නිසා වහා පැමිණෙයි යන මේ විපර්යාසය රූපධර්මයන්ට මුත් නාම ධර්මයන්ට නැත්තේය. ඒ එසේ ම ය, රූපය වූ කලී ඖදාරික ධර්ම කොට්ඨාසයකි, ආවරණක දෙයක් සම්මුඛ වී නම් එහි ගැටී නවතී, අරමුණුගන්නා ධර්මකොට්ඨාසයක් ද නොවේ, ඒ ඒ ප්‍රත්‍යය හේතුකොට ගෙන සන්තතිය තල්ලු වීමෙන් ම වන යාම් ඊම් දෙකින් යුක්ත වූ ධර්මකොට්ඨාසයකි, එහෙයින් ඒ රූපසන්තතිය සමීප තැනකට නම් වහා පැමිණේ. දුර කතරකට නම් පසුවී පැමිණේ. මේ ඉද්ධියෙන් වන වෙනස නො ගෙන කියන ලද විභාගයි, නාමධර්මයන්ගේ වූ කලී අතිශයින් සූක්‍ෂම වූ ස්වභාවක් ඇති හෙයින් ද, අරමුණුගැනීම දැනීම ඇති හෙයින් ද ආවරණවීමකින් හෝ දූරාසන්නතාවකින් හෝ වෙනසක් නැත්තේ ම ය, අරමුණු කරනු කැමතිවී නම් දැන් ක්‍ෂණයකින්

මහා අවීචිය අතදිගුකොට ගන්නාක් මෙන් අරමුණුකොට ගත හැක්කේය, චුතවී ප්‍රත්‍යුත්පන්නභවය ප්‍රත්‍යුත්පන්නසන්තානය අන්තිම වූ කල්හි අරමුණුගන්නාක් මෙන්ම ක්‍ෂණයකින් ඒ අවීචිමහානිරයෙහි උත්පත්ති කළ හැක්කේය, එමෙන් ම දෙවුලෝ බඹලෝවල ද උත්පත්ති කළ හැක්කේය, හුදෙක් නාමස්කන්ධ පහළ වන තන්හි රූපස්කන්ධ ද පහළ වන්නාහුය, මෙසේ ඒ ඒ භවයන්හි නාමස්කන්ධ හා රූපස්කන්ධ පහළවී ආවිට සම්මුති සත්‍යක්‍රමයෙන් අසවලා මිනිස්ලොවින් චුතව ගොස් නිරයේ උපන්නේය, දෙවුලොව උපන්නේයයි කියා ව්‍යවහාර කරනු ලැබේ, මේ සත්ත්වතෙම භවයකින් භවයකට මාරු වීයාම කෙරේද? නො කෙරේද? යන ප්‍රශ්නයෙහි අභිධර්මධාතු ප්‍රඥාලෝකයෙන් ආලෝකකර බැලුවහොත් පුද්ගලයෙක් සත්ත්වයෙක් කියා කෙනෙක් නැති හෙයින් නැති පුද්ගලයෙක් නැති සත්ත්වයෙක් ඇතිකරගෙන භවයකින් භවයකට මාරුවීයාම කෙරේය නො කෙරේය කියා කීමට අවකාශයක් නැත්තේ ම යයි කියා ඒ ප්‍රශ්නය විසඳිය යුතු. අභිධර්ම ධාතු ප්‍රඥාලෝකයෙන් වෙන්ව අඳුරේ වාසය කරන මනුෂ්‍යයෝ වූ කලී පුද්ගලයෙක් නැත, සත්ත්වයෙක් නැත යන වචනය ඇසීමට පවා කැමති නො වෙත්, මිථ්‍යා වචනයක්යයි කියාද හඟිත්, යට කියන ලද ප්‍රඥප්ති පරමාර්ථ බෙදීමෙහි දක්වන ලද යකඩපාත්‍ර නිදර්ශනය මෙහි ද දක්වා විසඳිය යුතු. ඒ එසේ ම ය, අභිධර්ම ධාතු ප්‍රඥාලෝකයෙන් වෙන්ව අඳුරේ වාසය කරන මනුෂ්‍යයන්ගේ මත පරිද්දෙන් යකඩපාත්‍රය යන වචනයෙහි යකඩ ම පාත්‍රය වේ, පාත්‍රය ම යකඩ වේ, යකඩයේ හා පාත්‍රයෙහිත්, පාත්‍රයේ හා යකඩයෙහිත් වෙනසක් නැත්තේයයි යට විසඳන ලදී. ඔවුහු වනාහි යකඩත් පාත්‍ර සටහනත් වෙනස්ව පෙනෙන ඥානාලෝකයක් උපදවා නො ගත් හෙයින් යකඩ ම පාත්‍ර සටහන් කොට ගෙන යකඩ ම පාත්‍රය වේ, පාත්‍රය ම යකඩ වේ, යකඩයේ හා පාත්‍රයෙහිත් පාත්‍රයේ හා යකඩයෙහිත් වෙනසක් නැත්තේ යයි හඟිත්, ලෝකයෙහි පාත්‍රයක්ය කියා නැත යන වචනය අසන්ට පවා

කැමති නො වන්නෝය, මිථ්‍යා වචනයක් යයි කියා ද හඟින්නෝය. අභිධර්මධාතු ප්‍රඥාලෝකයෙන් ආලෝකකොටගෙන වාසය කරන නුවණැත්තන්ගේ මත පරිද්දෙන් වනාහි යකඩ ම විද්‍යමාන වේ, පාත්‍ර සටහන වනාහි විද්‍යමාන දෙයක් නොව විඤ්ඤාණයට අරමුණුවන සණ්ඨාන ප්‍රඥප්ති මාත්‍රයකි, එහෙයින් යකඩ ද්‍රව්‍යය පාත්‍රයාගේ ආත්මසාරය කොට නො ගෙන නුවණින් බෙදා බැලූ විට පාත්‍ර සටහන අවිද්‍යමාන දෙයක් බව මනාව වැටහේ ම ය, සත්ත්ව සන්තානයෙහි හරයක් කොට ගනු ලබන නාමරූපධාතු රාශිය පාත්‍රනිදර්ශනයෙහි පාත්‍රය හා සමානය, සත්ත්ව පුද්ගල දිව්‍යමනුෂ්‍ය ස්ත්‍රී පුරුෂ හිසකය අත්පා යනාදී සටහන් රැස පාත්‍ර සටහන හා සමානය. හිසකේ ගහේ හපගතිය පෘථිවිධාතුය, යුෂගතිය ආපෝධාතුය. සීතෝෂ්ණගතිය තේජෝධාතුය, පිපුම් ගතිය වායෝ ධාතුය, වර්ණය වර්ණධාතුය, ගන්ධය ගන්ධධාතුය, රසය රසධාතුය, ශ්ලේෂගතිය ඕජාධාතුය, මේ හිසකේ ගහේ සාරවත් රූපධාතු කොටසයි, වටවූ දික්වූ සටහන වනාහි හිසකේ ගහ නම් වේ, හිසකේගහේ රූපධාතු කොටස පාත්‍ර නිදර්ශනයෙහි යකඩ හා සමානය, හිසකේ ගස් සටහන පාත්‍ර සටහන හා සමානය, හිසකේ ගහේ හප ගතියට හිසකේ ගසයයි කියත් නම්, පෘථිවිධාතුවට සත්ත්වයාය කියා බැණවැදුනා නම් වේ. ඉදින් හපගතිය පෘථිවිධාතුයයි දැන කියත් නම් යථා භූත අනාත්මඥානය පහළවූයේ වෙයි. මේ ක්‍රමයෙන් සියළු ශරීරයෙහි ආත්ම අනාත්ම දෙක නිරවුල් කොටගෙන බෙදා බලනු, අභිධර්මධාතු ප්‍රඥාලෝකයෙන් වෙන්ව අඳුරේ වාසය කරන මනුෂ්‍යයන් තුළ නාමරූප ධාතුරැස සත්ත්වයාගේ ආත්මසාරයක් කොට ගෙන තිබෙන හෙයින් මේ ප්‍රත්‍යක්ෂ භවයෙහි ඇතිවී තිබෙන නාමරූප සන්තතිය මරණයෙන් නිරුද්ධව අන්තිමවේයයි ඉදින් ගත්තාහු නම් ඔවුහු මේ සත්ත්වයා ද මරණයෙන් නිරුද්ධව අන්තිමවේයයි කියා ගත්හෙයින් උච්ඡේද දෘෂ්ටිකයෝ වෙත්, සත්ත්වතෙම මරණයෙන් නිරුද්ධව අන්තිම නොවී දෙවෙනි භවයට මාරුවීයාම කෙරේයයි ඉදින් ගනිත්නම් ආත්මය වූ නාම රූපධර්මයන්

අතුරෙන් සමහර සමහර නාම රූප කෙනෙක් දෙවෙනි භවයට මාරුවී යාම කෙරෙත් යයි කියා ගත් හෙයින් ශාස්වත දෘෂ්ටිකයෝ වෙත්, නාමරූප දෙකෙන් පිට තර්කයෙන් කල්පනාකර ගන්නා වූ ආත්මවාද ජීවවාද දෘෂ්ටි කොටසක් ද තිබේ, මරණයෙන් සත්ත්වයා අන්තිම වේයයි ගනීනම් උච්ඡේද දෘෂ්ටිකයෙක් වෙයි, මරණයෙන් අන්තිම නොවී ලැබූ ස්කන්ධපඤ්චකය නැතිවී ගියවිට කුසලාකුසල කර්මයන් විසින් පමුණුවන ලද භූමියෙක අභිනව ස්කන්ධ පඤ්චකයකින් යුක්තවන්නේයයි ගනීනම් ශාස්වත දෘෂ්ටිකයෙක් වේ. පුද්ගල සත්ත්ව ආත්ම ජීව යන දෘෂ්ටි සනාන්ධකාරයන් විද්වංශනය කිරීමෙන් අභිධර්ම ඥානාලෝකය බැබලී ගියහොත් සෝතාපන්නයෙක්ව භවයෙන් භවය අපාදුකින් නිත්‍යස්ථාවර මිදීමෙන් මිදීමයයි කියන ලද සෝතාපත්ති ඵල සඞ්ඛ්‍යාත ප්‍රථම නිර්වාණයට පැමිණි කෙනෙක් වන්නේය.

## මේ සත්ත්ව ලෝකයාගේ ධර්මනියාමයෙහි ග්‍රන්ථි ස්ථාන නිරවුල් කර දැක්වීමයි.

අවකාශ ලෝකයෙහි ප්‍රධාන ධාතු නම් සංවර්ත, සංවර්තස්ථායි, විවර්ත, විවර්තස්ථායි යන අසංඛ්‍ය කල්ප සතර හා ඒ සතර පිළිවෙලින් සකස්කරන්නා වූ සංවර්තතේජෝ, සංවර්තස්ථායිතේජෝ, විවර්තතේජෝ, විවර්තස්ථායිතේජෝ යන කල්පාග්නි ධාතු සතරත් ය. විශේෂධාතු නම් උෂ්ණ තේජෝ, සීත තේජෝ යන ද්විප්‍රකාර තේජෝ ධාතුහුයි.

සංස්කාර ලෝකයෙහි ප්‍රධාන ධාතු නම් ග්‍රීෂ්ම, වර්ෂාණ, හේමන්ත යන ත්‍රිවිධ ඍතු පඤ්චප්‍රකාර බීජයෝයි, විශේෂ ධාතුහු නම් උෂ්ණ තේජෝ, සීත තේජෝ යන ද්විප්‍රකාර තේජෝධාතුහුයි.

සත්ත්වලෝකයෙහි ප්‍රධාන ධාතු නම් පටිච්ච සමුප්පාද අඞ්ග දොළොස හා අවිද්‍යා තෘෂ්ණා යන ද්විප්‍රකාර මූලධර්මයෝ යි. විශේෂ ධාතු නම් කුශලාකුශල යන ද්විප්‍රකාර කර්මයෝ ය.

ලෝකත්‍රයෙහි ම ප්‍රධාන ධාතු නම් ද්විප්‍රකාර නාමධාතු රූප ධාතු ඇතුළු පඤ්ච ප්‍රකාර නියාම ධර්මයෝයි, විශේෂ ධාතු නම් ජාති, ජරා, මරණ යන තුන සමග අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන තුනත්‍ය.

සියලු තන්හි පැතිර පවත්නෝ ප්‍රධාන ධාතුහු නම් වෙති, අතිශයින් ප්‍රකට වූවෝ විශේෂ ධාතුහු නම් වෙති.

සිරිධම්මේන ථේරේන - ජනස්ස හිතකාරිනා,

මිච්ඡාදිට්ඨි විජයාය - කතා නියාමදීපනී.

## නියාමදීපනිය නිමි